**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරය**

## පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 204

# අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවල
# පළමුවැනි වාර්තාව
# (2019 ඔක්තෝබර්)

නියෝජ්‍ය කාරක සභා සභාපති
ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා
විසින්
2019 ක් වූ ඔක්තෝබර් මස 23 වැනි දින ඉදිරිපත් කරන ලදී.

අනුමැතිය ලැබීම මත මාසික වාර්තාවට ඇතුළත් කරන ලද කාරක සභා කාර්ය සටහන් පහත දැක්වේ.

| අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ නම | | දිනය |
|---|---|---|
| 01. | කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.03.08 |
| 02. | කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමූපකාර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.03.15 |
| 03. | රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.03.19 |
| 04. | මහානගර හා බස්නාහිර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.03.22 |
| 05. | වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.03.26 |
| 06. | කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමූපකාර සංවර්ධන හා වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.04.05 |
| 07. | කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමූපකාර සංවර්ධන හා වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.05.09 |
| 08. | කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමූපකාර සංවර්ධන හා වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.06.20 |
| 09. | අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.07.09 |
| 10. | වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.07.10 |
| 11. | කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමූපකාර සංවර්ධන හා වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.07.11 |
| 12. | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.07.12 |
| 13. | කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමූපකාර සංවර්ධන හා වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.07.25 |
| 14. | කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමූපකාර සංවර්ධන හා වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.08.23 |

මේ වන තෙක් අනුමැතිය නොලැබීම හේතුවෙන් මාසික වාර්තාවට ඇතුළත් නොකරන ලද කාරක සභා කාර්ය සටහන් පහත දැක්වේ.

| | උපදේශක කාරක සභාවේ නම | දිනය |
|---|---|---|
| 01. | මහවැලි සංවර්ධන හා පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.02.07 |
| 02. | ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.02.26 |
| 03. | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.03.26 |
| 04. | අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.04.03 |
| 05. | රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.05.23 |
| 06. | ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.06.19 |
| 07. | විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.06.21 |
| 08. | කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.07.09 |
| 09. | අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.07.26 |
| 10. | ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.08.09 |
| 11. | මහානගර හා බස්නාහිර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.08.20 |
| 12. | සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.08.21 |
| 13. | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.08.22 |
| 14. | වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.09.17 |
| 15. | මුදල් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.09.17 |
| 16. | කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමූපකාර සංවර්ධන හා වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.09.19 |
| 17. | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2019.09.20 |

## කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

### පළමුවැනි රැස්වීම - 2019 මාර්තු 08

**පැමිණ සිටි කාරක සභික මන්ත්‍රීන්**
ගරු පී. හැරිසන් මහතා (සභාපති)
ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා
ගරු දිලිප් වෙදආරච්චි මහතා

**පැමිණ සිටි කාරක සභික නොවන මන්ත්‍රීන්**
ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු රවීන්ද්‍ර සමරවීර මහතා
ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා
ගරු ජේ. සී. අලවතුවල මහතා
ගරු වසන්ත සේනානායක මහතා
ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
ගරු නිහාල් ගලප්පත්ති මහතා
ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා
ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

**නිවාඩු පිළිබඳ යෝජනා**
ගරු රංජිත් අලුවිහාරේ මහතා
ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

**1. යෝජනා පිළිබඳව දැනුම්දීම් සලකා බැලීම :-**

**1.1 පානීය ජල බෝතල් කර්මාන්තශාලා සඳහා ජලමීටර සවිකිරීම සම්බන්ධයෙන් සමස්ත ලංකා ස්වභාවික පානීය ජල කර්මාන්තකරුවන්ගේ සංගමයේ ලේකම් යන නමින් කරන ලද ඉල්ලීම (ගරු බුද්ධික පතිරණ මහතා - යෝජනා අංක 18 )**

මෙම යෝජනාව සම්බන්ධයෙන් අදාළ වාර්තාව ගරු මන්ත්‍රීතුමා වෙත යොමු කර ඇති බව කාරක සභාවට දැනුම් දෙන ලදි.

**2. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා**

**2.1 මහවැලි ගඟේ ජලය රට තුළ රඳවා ගැනීම, වම් ඉවුරේ වැලි ගොඩ දැමීම වැළැක්වීම සහ බ්‍රාහ්මණයාගම අමුණ ඉදිකිරීම - ගරු සුසන්ත පුංචිනිළමේ මහතා**

### 2.1.1 මහවැලි ගඟේ ජලය මුහුදට ගලා යාම වළක්වා රට තුළට ගැනීමේ සුදුසු ක්‍රමවේදයක් සැකසීම

කන්තලේ වැවෙන් පිටාර යන ජලය ඊට පහළින් ඇති වැව් කරා ගෙන යාමේ යෝජනාව ක්‍රියාත්මක කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදු කරමින් පවතින බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ජනතාවගේ පානීය ජලය සහ අනෙකුත් ජල අවශ්‍යතා සැපිරීම සඳහා ජලය රඳවා ගැනීමේ වැවක් සකස් කර දෙන ලෙස ද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

කන්තලේ කළු ගඟ ව්‍යාපෘතියට අදාළ අධ්‍යයනය මේ වන විට අවසන් කර වැඩ ඇරඹීමට නියමිත බව කාරක සභාවට දැනුම් දෙන ලදී.

තවද, CRIP ව්‍යාපෘතිය මඟින් ද්‍රෝණි අධ්‍යයනය යටතේ මිණිපෙන් පහළට ගලා යන ජලය මහවැලි ගඟේ ගංවතුර පාලනයට හා නියඟය අවම කිරීම සඳහා යොදා ගැනීම පිළිබඳ පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් කළ බව ද ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව ද කාරක සභාවට දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රීතුමාගේ යෝජනා කෘෂිකර්ම ලේකම්වරයා වෙත ඉදිරිපත් කරන ලෙස ද ගරු සභාපතිතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 2.1.2 මහවැලි ගඟ වම් ඉවුරේ වැලි ගොඩ දැමීම වැළැක්වීම

මහවැලි ගඟ වම් ඉවුරේ වැලි ගොඩ දැමීම සඳහා අවසර දීම ජන ජීවිතයට ගැටලු ඇති විය හැකි බව දැනුම් දුන් ගරු මන්ත්‍රීතුමා ඒ සඳහා අවසරපත් නිකුත් කිරීම සුදුසු නොවන බව ද යෝජනා කරන ලදි.

නැවත වැලි ගොඩ දැමීමේ අවසරපත් නිකුත් නොකරන ලෙසට ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

### 2.1.3 බ්‍රාහ්මණයාගම අමුණ ඉදිකිරීම

බ්‍රාහ්මණයාගම අමුණ ව්‍යාපෘති යෝජනාව හා ඒ සම්බන්ධ වාර්තාව ගරු සුසන්ත පුංචිනිලමේ මහතාගෙන් ලබා ගෙන ඉදිරි කටයුතු සඳහා යොමු වන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

## 2.2 ධීවර වරායන් සංවර්ධනය කිරීම සහ වෙනත් කරුණු - ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

### 2.2.1 කොඩ්බේ ධීවර වරාය රැකියා උත්පාදන මධ්‍යස්ථානයක් බවට පත් කිරීම

ත්‍රිකුණාමලය කොඩ්බේ ධීවර වරාය රැකියා උත්පාදන මධ්‍යස්ථානයක් බවට පත් කළ යුතු යැයි ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

එමෙන්ම විදේශීය යාත්‍රාවලට පහසුකම් සැපයිය හැකි ලෙස වරාය සංවර්ධනය කරන ලෙස ද යෝජනා කරන ලදී.

ඒ සම්බන්ධව කටයුතු සිදු කරමින් පවතින බව ධීවර රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දුන් අතර, දැනට එහි බෝට්ටු අංගනයක් නොමැති බව හා ඉදිකිරීම් වලින් පසුව කුඩා පරිමාණයේ නැව් පවා එහි නවතා තැබිය හැකි වන බව ධීවර සංස්ථා සභාපතිවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.2.2 භාවිතයට නොගන්නා බෝට්ටු වරායන්වලින් ඉවත් කිරීම

වරායවල නවතා තිබෙන අබලන් වී ඇති බෝට්ටු ඉවත් කරවීමට නිසි ක්‍රමවේදයක් සැකසීම සුදුසු බවට ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, පරිසර අමාත්‍යාංශය සහ වරාය අධිකාරිය ඒකාබද්ධව කමිටුවක් පත්කොට එම යාත්‍රා මත්ස්‍ය බෝවීම සඳහා මුහුදෙහි සුදුසු ප්‍රදේශවල ගිල්වීම සඳහා වන ව්‍යාපෘතියක් සිදු කිරීමට කටයුතු සිදු කරන බව ධීවර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී. එමෙන්ම ෆයිබර් දහනය සඳහා උපකරණයක් අවශ්‍ය බව පෙන්වා දෙන ලදී.

එම ව්‍යාපෘතීන් ත්‍රිකුණාමල වරාය දක්වා ද දීර්ඝ කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

## 2.3 ඉන්ධන පිරවුම්හල් විවෘත කිරීම සහ වෙනත් කරුණු - ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

### 2.3.1 ඉන්ධන පිරවුම්හල් විවෘත කිරීම

කෝකිලායි, කුච්චවෙලි, කින්නියා ප්‍රදේශවල භූමිතෙල් පිරවුම්හල් ඉදිකර ඇතත්, ඛනිජ තෙල් සංස්ථාව සහ ධීවර දෙපාර්තමේන්තුව අතර පවතින නීතිමය ගැටලු නිසා ඒවා විවෘත කිරීමට නොහැකිව පවතින බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ පිළිබඳව විමර්ශනයක් සිදු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

### 2.3.2 ඩයිනමයිට් පාලනය කිරීම

තම ප්‍රදේශය තුළ ඩයිනමයිට් භාවිතය දැනට යම්තාක්දුරට සාර්ථකව පාලනය වී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එම ක්‍රමවේදයන් දැනටමත් ක්‍රියාත්මක තත්ත්වයේ පවතින බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 2.3.3 ස්ථානමාරු ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම

ධීවර දෙපාර්තමේන්තුවේ දීර්ඝ කාලීනව එකම ස්ථානයක සේවය කරනු ලබන නිළධාරීන් සඳහා ස්ථානමාරු ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු බවට ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

දැනටමත් ස්ථානමාරු ක්‍රමවේද ක්‍රියාත්මක කර ඇති බව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දැනුම් දෙන ලදී.

### 2.3.4 ත්‍රිකුණාමලය මත්ස්‍ය වෙළඳපොළේ කසළ ගැටළුව විසඳීම

ත්‍රිකුණාමලය මත්ස්‍ය වෙළඳපොළේ කැළිකසළ එකතු වී මහත් දුර්ගන්ධයක් හමන බවත්, ධීවර සංස්ථාව විසින් නගර සභාවට බදු ගෙවා නොමැති වීම එයට හේතුව බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එම ගැටළුව විසඳීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

## 2.4 වී වේලන මධ්‍යස්ථානයක් සඳහා සුදුසු ඉඩමක් ලබා දීම - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

මන්නාරම දිස්ත්‍රික්කයේ වී වේලීම සඳහා සුදුසු රජයේ ඉඩමක් ලබා දීම වඩාත් යෝග්‍ය බව ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී. දැනට එම ප්‍රදේශයේ මේ සඳහා සුදුසු රජයේ ඉඩමක් පවතින බව ද ඒ සඳහා රුපියල් මිලියන දෙකක පමණ ප්‍රතිපාදන ප්‍රමාණවත් බව ද ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී ඒ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම්වරයා හා සාකච්ඡා කොට එකී රජයේ ඉඩම ලබා ගැනීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

## 2.5 වී අලෙවි මණ්ඩලය සතුව පැවති වාලච්චේන වී ගබඩාව නැවත පවරා ගැනීම සහ තවත් කරුණු - ගරු සීනිතම්බි යෝහේෂ්වරන් මහතා

### 2.5.1 වී අලෙවි මණ්ඩලය සතුව පැවති වාලච්චේන වී ගබඩාව නැවත පවරා ගැනීම

වී ගබඩා කිරීම සඳහා වී අලෙවි මණ්ඩලය සතුව පැවති වාලච්චේන වී ගබඩාව පෞද්ගලික අංශයට ලබා දී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වසර පහකට පමණ පෙර ප්‍රාදේශීය ලේකම්වරයා විසින් එසේ ලබා දී ඇති බව කාරක සභාවට දැනුම් දෙන ලදී. වී අලෙවි මණ්ඩලයට ඒ සම්බන්ධ අයිතියක් නොමැති බව ද තවදුරටත් දැනුම් දෙන ලදි.

ඉඩම් අමාත්‍යාංශයට දිගු කාලීන කල්බදු ක්‍රමය යටතේ පවරා දී ඇති බව ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පෞද්ගලික අංශයෙන් කුලී පදනම යටතේ හෝ වී ගබඩා පරිශ්‍රයක් ලබා දීමට කටයුතු කරන ලෙස වී අලෙවි මණ්ඩල නිලධාරීන්ට ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

### 2.5.2 වී ගබඩාව නිසි දිනයට විවෘත කිරීම

මඩකලපුව වී ගබඩාව නිසි දිනයට විවෘත නොකිරීමෙන් වී ගොවීන් අපහසුතාවට ලක් වන බව ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා විසින් දැනුම් දෙන ලදී.

උතුරු නැගෙනහිර වී ගබඩා ජනවාරි මස 15 දින වන විට විවෘත කිරීම සඳහා හැකි ඉක්මණින් උපදෙස් නිකුත් කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

## 2.6 නානාට්ටාන් වී ගබඩාව ප්‍රතිසංස්කරණය කිරීම සහ වෙනත් කරුණු - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

### 2.6.1 නානාට්ටාන් වී ගබඩාව ප්‍රතිසංස්කරණය කිරීම

යුධ සමයේ විනාශ වූ මන්නාරම නානාට්ටාන් වී අලෙවි මණ්ඩලයේ ගබඩාව ප්‍රතිසංස්කරණය කරදෙන ලෙස ගරු චාල්ස් නිර්මලනාදන් මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

වී ගබඩාවක් මන්නාරමේ නානාට්ටාන්හි තැනීම සඳහා කටයුතු සූදානම් කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

### 2.6.2 යෝධ වැව ප්‍රතිසංස්කරණය කිරීම

යෝධ වැව ප්‍රතිසංස්කරණය සඳහා ප්‍රතිපාදන අවශ්‍ය බවත් බැකෝ යන්ත්‍රවල හිඟතාවයක් පවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී. එමෙන්ම දැනට යෝධ වැව කොටසක් පමණක් ප්‍රතිසංස්කරණය කරන බවත් සම්පූර්ණ ඇළම ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු යැයි ද ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

මේ සඳහා මෙවර අයවැයෙන් වෙන් කළ රුපියල් මිලියන තුන්සියය (300) ප්‍රමාණවත් නොවේ නම් තවදුරටත් ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 2.6.3 මාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම

කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඒ සඳහා මන්නාරම ගොවිජන කොමසාරිස්වරයා සමඟ සාකච්ඡා කර ඇස්තමේන්තු සකස් කර ඉදිරි කටයුතු සිදු කරන බව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා විසින් දැනුම් දෙන ලදී.

### 2.6.4 ධීවර ජනතාවගේ ගැටලු සාකච්ඡා කිරීම

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂක ජනරාල්වරයා සමඟ තම ප්‍රදේශයේ ධීවර ජනතාවගේ ගැටලු සාකච්ඡා කිරීම සඳහා අවස්ථාවක් ලබා දීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ධීවර රාජ්‍ය අමාත්‍යතුමා සමඟ සම්බන්ධීකරණය වී සතියක් තුළ අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසට ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී

## 2.7 මඩකලපුවේ අයිස් කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු නැවත ඇරඹීම - ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා

මඩකලපුවේ අයිස් කර්මාන්තශාලාවේ නැවත වැඩ ඇරඹීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ පිළිබඳව ඉදිරි කටයුතු සිදු කරන බව ධීවර සංස්ථාවේ සාමාන්‍යාධිකාරීවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.8 ටින් මාළු සකසන කර්මාන්ත ශාලාවක් ඉදි කිරීම සහ තවත් කරුණු - ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා

### 2.8.1 ටින් මාළු නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ඉදි කිරීම

ටින් මාළු නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් අවශ්‍ය බවට ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා විසින් ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදී.

අදාළ ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 2.8.2 කිරි නිෂ්පාදන මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා විසින් කිරි නිෂ්පාදන මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් ලබාදීම පිළිබඳ සිදු කළ ඉල්ලීම ගරු සභාපතිතුමා විසින් අනුමත කරන ලදී.

### 2.8.3 දුගී ග්‍රාමීය ගොවි ජනතාවට සහන සැළසීම

දුගී ග්‍රාමීය ජනතාවට ගොවිතැන් කිරීම සඳහා ඔවුන්ට අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් ජලය ඉසීමේ යන්ත්‍ර සහ වගා ළිං ලබා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලද අතර ගරු සභාපතිතුමා විසින් එය අනුමත කරන ලදී.

### 2.8.4 කිරාන්පුල් වැව් බැම්ම සෑදීම

කිරාන්පුල් වැව් බැම්ම සෑදීමේ කටයුතු සම්පූර්ණ කිරීමට නොහැකිව පවතින බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම කාර්යයට රු. මිලියන 2000 ක් පමණ වැය වන බැවින් වඩා අඩු වියදමින් සිදු කළ හැකි ක්‍රමයක් යෝජනා කළ බව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් ඉල්ලීමක් කරන ලදී.

## 2.9 මොනරාගල දිස්ත්‍රික්කයේ වාරිමාර්ග ව්‍යාපෘති කඩිනම් කිරීම සහ වෙනත් කරුණු - ගරු රංජිත් මද්දුමබණ්ඩාර මහතා

### 2.9.1 මොනරාගල දිස්ත්‍රික්කයේ වාරිමාර්ග ව්‍යාපෘති කඩිනම් කිරීම

මොනරාගල දිස්ත්‍රික්කයේ සුළු වාරිමාර්ග සඳහා කොපමණ මුදලක් වැය කරන්නේදැයි ගරු මන්ත්‍රීතුමා විසින් විමසා සිටින ලදී.

අතුරු සම්මත ගිණුම මඟින් රුපියල් මිලියන 18ක් වෙන් කර ඇති බව ගොවිජන සංවර්ධන කොමසාරිස්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ගරු රංජිත් මද්දුමබණ්ඩාර මහතා විසින් කුඹුක්කන් ඔය ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය පිළිබඳව විමසා සිටින ලදී.

චීන සමාගමක් සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන්කොට ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරන බව ද ඒ සඳහා ප්‍රතිපාදන ලබා ගත යුතු බව ද වාරිමාර්ග සංවර්ධන අතිරේක ලේකම්වරයා විසින් දැනුම් දෙන ලදී.

පරිසර සංවිධාන වාර්තා හා ශක්‍යතා අධ්‍යයනයෙන් සාර්ථක ප්‍රතිඵල ලැබුණහොත් ප්‍රතිපාදන වෙන් කළ හැකි බව ගරු සභාපතිතුමා විසින් තවදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.9.2 හැඩ ඔය සංවර්ධනය කිරීම

හැඩ ඔය වැඩි ජල ප්‍රමාණයක් ලබා දෙන යෝජනා ක්‍රමයක් බවට පත් කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

ආර්ථික ඵලදායිත්වය අඩුකම සහ ප්‍රදේශවාසීන්ගේ අකමැත්ත මත ශක්‍යතා අධ්‍යයන වාර්තාව සහ පාරිසරික බලපෑම ඇගයීමේ වාර්තාව සාර්ථක නොවූ බව වාරිමාර්ග අතිරේක ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.10 අඹේවෙල නව ජලාශයක් නිර්මාණය කිරීම සහ වේල්ල සංවර්ධනය කිරීම - ගරු රවීන්ද්‍ර සමරවීර මහතා

### 2.10.1 අඹේවෙල ප්‍රදේශයේ නව ජලාශයක් නිර්මාණය කිරීම

අඹේවෙල ප්‍රදේශයේ වෙනම ජලාශයක් නිර්මාණය කිරීම සඳහා යෝජනාව වනජීවී දෙපාර්තමේන්තුවෙන් අනුමත වී ඇති බැවින් එම ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳ ගරු මන්ත්‍රීතුමා විමසා සිටින ලදී.

ප්‍රතිපාදන නොමැති බැවින්, එම ව්‍යාපෘතිය අතරමග නැවතුණු බව වාරිමාර්ග අධ්‍යක්ෂවරයා (බණ්ඩාරවෙල) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ සම්බන්ධ ඇස්තමේන්තුව ගෙන්වා ගන්නා ලෙසට ගරු සභාපතිතුමා විසින් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

#### 2.10.2 අඹේවෙල ජලාශයේ වේල්ල උස් කිරීම

අඹේවෙල ජලාශයේ වේල්ල උස් කිරීම පිළිබඳ වූ පැරණි යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රීතුමා විසින් විමසා සිටින ලදී. එමගින් වැඩිවන ජලයෙන් කොටසක් ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට ද ඉතිරිය ගොවීන්ට ද ලබා දිය හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

අදාළ කාර්යය ජල සම්පාදන මණ්ඩලය මඟින් සිදුකරන බවත්, එයට තම ආයතනයේ විරුද්ධත්වයක් නොමැති බවත් වාරිමාර්ග ඉංජිනේරුවරයා (බදුල්ල) විසින් දැනුම් දෙන ලදී.

### 2.11 අලවතුගොඩ දිවුල්වත්ත වැව සැකසීම, ලුණුකොත්තාවල අමුණ ඉදි කිරීම සහ තවත් කරුණු- ගරු රවීන්ද්‍ර සමරවීර මහතා

#### 2.11.1 අලවතුගොඩ දිවුල්වත්ත වැව සැකසීම සහ ලුණුකොත්තාවල අමුණ ඉදි කිරීම

මෙම ව්‍යාපෘතිවල වත්මන් තත්ත්වය පිළිබඳව කාරක සභාවට දැනුම් දෙන ලදී.

2019 මාර්තු මස 30 දින වන විට ප්‍රධාන කාර්යාලයට ඇස්තමේන්තුව එවා හැකි ඉක්මණින් මෙකී දිවුල්වත්ත වැව හා ලුණු කොත්තාවල අමුණ කටයුතු ආරම්භ කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් බදුල්ල ප්‍රාදේශීය ඉංජිනේරුවරයාට, වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ වාරිමාර්ග අතිරේක ලේකම්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

#### 2.11.2 නුවර එළිය කටුමාන වැව ව්‍යාපෘතිය කඩිනම් කිරීම

නුවර එළිය කටුමාන වැව ව්‍යාපෘතියෙහි කටයුතු පිළිබඳ ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ගරු රවීන්ද්‍ර සමරවීර මහතා සමඟ සම්බන්ධීකරණය වී ඒ පිළිබඳව සොයා බැලීමක් සිදුකරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගොවිජන සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

### 2.12 වාලච්චේන වරාය ව්‍යාපෘතිය කඩිනම් කිරීම - ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා

වාලච්චේන ධීවර වරායේ වේදිකා බැම්මේ පහසුකම් ලබා දීම වැඩි දියුණු කිරීම සඳහා පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට උපදේශන

සේවාවක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයා විසින් දැනුම් දෙන ලදී.

**2.13 ඉස්සන් වගාකරුවන්හට මුහුණ පෑමට සිදු වන දුෂ්කරතා ඉවත් කිරීම - ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා**

ඉස්සන් අභිජනන මධ්‍යස්ථාන කිහිපයක් සඳහා බලපත්‍ර නිකුත් කර ඇතත්, ඉස්සන් වගාකරුවන්ට මිළදී ගැනීම සඳහා අවසර ලබා දී ඇත්තේ, එක් අභිජනන මධ්‍යස්ථානයකින් පමණක් නිසා මහත් ගැටලුවක් උද්ගත වී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මඩකලපුව හැර අනෙක් අභිජනන මධ්‍යස්ථානවල ඉස්සන්ට සුදු පුල්ලි රෝගය නම් රෝගයක් වැළදී ඇති බැවින්, ඇතැම් අවසරපත් නිකුත් නොකළ බව ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙකී ගැටලුව සලකා බලන ලෙස සහ වාලච්චේන අභිජනන මධ්‍යස්ථාන 60 පිළිබඳව ද සොයා බලා කෘෂිකර්ම ලේකම්වරයා වෙත වාර්තා කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

**2.14 වෛරසයක් හේතුවෙන් මිය ගිය ගවයන්ගේ හිමිකරුවන්හට වන්දි ලබා දීම - ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා**

මඩකලපුව දිස්ත්‍රික්කයේ එකවරම ගවයන් විශාල ප්‍රමාණයක් මියයාම නිසා හිමිකරුවන්ට වන්දි ලබා දීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

හිමොරෙජික් සෙප්ටිසීමියා නම් බැක්ටීරියා ආශ්‍රිත රෝගයකින් ගවයන් මියගොස් ඇති බවත්, සතුන් රක්ෂණය කර නොමැති නම් වන්දි ලබාදීම අසීරු බවත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය නිහාල් වෙදසිංහ මහතා විසින් දැනුම් දෙන ලදී.

කෘෂිරක්ෂණ මණ්ඩලයේ සත්ත්වයන් රක්ෂණය කිරීම සඳහා වැඩපිළිවෙළක් ඇති බවත්, මේ වසර තුළදී ඒ සඳහා කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.15 ගවයන්ට ආහාර ලබා ගැනීම පිණිස භූමි ප්‍රදේශයක් ලබා දීම - ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**

කින්නියා ප්‍රදේශයේ ගවයන්ට ආහාර අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා ඉඩම් හිඟතාවයක් ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

**2.16 ධීවර ආම්පන්න මත පනවා ඇති බදු ඉවත් කිරීම සහ තවත් කරුණු - ගරු නිහාල් ගලප්පත්ති මහතා**

### 2.16.1 ධීවර ආම්පන්න මත පනවා ඇති බදු ඉවත් කිරීම

ධීවර ආම්පන්න මත බදු පැනවීම මගින් ධීවර ප්‍රජාව ධීවර කර්මාන්තයෙන් බැහැරවීම සිදුවන බැවින් බදු පැනවීම අවම කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී. අතිරේක ඇස්තමේන්තු මගින් සේවක වැටුප් ගෙවීම වෙනුවට හැකිතාක් ධීවර ක්ෂේත්‍රය සතු සම්පත් සඳහා උපයෝජනය කිරීම සුදුසු බව ද ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් යෝජනා කරන ලදී.

මේ සඳහා මෙවර අයවැයෙන් අදාළ සහන යෝජනා ඉල්ලීම් කර ඇති බවත්, කොරියා සමාගමක් සමඟ සාකච්ඡා කොට මිරිස්ස, තංගල්ල, මාදගල, තෙලේ, උඩප්පුව වරායන් දියුණු කොට සංචාරක, ධීවර සහ වාණිජ ක්ෂේත්‍රයන් වෙත තරුණ පරම්පරාව යොමු කිරීමට කටයුතු කරන බවත් ධීවර රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

ධීවරයන් සඳහා “එන්ටර්ප්‍රයිසස් ශ්‍රී ලංකා” ව්‍යාපෘතිය මගින් 6.3% පොළියක් යටතේ බෝට්ටු සහ ධීවර ආම්පන්න මිළදී ගැනීම සඳහා සහන ලබාගත හැකිවනු ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 2.16.2 ශීතාගාර නවීකරණ වැඩපිළිවෙළක් දියත් කිරීම

දුර බැහැර ප්‍රදේශ සඳහා පහසු මිලට මාළු ලබාදීමට වරායන් ආශ්‍රිතව ශීතාගාර වැඩපිළිවෙළක් දියත් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

දැනට පවතින ශීතාගාර ප්‍රතිසංස්කරණය සඳහා කොරියානු සමාගමක් සමඟ ඒකාබද්ධව කටයුතු කරමින් පවතින බව ධීවර රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.16.3 නැංගුරම් තොටුපළවල් සංවර්ධනය කිරීම

රටෙහි පවතින ධීවර වරායන්ගේ හිඟතාවය මඟ හැරවීමට නැංගුරම් තොටුපළවල් කිහිපයක් ආරම්භ කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

මේ වසර තුළ උතුරු නැගෙනහිර පළාත් තුළ වැඩ ඇරඹීම සඳහා අධ්‍යයනයන් සිදු කර ඇති බව සහ එම වැඩපිළිවෙළ සාර්ථක වනු ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 2.16.4 ධීවරයන් සඳහා රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම

ධීවරයන් සඳහා ගැළපෙන රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම සුදුසු යැයි ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මගින් වැඩි ප්‍රමාණයක් රක්ෂණය කර ඇති බවත්, එම ආයතනය මගින් ප්‍රතිලාභ ලබා දීම සීමා කරන බවත් රාජ්‍ය අමාත්‍යතුමා දැනුම් දෙන ලදී.

මෙකී ගැටළු හඳුනාගෙන ධීවරයින් හා යාත්‍රා යන දෙවර්ගය සඳහා යම් රක්ෂණ යෝජනා ක්‍රම ඉදිරිපත් කළ බවත්, දැනට ඇගයීම් කමිටුවක් වෙත යොමු කළ බවත් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.** කාරක සභාව ප.ව. 4.05 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

-----------------------------

**කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමූපකාර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

**පළමුවැනි රැස්වීම - 2019 මාර්තු 15**

**පැමිණ සිටි කාරක සභික මන්ත්‍රීන්**
ගරු රිෂාඩ් බදියුදීන් මහතා (සභාපති)
ගරු බුද්ධික පතිරණ මහතා
ගරු ඒ. ඩී. ප්‍රේමදාස මහතා
ගරු කේ. කේ. පියදාස මහතා

**පැමිණ සිටි කාරක සභික නොවන මන්ත්‍රීන්**
ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
ගරු සෙයිඩ් අලි සහීර් මවුලානා මහතා

**නිවාඩු පිළිබඳ යෝජනා**
ගරු සිරිපාල ගමලත් මහතා
ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා

**1. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා**

**1.1 රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාවට සිදුවූ මූල්‍යමය පාඩු - ගරු සෙය්යිඩ් අලී සහීර් මවුලානා මහතා**

පසුගිය වර්ෂවල රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව මඟින් රජයේ විවිධ ආයතන ණය පදනම මත භාණ්ඩ ලබාගෙන ඇතත් ගෙවීම් කටයුතු සිදුකර නොමැති වීම හේතුවෙන් එම ආයතනයට විශාල මූල්‍යමය පාඩුවක් සිදුවී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ජනාධිපති ලේකම් කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගම්පහ, සෞම්‍යමූර්ති තොන්ඩමන් අනුස්මරණ පදනම, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, සීමාසහිත ශ්‍රී ලංකා පාරිභෝගික සමූපකාර සමිති සංගමය, ලංකා කම්කරු කොංග්‍රසය සහ ධීවර අමාත්‍යාංශය යන ආයතන මිලියන 115ක පමණ භාණ්ඩ ලබාගෙන ඇති බැවින් එම මුදල් අය කරගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් පරිදි අදාළ ආයතනවලට ලිඛිතව

දැනුම් දී ඇති බව රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාවේ සභාපතිවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සති දෙකක් ඇතුළත සාර්ථක ප්‍රතිඵල නොලැබෙන්නේ නම් නැවත අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

## 1.2 මධ්‍යම පළාතේ පේෂකර්ම කර්මාන්තය යළි නගා සිටුවීමට කටයුතු කිරීම - ගරු කේ.කේ. පියදාස මහතා

### 1.2.1 මධ්‍යම පළාතේ පේෂකර්මාන්තය

මධ්‍යම පළාතේ පරිහානියට පත්ව ඇති පේෂකර්මාන්තය යළි නගා සිටුවමින් වැඩි පිරිසකට රැකියා ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාව වෙත ඉල්ලීමක් කරන ලදී.

2019 අප්‍රේල් මස 05 වන දින වනවිට මේ සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

### 1.2.2 සමූපකාර ඡන්ද පැවැත්වීමේදී ඇතිවූ දූෂණ හා වංචා

සමූපකාර ඡන්ද පැවැත්වීම විනිවිදභාවයෙන් තොරව සිදුවන බවත්, නොයෙකුත් දූෂණ හා අයථා මුදල් ගනුදෙනු සිදුවන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී. මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරන ලෙස ඔහු විසින් ඉල්ලීමක් කරන ලදී.

පළාත් කොමසාරිස්වරුන්ට සමූපකාර ඡන්දවලදී විනිවිදභාවයෙන් යුතුව කටයුතු කරන මෙන් ලිඛිතව දැනුම් දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

### 1.2.3 නව සතොස ශාඛා විවෘත කිරීමේදී පැන නඟින ගැටළු

වතුකර ප්‍රදේශවල නව සතොස ශාඛා විවෘත කිරීමට කරන ලද ලිඛිත ඉල්ලීම්වලට මේ වනතුරු ප්‍රතිචාරයක් නොලැබී ඇති අතර, එම ප්‍රදේශවල ද සතොස ආයතන පිහිටුවීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

වතුකර ප්‍රදේශවල වැටුප් දිනට හෝ සතියකට වරක් හෝ කුලී පදනම මත වාහන ලබාගෙන සතොස ජංගම සේවයක් ලබා දීමට කටයුතු කරන ලෙස ද ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

අගලවත්ත ප්‍රදේශයේ වෙළඳපල සමීක්ෂණයක් (Market Survey) සිදුකර ඒ අනුව සතොස ශාඛා පිහිටුවීමට කටයුතු කරන ලෙස ගරු නියෝජ්‍ය ඇමතිතුමා විසින් සතොස ආයතන සභාපතිවරයාට උපදෙස් ලබා දෙන ලදී.

දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සතොස ශාඛාවක් පිහිටුවීමට පෙර වෙළඳපල සමීක්ෂණයක් සිදුකර එම ආයතන ආරම්භ කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**1.3 පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවීන් පිරිසකට සිදුවූ අසාධාරණය - ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**

මරදාන පිහිටි ඩග්ලස් සහ පුත්‍ර සමාගම මගින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවීන් පිරිසකට අලෙවි කර ඇති ගොයම් කපන යන්ත්‍ර මාස කිහිපයක් ඇතුළත ක්‍රියාවිරහිත වීම පිළිබඳව පාරිභෝගික සේවා අධිකාරියට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පාරිභෝගික සේවා අධිකාරිය විසින් ගොවීන් සම්බන්ධයෙන් සාධාරණ මැදිහත්වීමක් සිදුකර නොමැති බවත් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය උපදෙස් ලබාදෙන ලෙසත්, ගරු සභාපතිතුමා විසින් එම අධිකාරියේ සභාපතිවරයාට උපදෙස් ලබා දෙන ලදී. එසේම මෙවැනි අවස්ථාවලට අවශ්‍ය පරිදි මැදිහත්වීමට අධිකාරියේ නීති අංශය ශක්තිමත් කරන ලෙසද ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

පාරිභෝගිකයින්ට සහන සලසනු පිණිස පාරිභෝගික සේවා අධිකාරී පනත සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා විසින් සභාපතිවරයාට උපදෙස් ලබා දෙන ලදී.

එසේම, අධිකාරියේ හදිසි ඇමතුම් අංකය මගින් සහ පාරිභෝගික සේවා අංශය මගින් පාරිභෝගිකයන් වෙත වඩා ඵලදායී සහ කාර්යක්ෂම සේවයක් ලබාදීමට කටයුතු කරන ලෙසත් ගරු සභාපතිතුමා විසින් තවදුරටත් උපදෙස් ලබා දෙන ලදී.

පාරිභෝගික භාණ්ඩ සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ සිදුකිරීමට පර්යේෂණාගාරයක් පිහිටුවීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ද ගරු සභාපතිතුමා විසින් පාරිභෝගික සේවා අධිකාරියේ සභාපතිවරයාට උපදෙස් ලබා දෙන ලදී.

**1.4 ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට වෙන් කර ඇති බිලියනයක ප්‍රතිපාදන අමාත්‍යාංශයේ කටයුතු සඳහා යොදා ගැනීම**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට වෙන් කර ඇති බිලියනයක ප්‍රතිපාදන අමාත්‍යාංශයේ කටයුතු සඳහා යොදාගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම්වරයාට දැනුම් දෙන ලදී.

**2.** කාරක සභාව පෙරවරු 11.05 ට 2019.04.05 දින පෙරවරු 10.00 දක්වා කල් තබන ලදී.

----------------------------

**රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව පළමුවැනි රැස්වීම - 2019 මාර්තු 19**

**පැමිණ සිටි කාරක සභික මන්ත්‍රීන්**
ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (සභාපති)
ගරු අ. අරවින්ද් කුමාර් මහතා
ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

**පැමිණ සිටි කාරක සභික නොවන මන්ත්‍රීන්**
ගරු පියංකර ජයරත්න මහතා
ගරු නිහාල් ගලප්පත්ති මහතා
ගරු මයන්ත දිසානායක මහතා
ගරු සුජිත් සංජය පෙරේරා මහතා
ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා

**1. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා**

**1.1 ඇතැම් ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ කටයුතු කිරීමේදී දුෂ්කරතා ඇතිවීම - ගරු අ. අරවින්ද් කුමාර් මහතා**

සංවර්ධන කටයුතුවලදී ඇතැම් ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ කටයුතු කිරීම ඉතා අපහසු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි. හපුතලේ සහ බදුල්ල ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ නිසි සම්බන්ධීකරණය ඇති බව ද හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමඟ කටයුතු කිරීමේදී විවිධ දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු වන බව ද දැනුම් දෙන ලදී.

මේ පිළිබඳ පැමිණිල්ල තමා වෙත ලැබීමට සලස්වන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමාට දැනුම් දෙන ලදි.

තවද ආපදා කළමනාකරණය සම්බන්ධ ක්ෂණික දුරකථන අංකය වන 117 පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

**1.2 රාජ්‍ය සේවයේ නියුතු වූවන්හට දේශපාලන අයිතිවාසිකම් අහිමි වීම - ගරු අ. අරවින්ද් කුමාර් මහතා**

රාජ්‍ය සේවයේ ඇතැම් සේවාවන්හි නියුක්ත රාජ්‍ය නිලධාරීන් සඳහා දේශපාලන අයිතීන් අහිමි බැවින් උගතුන් පාර්ලිමේන්තුව වෙත පැමිණීමේ ඉඩකඩ අහිමි වන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ආයතන සංග්‍රහය අනුව මාණ්ඩලික ශ්‍රේණිවල සේවයේ නියුතුවූවන්හට දේශපාලන අයිතිවාසිකම් හිමි නොවන බව අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.3 පාර්ලිමේන්තු නිළධාරින් සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සීමිත තරඟ විභාගයට පෙනී සිටීමට අවස්ථාව නොලැබීම සහ වෙනත් කරුණු - ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

### 1.3.1 පාර්ලිමේන්තු නිළධාරින් සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සීමිත තරඟ විභාගයට පෙනී සිටීමට අවස්ථාව ලබාදීම

2008.08.29 වන දිනෙන් පසු පාර්ලිමේන්තු නිළධාරින්ට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සීමිත තරඟ විභාගයට පෙනී සිටීමට අවස්ථාව අහිමි වී ඇති බැවින් ඒ සඳහා අවස්ථාව ලැබෙන ලෙස නව ගැසට් පත්‍රයක් නිකුත් කරන ලෙස එම නිළධාරින් විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

ගරු මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම තමා වෙත ලබා දීමට කටයුතු කරන ලෙසත් ඒ අනුව මේ සම්බන්ධයෙන් රා.සේ.කො. සභාව සමඟ සාකච්ඡා කිරීමට පියවර ගන්නා බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.3.2 විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ආපදාවට ලක්වූවන්ට වන්දි නොලැබීම

2017 වර්ෂයේදී විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇතිවූ සුළිසුළං තත්ත්වය හේතුවෙන් ආපදාවට ලක්වූවන් මාස 03ක කාලය තුළ අදාළ ඉල්ලීම් කර ඇති නමුත් ඔවුන්ට මෙතෙක් වන්දි ලැබී නොමැති බව ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

ආපදා කලමනාකරණය සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු බවත් ගරු මන්ත්‍රීතුමිය විසින් තවදුරටත් දැනුම් දෙන ලදි.

යම්කිසි ආපදාවක් සිදු වූ විට අදාළ නිලධාරීන්ට දැනුම් දීම් කටයුතු කළ යුතු බවට ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී. තවද, ගත යුතු පියවර සඳහා කාලරාමුවක් ඇතුළත් කර වාර්තාවක් සකස් කරන ලෙසත් උපදෙස් ලබා දෙන ලදි.

## 1.4 වගා හානි සම්බන්ධයෙන් වන්දි ලබා දීම - ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් සිදු වන වගා හානි සඳහා වන්දි ලබා දීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් විමසීමක් කරන ලදි.

වගා හානි හා ජීවනෝපාය මාර්ගයට වන හානි වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා මගින් වාරික 7ක් ලෙස ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මගින් වන්දි ගෙවා ඇති බව එම මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

2016/17 මහකන්නයේ වගා හානි වූ ගොවි පවුල් සඳහා පවුලකට රු.10,000/-ක වන්දි මුදලක් පවුල් 523,000ක් සඳහා ලබා දී ඇති බව කාරක සභාවට දැනුම් දෙන ලදී.

වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් කෘෂිකාර්මික හා ඒ ආශ්‍රිත ජීවනෝපාය මාර්ග අවහිරව ආර්ථික දුෂ්කරතාවයන්ට මුහුණ පා ඇති පවුල් සඳහා පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව පදනම් කරගෙන සති දෙකකට රු.2000/-ක් හෝ රු.2500/-ක් බැගින් වියළි සලාක වාරික 04ක් 2017 අගෝස්තු හා සැප්තැම්බර් මාස සඳහා ලබාදුන් බව කාරක සභාවට දැනුම් දෙන ලදී.

තවද, මසකට රු.4000/-ක හෝ රු.5000/-ක වියළි සලාක වාරික 02ක් 2018 මාර්තු හා අප්‍රේල් යන මාසවලදී ලබා දෙන ලද බව කාරක සභාවට දැනුම් දෙන ලදී. එලෙසම 2018 නොවැම්බර් මස සඳහා එක් වියළි සලාක වාරිකයක් ලබාදුන් බව දැනුම් දෙන ලදී.

**1.5 ස්වාභාවික විපත්වලින් ආපදාවට ලක්වූ පෞද්ගලික හා පොදු දේපළ නැවත ගොඩනැංවීම - ගරු සුජිත් සංජය පෙරේරා මහතා**

2016 වසරේදී කෑගල්ල දිස්ත්‍රික්කය සහ සෙසු දිස්ත්‍රික්කවල සිදුවූ ආපදා තත්ත්වය වෙනුවෙන් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් විශාල මුදල් ප්‍රමාණයක් වැය කර ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

ඒ අනුව ආපදා තත්ත්වයෙන් පසු අළුත්වැඩියාවන් බොහෝදුරට නිමකර ඇති ගම්මාන විවෘත කිරීම් කඩිනමින් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම ගම්මානවල අළුත්වැඩියා කටයුතු නිම කිරීම සඳහා කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදි.

**1.6 ආපදා අවස්ථාවකදී රාජ්‍ය ආයතන ක්‍රියාත්මක වීම සහ වන්දි ලබා දීම - ගරු නිහාල් ගලප්පත්ති මහතා**

රජයේ නිවාඩු දිනවලදී ආපදාවක් සිදු වූ විට රාජ්‍ය ආයතන ක්‍රමවත් වැඩපිළිවෙළක් ඉක්මණින් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් විමසීමක් කරන ලදී.

දැනට අමාත්‍යාංශය යටතේ ත්‍රිවිධ හමුදාව සමඟ සම්බන්ධීකරණය වීමෙන් දවසේ පැය 24 පුරාම ක්ෂණික ආපදා පෙර දැනුම් දීම් මධ්‍යස්ථාන ක්‍රියාත්මක වන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

ආපදාවක් සිදු වීමෙන් පසු ජීවිත හානි සහ දේපළ හානි වෙනුවෙන් ගෙවනු ලබන වන්දි මුදල වැඩි කිරීමේ හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

ජාතික රක්ෂණ භාර අරමුදලට වාරික මුදලක් ගෙවීම මගින් වන්දි ලබා දීමේ පෙර නොතිබූ ක්‍රමවේදයක් මෑතකදී හඳුන්වා දුන් බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

කාලගුණ තත්ත්වය පිළිබඳ ඉදිරිපත් කරනු ලබන අනාවැකි සම්බන්ධයෙන් ජනතාවගේ පවතින ආකල්පය සුභවාදී නොවන බැවින් ඒ පිළිබඳ අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

වර්තමානයේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සතු උපකරණ සහ ජාත්‍යන්තර වශයෙන් ලැබෙන තොරතුරු අනුව අනාවැකි ඉදිරිපත් කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2. වෙනත් කටයුතු

### 2.1 පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සම්බන්ධ ගැටලුව

පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සම්බන්ධ ගැටලුව පිළිබඳව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවෙන් විමසීමක් කරන ලදී.

වියළි සලාක ලබා දීම සම්බන්ධයෙන් 2018 දී ඉන්පසුව චක්‍රලේඛ දෙකක් නිකුත් කර ඇතත්, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම්වරිය විසින් දෙවන චක්‍රලේඛය අනුව කටයුතු කර නොමැති බවත් ඒ අනුව කොට්ඨාශයේ ගොවීන්ට රජයේ ප්‍රතිපත්තිය අනුව ලබා දෙන සහන ලැබී නොමැති බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම නිළධාරිනිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමට සහ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගොවීන්ට නොලැබුණු ඉහත සඳහන් සහන ලබා දීමට කටයුතු කරන ලෙසත් ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදි.

## 3. රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාව

### 3.1 ජාතික රක්ෂණ භාර අරමුදල

මේ වනවිට ජාතික රක්ෂණ භාර අරමුදල වෙනුවෙන් ගෙවනු ලබන වාරික මුදල ඉහළ නංවා ඇති බැවින් ලබා දෙනු ලබන ප්‍රතිලාභ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදි.

රක්ෂණ ප්‍රතිලාභ ගෙවීම සඳහා මුදල් අමාත්‍යාංශයෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින් රක්ෂණ වාරිකය ඉහළ නැංවීමට කටයුතු කළ බව කාරක සභාවට දැනුම් දෙන ලදි. ජීවිත හානියක් වෙනුවෙන් ගෙවනු ලබන වන්දි මුදලෙහි ප්‍රමාණය වැඩි කිරීමේ හැකියාව පිළිබඳව සොයා බැලිය යුතු බව ද තවදුරටත් දැනුම් දෙන ලදි.

ආපදා තත්ත්වයකදී අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යොමු කරනු ලබන තක්සේරු වන්දි මුදල

සංශෝධනය කිරීම පිළිබඳව ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදි.

ජාතික රක්ෂණ භාර අරමුදලේ නිලධාරීන් ද ඇතුළුව අදාළ පාර්ශව සමඟ ආපදා සිදුව ඇති ස්ථාන කිහිපයකට ගොස් ඒකාබද්ධ පරීක්ෂණයක් සිදු කර වන්දි මුදල් තක්සේරු කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් දෙන ලදි. එමෙන්ම තක්සේරු මුදල රු. 25,000/- ඉක්මවන අවස්ථාවලදී ගෙවිය හැකි වන්දි මුදල් නිර්ණය කිරීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කර ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව ද ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

තවද ආපදාවකදී ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ සහකාර අධ්‍යක්ෂවරයා ක්‍රියාත්මක විය යුතු ආකාරය වාර්තාගත වන අයුරින් ක්‍රමවේදයක් සකස් කරන ලෙසත් ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදි.

ජාතික රක්ෂණ භාර අරමුදලෙන් වන්දි මුදල් මුදා හැරීමේදී ඒ සම්බන්ධයෙන් ඵලදායී ක්‍රමවේදයක් සකස් කර තමාට ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදි.

### 3.2 කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ කටයුතුවල ප්‍රගතිය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නවීකරණය කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

### 3.3 ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

නිවාස ඉදි කිරීමෙහි සාර්ථකත්වය හා මුදල් අනුමත වී ඇති නිවාස ගණන පිළිබඳ ගරු සභාපතිතුමා විසින් කාරක සභාවෙන් විමසීමක් කරන ලදී.

නායයෑම් සහ ගංවතුර අධි අවදානම් ප්‍රදේශවල සිටින පවුල් සඳහා පෙරසවි නිවාස 10000ක් ඉදි කිරීමේ වැඩසටහනක් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින අතර, එයින් නිවාස 1170 ක් කළුතර හා රත්නපුර දිස්ත්‍රික්කවල ඉදිකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දැනුම් දෙන ලදී. තවද මේ වන විට කළුතර හා රත්නපුර දිස්ත්‍රික්කවල එයින් නිවාස 400ක් රුපියල් මිලියන 800ක වියදමින් ඉදි කිරීමට සුදුසු ඉඩම් පවතින අතර, එම ඉඩම් මෙම පෙරසවි නිවාස ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා වෙන්කර තබන ලෙස දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත උපදෙස් ලබා දී ඇති බව ද අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දැනුම් දෙන ලදී.

එම ව්‍යාපෘතියේ වැඩකටයුතු කඩිනමින් ආරම්භ කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාට උපදෙස් ලබාදෙන ලදී.

නායයෑම් හා ආපදා අවම කිරීමේ ව්‍යාපෘතීන් සඳහා චීන රජයේ ආධාර ක්‍රමය යටතේ ඩොලර් මිලියන 110ක් ලබාගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බවත්, මෙම ආධාර උපයෝගී කරගෙන මහාමාර්ග, පාසල් හා රෝහල් ආශ්‍රිත නායයෑම් අවම කිරීම සඳහා පැති බැම් ඉදි කිරීම, වැර ගැන්වීම් ක්‍රම සහ ජල පාලන ක්‍රම අනුගමනය කිරීමට බලාපොරොත්තු වන බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දැනුම් දෙන ලදී.

**3.4 විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් වන වාර්තාව හැකි ඉක්මණින් ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාට උපදෙස් ලබා දෙන ලදී. 90%ක ප්‍රතිශතයකට මසක් තුළ විශ්‍රාම වැටුප් ලබා දුන් නමුත්, අධ්‍යාපන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු යටතේ සේවය කරන නිළධාරීන්ගේ පුද්ගලික ලිපිගොනු අදාළ ආයතන මගින් යාවත්කාලීන නොකිරීම නිසා ඉතිරි ඉල්ලුම්පත්‍ර හරවා යැවීමට සිදුවන බව තවදුරටත් දැනුම් දෙන ලදී.

වයස අවුරුදු 45 ඉක්මවා සේවයට බඳවා ගත් පුද්ගලයන්ට විශ්‍රාම වැටුප් ලබා දීම සඳහා ආයතන මගින් ඉල්ලුම්පත්‍ර යොමු කිරීමේදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගැටලුකාරී තත්ත්වයකට මුහුණ දීමට සිදු වන බව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.5 රාජ්‍ය සේවා නව බඳවා ගැනීම්**

**3.5.1** ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නව පත්වීම් පිළිබඳ ගරු සභාපතිතුමා විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරියගෙන් විමසීමක් කරන ලදී. පුරප්පාඩු 911ක් පැවතිය ද එකම ලකුණු මට්ටමේ විශාල අයදුම්කරුවන් ප්‍රමාණයක් සිටින බැවින් 907ක් පමණක් බඳවා ගන්නා බවත්, මූලික සුදුසුකම් සපුරාලන සියළුදෙනා බඳවා ගන්නා බවත් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරිය විසින් දැනුම් දෙන ලදී.

**3.5.2** ගැසට් කළ ප්‍රමාණය ඉක්මවා ගණකාධිකාරී සේවය සඳහා දෙවන කණ්ඩායමක් බඳවා ගැනීමට ඉදිරිපත්ව ඇති ඉල්ලීම් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දීම, පවතින පුරප්පාඩු හා නැවත බඳවා ගැනීම් සම්බන්ධව ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී.

**3.5.3** බඳවා ගැනීම් කළ පසුව ද තවත් 200 ක් පමණ පුරප්පාඩු පවතින බව කාරක සභාවට දැනුම් දෙන ලදී. දෙවන කණ්ඩායමක් බඳවාගැනීම සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මෙතෙක් තීරණයක් ලබාදී නොමැති බව ද දැනුම් දෙන ලදී.

**3.5.4** ඉංජිනේරු සේවයේ පත්වීම්, විශ්ව විද්‍යාලය මගින් උපාධි ලබා ගන්නා අනුපිළිවෙළටම ලබා දීම නොහැකි වීමට හේතුව පිළිබඳව ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී. විවිධ විශ්ව විද්‍යාලවලට ශ්‍රේණි සාමාන්‍ය (G.P.A) වෙනස් වන බැවින් හා වෙනත් සුදුසුකම් මත ද බඳවා ගැනීම් සිදු කෙරෙන බැවින් කුසලතා අනුපිළිවෙළ සකස් කිරීම අපහසු බව කාරක සභාවට දැනුම් දෙන ලදී.

එක් තරඟ විභාගයක් මගින් සියළුම දීප ව්‍යාප්ත සේවාවන්හි තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට සාකච්ඡා කරමින් පවතින බව ද ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.6 එලදායිතා ලේකම් කාර්යාලය**

ඵලදායිතා අංශය තුළ පවතින ගැටලු පිළිබඳව ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී. කොට්ඨාස අධ්‍යාපන කාර්යාල සඳහා විශේෂ වැඩපිළිවෙළක් මගින් ඵලදායිතා අංශයේ ප්‍රගතියක් ඇති කිරීමට කටයුතු සිදු කරන බව කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.7 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය**

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කටයුතුවල ප්‍රගතිය පිළිබඳ ගරු සභාපතිතුමා විසින් විමසන ලදී.

මේ දිනවල ආයතනීය මුළු ඉඩකඩ තුළම පුහුණු වැඩසටහන් පවත්වන බව දැනුම් දෙන ලදී. එමෙන්ම රාජ්‍ය සේවයේ නවක පත්වීම්ලාභීන් සඳහා පැවැත්වීමට නියමිත පුහුණු වැඩසටහන් පිළිබඳව ද කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.8** දේශපාලන පළිගැනීම්වලට ලක්වූවන් වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා නිකුත් කර ඇති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී. පුනරුත්ථාපන අංශය සඳහා භාණ්ඩාගාරයෙන් තවමත් මුදල් අනුමත වී නොමැති බවද, රාජ්‍ය පරිපාලන නිලධාරීන් සඳහා ප්‍රතිපාදන වෙන් වී ඇති බව ද කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.** කාරක සභාව ප.ව. 12.50 ට 2019 මැයි මස 23 වන දින පෙ.ව. 10.00 තෙක් කල් තබන ලදී.

---------------------------

**මහානගර හා බස්නාහිර සංවර්ධන කටයුතු පිළිබඳ**
**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2019 මාර්තු 22**

**පැමිණ සිටි කාරක සභික මන්ත්‍රීන්**
ගරු පාඨලී චම්පික රණවක මහතා (සභාපතිතුමා)
ගරු ලසන්ත අලගියවන්න මහතා
ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය
ගරු ප්‍රසන්න රණතුංග මහතා

**පැමිණ සිටි කාරක සභික නොවන මන්ත්‍රීන්**
ගරු මහින්ද අමරවීර මහතා
ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා
ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු එස්.එම්. මරික්කාර් මහතා
ගරු මලිත් ජයතිලක මහතා

## 1. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා

### 1.1 මීතොටමුල්ල කසළ කන්ද ව්‍යාපෘතියේ සැලැස්ම සහ වෙනත් කරුණු - ගරු එස්.එම්. මරික්කාර් මහතා

#### 1.1.1 මීතොටමුල්ල කසළ කන්ද ව්‍යාපෘතියේ සැලැස්ම

මීතොටමුල්ල කසල කන්ද ව්‍යාපෘති සැලැස්මෙහි වත්මන් තත්ත්වය, කසල කන්ද ව්‍යාප්ත වී ඇති ප්‍රමාණයෙහි නාගරික උද්‍යානයක් ඉදි කිරීමෙන් පසු ඒ අවට නගරයක් ඉදි කිරීමේ හැකියාව, අනවසර පදිංචිකරුවන් වෙනත් ස්ථානවල පදිංචි කරවීමට හැකියාව සහ සින්නක්කර ඔප්පු හිමි අයට වන්දි ලබා දීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

නාගරික සංවර්ධන අධිකාරිය රුපියල් මිලියන 1200 ක ඇස්තමේන්තු ප්‍රතිපාදනයක් වෙන්කර ඇති බව ද අක්කර 09 ක් පමණ වන කොටසක නාගරික උද්‍යානය ඉදි කෙරෙන බව ද නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි. පදිංචිකරුවන් නැවත පදිංචි කරවීම සම්බන්ධව තොරතුරු රැස් කරමින් පවතින බව ද කාරක සභාවට දැනුම් දෙන ලදි.

සින්නක්කර ඔප්පු හිමි පදිංචිකරුවන්ට ඔවුන්ගේ ඉඩමේ වටිනාකමට සමාන වන පරිදි නිවාස ඒකක ප්‍රමාණයක් ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

#### 1.1.2 මෙගොඩ කොළොන්නාව ප්‍රදේශයේ අනවසර ඉදිකිරීම්

සිංහපුර ආසන්නයේ මෙගොඩ කොළොන්නාව ප්‍රදේශයේ විශාල අනවසර ඉදිකිරීම් ප්‍රමාණයක් සිදු වෙමින් පවතින බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

### 1.1.3 නාරාහේන්පිට රථවාහන තදබදය

උදය සහ සවස් කාලයේදී නාරාහේන්පිට කිරිමණ්ඩල මාවතේ රථවාහන තදබදයක් පවතින බැවින් මේ සඳහා විකල්ප මාර්ගයක් යොදා ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මේ වනවිට නගර සභාව සමඟ කටයුතු කරමින් මංතීරු 4කින් යුතුව කිරිමණ්ඩල මාවත පුළුල් කිරීමට යෝජනාවක් ඉදිරිපත් කර ඇති බවත් ඒ සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

එමෙන්ම ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කරන ලද විකල්ප මාර්ගය පිළිබඳව විමර්ශනයක් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සාමාන්‍යාධිකාරීවරයාට උපදෙස් ලබා දෙන ලදි.

තවද දෙහිවල හිල් ස්ට්‍රීට්හි උදය සහ සවස් කාලයේ රථවාහන තදබදයක් පවතින බැවින් කඩවත පාර සහ ගල්විහාර පාර සම්බන්ධ කර කුඩා පාලමක් යෙදීමට කටයුතු කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මේ සම්බන්ධයෙන් යෝජනාවක් මාර්ග සංවර්ධන අධිකාරියට ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමාට උපදෙස් ලබා දෙන ලදි.

## 1.2 මිනුවන්ගොඩ නගර සංවර්ධන සැලැස්ම - ගරු ප්‍රසන්න රණතුංග මහතා

නාගරික සංවර්ධන අධිකාරියේ සැලැස්මට විරුද්ධව පළාත් පාලන අමාත්‍යාංශය මිනුවන්ගොඩ නගරය මධ්‍යයේ වැසිකිළි පද්ධතියක් ඉදි කර ඇති බැවින් ඒ පිළිබඳ අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි. මෙම ස්ථානයේ වෙනත් ගොඩනැගිල්ලක් ඉදි කිරීමට සැලසුම් කර තිබූ බවත් ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදි.

මිනුවන්ගොඩ නගරය සඳහා වන සංවර්ධන සැලැස්ම මීට වසර 10ට පෙර සකස් කරන ලද සැලැස්මක් බව නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි. තවද 2019 වසරේදී මිනුවන්ගොඩ නගර සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට කටයුතු යොදා ඇති අතර මෙම වසර අවසන් වන විට එය නිම කළ හැකි බවත් ඔහු විසින් දැනුම් දෙන ලදි.

මෙම කරුණ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කර ගරු එඩ්වඩ් ගුණසේකර මහතා, ගරු ප්‍රසන්න රණතුංග මහතා සහ මිනුවන්ගොඩ නගරාධිපතිවරයා සමඟ සාකච්ඡාවක් පැවැත්වීමට පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිවරයාට උපදෙස් ලබා දෙන ලදි.

**1.3 රත්මලාන, වේරස් ගඟ ව්‍යාපෘතිය සහ රත්මලාන නව නගර ව්‍යාපෘතිය - ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**

රත්මලාන, වේරස් ගඟ ව්‍යාපෘතිය පිළිබඳව ගරු මන්ත්‍රීතුමිය විසින් විමසීමක් කරන ලදි.

මෙම ව්‍යාපෘතිය මඟින් ඇපල්වත්ත පෙදෙස ආවරණය නොවන බවත් බොල්ගොඩ ඇළ මාර්ගයේ වම් පැති ප්‍රදේශයක් පමණක් ආවරණය වන බවත් ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සාමාන්‍යාධිකාරීවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි. ඉතිරි ප්‍රදේශය ආවරණය වන ලෙස සැලැස්මක් සකස් කර ඇති බව ඔහු විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදි.

නුගේගොඩ සිට කරදියාන - කඳවල දක්වා කොටස වේරස් ගඟ ව්‍යාපෘතියෙන් ආවරණය වන බවත් ලුනාව ව්‍යාපෘතියෙන් මොරටුව ප්‍රදේශය ආවරණය වන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි. කඳවල කටුබැද්ද අතරමැදි කොටස කිසිදු ව්‍යාපෘතියකින් ආවරණය නොවන බව වැඩිදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදි. මේ වනවිට මෙම අතරමැදි ප්‍රදේශය සඳහා මුදල් අනුමත වී නොමැති නමුත් ඒ සඳහා වන සැලැස්ම සකස් කර අවසන් බව ද ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

රත්මලාන නව නගර ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ද ගරු මන්ත්‍රීතුමිය විසින් විමසීමක් කරන ලදි.

රත්මලාන සහ දෙමටගොඩ ප්‍රදේශවල දුම්රිය දෙපාර්තමේන්තුව සතුව ඇති භාවිතා නොකරන විශාල ඉඩම් කොටස් ඇති බැවින් එම ඉඩම් ලබා ගැනීම සම්බන්ධයෙන් දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කරමින් පවතින බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි. එමෙන්ම රත්මලානේ ප්‍රදේශයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට හිමි ඉඩම සහ බැට්රිවත්ත යන ඉඩම් දෙක සඳහා නාගරික නිවාස යෝජනා ක්‍රම දෙකක් ඉදිරිපත් කරන බවත් තවදුරටත් දැනුම් දෙන ලදි.

**1.4 බණ්ඩාරගම රථවාහන තදබදය - ගරු මලිත් ජයතිලක මහතා**

බණ්ඩාරගම දැඩි රථවාහන තදබදය අවම කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

බණ්ඩාරගම පවතින රථවාහන තදබදයට විසඳුමක් ලෙස ඉදිරිපත්වූ යෝජනාවට පරිබාහිර විකල්ප මාර්ගයක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් හඳුනාගෙන ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි. බණ්ඩාරගම නගර සංවර්ධන සැලසුමෙහි මාර්ග සංවර්ධනයට අදාළව හොරණ, කළුතර සහ පිලියන්දල මාර්ග සම්බන්ධ කිරීමට යෝජිත බව නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

කුඹුරු ඉඩම් පවරා ගැනීමේදී වන්දි ගෙවීම සම්බන්ධයෙන්ද ගරු මලිත් ජයතිලක මහතා විසින් විමසීමක් කරන ලදි.

සාමාන්‍යයෙන් නාගරික ප්‍රදේශවල කුඹුරු ඉඩම් වෙනුවෙන් ගෙවන වන්දි මුදල පර්චස් එකකට රු. 9000/- ක් බවත් ගම්බද ප්‍රදේශවල එය රු.7000/- වන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

**1.5 අගුණකොළපැලැස්ස ප්‍රදේශයෙහි ඉදි කිරීම් අවසන් කර නොමැති වෙළෙඳ සංකීර්ණ ගොඩනැගිල්ල සහ තංගල්ල නගරයේ සිදු කෙරෙන අනවසර ඉදි කිරීම් - ගරු මහින්ද අමරවීර මහතා**

**1.5.1 අගුණකොළපැලැස්ස වෙළෙඳ සංකීර්ණ ගොඩනැගිල්ල**

අගුණකොළපැලැස්ස වෙළඳ සංකීර්ණයේ ඉදි කිරීම් කටයුතු මේ වන තෙක් නිම වී නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මේ සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති බව නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

එමෙන්ම හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්ස ප්‍රදේශයේ ඉදි කරන ලද ගොඩනැගිලි සංකීර්ණය, සූරියවැව වෙළෙඳ පොළ සහ බෙරළිහෙළ වෙළෙඳ පොළ ආශ්‍රිත ගොඩනැගිලි ඉදිරි මාස 2 තුළ විවෘත කිරීමට කටයුතු යොදා ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

**1.5.2 තංගල්ල නගර සහා බල ප්‍රදේශයෙන් ඔබ්බට පිහිටි වෙල්යායක් ගොඩකර සිදු කෙරෙන අනවසර ඉදි කිරීම්**

මෙම අනවසර ඉදිකිරීම පිළිබඳව අවධානය යොමු කර මේ සඳහා ක්‍රමවත් සැලසුමක් සකස් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

තංගල්ල ඉදි කරන ලද නව කඩ කාමර 72 සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදි.

කඩ කාමර ඉතා ඉක්මණින් ලබා දීමට කටයුතු කරන බව නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් දැනුම් දෙන ලදි. එමෙන්ම තංගල්ල නගර සැලසුමක් ඉතා ඉක්මණින් ක්‍රියාත්මක කරන බවත් ඔහු විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදි.

අලුතින් වෙළෙඳ කාමර ලබා දීමේදී අනවසර වෙළෙඳ සැල් ඉවත් කිරීමෙන් පසු නව කඩ කාමර ලබා දීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදි.

**1.6 මන්නාරම පොදු ක්‍රීඩාංගනයේ ඉදි කිරීම් - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**

මන්නාරම පොදු ක්‍රීඩාංගනයේ ඉදි කිරීම් කටයුතුවල ප්‍රගතිය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

මෙම ක්‍රීඩාංගනයේ තණ පිඩලි ඇල්ලීමේ කොන්ත්‍රාත්තුවේ අඩුපාඩු නිසා එම කටයුතු නැවත සිදු කිරීමට පියවර ගන්නා බව නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි. මෙම ප්‍රදේශයේ ධීවර ජනතාවට රාත්‍රී කාලයේදී ක්‍රීඩා කිරිම සඳහා ක්‍රීඩාංගනයේ විදුලි ආලෝකය සැපයීමට හැකි නමුත් එම බිල්පත් ගෙවීම සම්බන්ධයෙන් ක්‍රමවේදයක් සකස් කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමාට දැනුම් දෙන ලදි.

මන්නාරම බස් නැවතුම් පොළ ඉදි කිරීමේ කටයුතු ජූනි මස වනවිට අවසන් කළ හැකි බවත් මුලතිව් බස් නැවතුම් පොළ ඉදි කිරීමේ කටයුතු මේ වනවිට අවසන් කර ඇති බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි. තවද මන්නාරම වෙළෙඳ පොළ ගොඩනැගිලි සංකීර්ණයේ කටයුතු ද මාස 2 ක කාලයක් තුළ නිම කළ හැකි බව නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි. එමෙන්ම වවුනියාව වෙළෙඳ පොළ ආශ්‍රිත ගොඩනැගිල්ලලෙහි ඉදිකිරීම් කටයුතු ද මාස 2 ක් ඇතුළත අවසන් කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

**1.7 ගුවන් හමුදාවේ ගිනි නිවීමේ ඒකකය ස්ථාපිත කිරීම සඳහා ඉඩමක් ලබා නොදීම සහ කළුඔය ගංවතුර පාලන ව්‍යාපෘතියෙහි ප්‍රගතිය - ගරු ලසන්ත අලගියවන්න මහතා**

**1.7.1 ගුවන් හමුදාවේ ගිනි නිවීමේ ඒකකය ස්ථාපිත කිරීම සඳහා ඉඩමක් ලබා නොදීම**

ගුවන් හමුදාවේ ගිනි නිවීමේ ඒකකය ස්ථාපිත කිරීම සඳහා නාරාහේන්පිට ප්‍රදේශයේ අවශ්‍ය ඉඩම සම්බන්ධයෙන් ගැටළුවක් පවතින බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මැනුම් විමර්ශනයක් සිදු කිරීම සඳහා අවසර දෙමින් ගුවන් හමුදාවට ලිපියක් යොමු කර ඇති බව අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි. අමාත්‍ය මණ්ඩලය අනුමත කරන ලද අමතර ප්‍රතිපාදන සඳහා වූ ආරක්ෂක අමාත්‍යාංශයේ ඉල්ලීම සඳහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබා දී නොමැති බැවින් මෙම ප්‍රමාදය සිදු වී ඇති බවත් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් තවදුරටත් දැනුම් දෙන ලදි.

**1.7.2 කළුඔය ගංවතුර පාලන ව්‍යාපෘතියෙහි ප්‍රගතිය**

වත්තල - කළුඔය ගංවතුර පාලන ව්‍යාපෘතියේ වත්මන් තත්ත්වය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

කළුඔය ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනය අවසන් කිරීමෙන් පසු සිදු විය යුතු කටයුතු සම්බන්ධයෙන් පියවර ගැනීම සඳහා ජයිකා ව්‍යාපෘතියට (JICA Project) භාර දී ඇති බවත් තවදුරටත් සාකච්ඡා කෙරෙමින් පවතින බවත් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා (තෙත්බිම් කළමණාකරු) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

**1.8 මඩකලපුව නගරයේ සංවර්ධන කටයුතු - ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා**

අබලන් වී ඇති මඩකලපුව මහනගර සභා මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි. එමෙන්ම ජලාශ්‍රිත ප්‍රදේශ හරහා ගමන් කිරීම සඳහා පාලමක් ඉදි කර දෙන ලෙස ද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදි.

අමාත්‍යාංශය විසින් සැලසුම් කර ඇති පරිදි මඩකලපුව නගරය විධිමත් නගරයක් ලෙස ගොඩනැගීමට නියමිත බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි. විශේෂයෙන්ම යාපනය නගරය මෙන්ම මඩකලපුව නගරය උපායමාර්ගික නගරයක (Strategic City) තත්ත්වයට පත් කිරීමට සැලසුම් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදි.

මඩකලපුව දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන ප්‍රධාන ව්‍යාපෘති දෙකක් ලෙස සතුරුකොන්ඩාන් නාගරික උද්‍යානය සහ මඩකලපුව නගරයේ බස් නැවතුම්පොළ සංවර්ධන කටයුතු හඳුන්වා දිය හැකි බවත් මීළඟ වසර වෙනුවෙන් මෙම දිස්ත්‍රික්කයේ වෙළෙඳ සංකීර්ණ ගොඩනැගිල්ලක් ඇතුළුව තවත් ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීමට අදහස් කරන බවත් නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

**2.** කාරක සභාව ප.ව. 4.00 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

----------------------------

**වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2019 මාර්තු 26**

**පැමිණ සිටි කාරක සභික මන්ත්‍රීන්**

ගරු සාගල රත්නායක මහතා (සභාපති)
ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
ගරු චමල් රාජපක්ෂ මහතා
ගරු නිශාන්ත මුතුහෙට්ටිගම මහතා
ගරු කාංචන විජේසේකර මහතා
ගරු මුහම්මදු නසීර් මහතා

**පැමිණ සිටි කාරක සභික නොවන මන්ත්‍රීන්**
ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා
ගරු මහින්ද අමරවීර මහතා
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු නිහාල් ගලප්පත්ති මහතා
ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු හේෂා විතානගේ මහතා
ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඞ් ඉස්මායිල්

**1. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා**

**1.1 ගාලු වරාය සංවර්ධන කටයුතුවල වර්තමාන ප්‍රගතිය - ගරු චන්දිම වීරක්කොඩි මහතා**

ගාලු වරාය පරිශ්‍රයේ සුළු පරිමාණයේ මෙහෙයුම් හා මගී ප්‍රවාහනයට තටාකාංගනයක් (Yacht Marina) ඉදිකිරීමේ කටයුතුවල වර්තමාන ප්‍රගතිය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ව්‍යාපෘති සඳහා යෝජනා ඉල්ලුම්කර (Request for Proposals) කැඳවා එය ඇගයීමකට ලක් කර ඇතත් යම් ගැටළුවක් නිසා ස්ථාවර කමිටුව මගින් ව්‍යාපෘති සඳහා යෝජනා ඉල්ලුම්කර (RFP) නැවත කැඳවීමට තීරණය කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ගාල්ල වරාය අභ්‍යන්තරයේ ඇති සිමෙන්ති ගබඩාව මගින් ඉහත සංවර්ධන කටයුතුවලට අහිතකර බලපෑමක් සිදුවේද යන්න සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

පැරණි සිමෙන්ති ගබඩාවක් පවතින බවත්, ඊට අමතරව කුඩා ඇඹරුම් කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීමට අනුමැතිය ලබාදී ඇති බවත්, එහි යන්ත්‍ර සවි කර ඇතත්, එහි වැඩකටයුතු ආරම්භ කිරීමට මෙතෙක් කටයුතු කර නොමැති බවත් වරාය අධිකාරියේ ප්‍රධාන ඉංජිනේරු සුසන්ත අබේසිරිවර්ධන මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයට හා රුමස්සල ප්‍රදේශයේ පරිසරයට මෙම ව්‍යාපෘතියෙන් යම් හානියක් සිදුවේද යන්න පිළිබඳ ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

පවතින කර්මාන්ත ප්‍රමිතිකරණ තත්ත්වයට අනුකූලව එය පවත්වාගෙන යාමට එම ආයතනය එකඟ වී ඇති බවත්, සිමෙන්ති කුඩු ගොඩබාන අවස්ථාවේ පිටවන කුඩු දූම අවම කර ගැනීම සඳහා උපකරණයක් (Dedusting Hoppers) භාවිතා කිරීමට එකඟ වී ඇති බවත් ප්‍රධාන ඉංජිනේරුවරයා විසින් ප්‍රකාශ කරන ලදී.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් පාරිසරික ඇගයීම් තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කර ඇති අතර, එමගින් නියමිත ප්‍රමිතීන් නියම කර ඇති බවත් පාරිසරික මෙහෙයුම් සැලසුමක් ඉදිරිපත්

කරන ලෙස දැනුම්දී ඇති බවත් ඒ අනුව කටයුතු නොකරන්නේ නම් එය නතර කිරීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් සම්පූර්ණ වාර්තාවක් ලබාදීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**1.2 කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය සංවර්ධනය කිරීම - ගරු කාංචන විජේසේකර මහතා**

2014 වර්ෂයේදී යෝජිත, කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය අළුතින් යන්ත්‍රෝපකරණ (Granty Crane) යොදා සංවර්ධනය කිරීමේ කටයුතු අතහැරදැමීම හේතුවෙන් වරාය අධිකාරියට විශාල පාඩුවක් සිදුවූ බවත්, එම කටයුතු නැවත ඇරඹීමට කටයුතු කරන්නේද යන්න පිළිබඳ ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී. එමෙන්ම නැගෙනහිර පර්යන්තයේ මෙහෙයුම් කටයුතු සී.අයි.සී.ටී. සමාගමටම (Colombo International Container Terminal Limited) ලබා දීමට තීරණය කර තිබේද යන්න පිළිබඳවත් ගරු මන්ත්‍රීතුමා විසින් විමසා සිටින ලදී.

මේ පිළිබඳ සාකච්ඡා කරමින් පවතින බවත් ජපානයෙන් සහන පොලියට ණය ලබාගෙන ප්‍රධාන උපකරණ මිළදී ගැනීමට කටයුතු කරන බවත් මෙහෙයුම් සමාගමක් මඟින් පාලනය කරනු ලබන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී. මෙහෙයුම් කටයුතු වලින් 51% ක් වරාය අධිකාරිය මඟිනුත්, 49% ක් ඉන්දියාව හා ජපානය සමඟ ඒකාබද්ධව සිදුකිරීමට යෝජනා වී ඇති බව තවදුරටත් දැනුම් දෙන ලදී.

එසේම සී.අයි.සී.ටී. පෞද්ගලික ආයතනයේ සේවා කාලය දීර්ඝ කිරීමට පියවර ගෙන තිබේ ද යන්න පිළිබඳවද ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් විමසා සිටින ලදී.

කොන්ත්‍රාත් ගිවිසුම් කාලය අවුරුදු 35 ක් වන බවත් එය 2011 වර්ෂයේ සිට බලපැවැත්වෙන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එසේම සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල්ස් ලිමිටඩ් (SAGT) සමාගමද 15% ක කොටස් ශ්‍රී ලංකා රජයට හිමිවන පරිදි වරායේ ජැටියක් බදු දුන් සමාගමක් බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නැගෙනහිර පර්යන්තය සංවර්ධනය කිරීමේ කටයුතු දීර්ඝ කාලයක් අඩාලවී තිබුනද ඉදිරියේදී යෝජිත සංවර්ධන වැඩපිළිවෙල තුලින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ද එහි සේවකයන්ට මෙන්ම රටටද වඩා ඵලදායී මෙහෙවරක් ඉටුකල හැකි බව ද ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.3 කතරගම නගරය විධිමත් ලෙස සංවර්ධනය කිරීම හා එහි ජල ගැටළුවට පිළියම් යෙදීම - ගරු ආනන්ද කුමාරසිරි මහතා**

කතරගම නගරය සංවර්ධනය කිරීම සහ ජල ගැටළුව විසඳීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

දක්ෂිණ සංවර්ධන අධිකාරිය ස්ථාපිත කිරීමේ පනත මෙතෙක් අනුමත වී නොමැති බැවින් සෘජුවම සංවර්ධන කටයුතු සඳහා අමාත්‍යාංශ මට්ටමින් මැදිහත්විය නොහැකි බවත් නාගරික සංවර්ධන අධිකාරිය සම්බන්ධ කරගෙන සංවර්ධන කටයුතුවලට දායක වන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය මඟින් නාගරික සංවර්ධන අධිකාරියට අතහැරෙන ප්‍රදේශ සංවර්ධනය කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන බවත්, විශේෂයෙන්ම කතරගම වන්දනාකරුවන්ගේ සුභසාධනය සඳහා කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දැනට දෙටගමුව වැව අවට ප්‍රදේශය සංවර්ධනය කිරීමේ කටයුතු සඳහා වෙන් කළ ප්‍රතිපාදන යොදා ගනිමින් මෙම කටයුතු සිදුකරන බවත් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

**1.4 හම්බන්තොට දිස්ත්‍රික්කයේ තෙල් පිරිපහදු කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම - ගරු චන්දිම වීරක්කොඩි මහතා**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ තෙල් පිරිපහදු කිරීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

එම ව්‍යාපෘතියේදී ලුණු ලේවායට සහ කුරුළු උද්‍යානයට වන බලපෑම සම්බන්ධයෙන් පාරිසරික ඇගයීම් තක්සේරු වාර්තාවක් ලබාගෙන තිබේ ද යන්න පිළිබඳවත් ගරු මහින්ද අමරවීර මහතා විසින් විමසීමක් කරන ලදී.

වරාය ආශ්‍රිත කර්මාන්ත පුරයට පාරිසරික ඇගයීම් තක්සේරු වාර්තාවක් ලබාගෙන ඇති බවත්, හම්බන්තොට තෙල් පිරිපහදු කිරීමේ මධ්‍යස්ථානයට වෙනම පරිසර ඇගයීම් තක්සේරු වාර්තාවක් ලබාගත යුතු බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පවතින ජල හිඟතාවය හේතුවෙන් පිරිපහදු මධ්‍යස්ථානයක් සහ හම් පදම් කිරීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා බාධා ඇතිවූ බව ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පානීය අවශ්‍යතා, වගා කටයුතු මෙන්ම වරාය කර්මාන්තපුරය සඳහා අවශ්‍ය ජල ගැටළුව සඳහා ගිං නිල්වලා යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට යෝජිත බවත්, එහි ශක්‍යතා අධ්‍යයන වාර්තා ලැබීමට නියමිත බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම කාර්යයට ප්‍රමුඛතාවය ලබා දීමට කටයුතු කරන ලෙස ගරු මහින්ද අමරවීර මහතා විසින් ද ඉල්ලීමක් කරන ලදී.

ගිං නිල්වලා ව්‍යාපෘතිය ගාලු දිස්ත්‍රික්කය හරහා දිවෙන ව්‍යාපෘතියක් බැවින් එයින් වන බලපෑම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට රැස්වීමක් කැඳවන ලෙස ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

එම රැස්වීම සඳහා අදාළ පාර්ශ්වයන් කැඳවන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

### 1.5 ඔලුවිල් වරාය හේතුවෙන් ඉඩම් අහිමිවූවන්ට වන්දි ලබාදීමට කටයුතු කිරීම - ගරු මුහම්මදු නසීර් මහතා

ඔලුවිල් වරාය හේතුවෙන් ඉඩම් අහිමිවූවන්ට වන්දි ලබාදීමට කටයුතු කරන ලෙසත් ඔලුවිල් වරාය අළුත්වැඩියා කර දෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

ඔලුවිල් නින්දවූර් රට්ටපලම් ප්‍රදේශයන්හි සුනාමි ව්‍යසනය නිසා කුඹුරු හා ඉඩම්වලට ද හානි සිදුවී ඇති බැවින් අදාළ පාර්ශ්වයන්ට සහන ලබාදිය යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙම ප්‍රදේශයේ ජනයාට වන්දි ලබාදීමේ කටයුතු ප්‍රමුඛව සිදු කළ යුතු බවත්, දෙවනුව වරාය සංවර්ධනය කිරීමේ කටයුතු සලකා බැලිය යුතු බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.6 ඔලුවිල් වරායේ අඩුපාඩු හේතුවෙන් ධීවරයන්ට මුහුණපෑමට සිදුවන ගැටළු - ගරු නිහාල් ගලප්පත්ති මහතා

ඔලුවිල් වරායට වැලි පිරීම, ධීවර බෝට්ටුවලට ලබා දෙන ඉන්ධන ප්‍රමාණවත් නොවීම, පානීය ජල ගැටළුව, අයිස් යන්ත්‍රාගාරය නිසිලෙස ක්‍රියා නොකිරීම හේතුවෙන් විශාල ගැටළුකාරී තත්ත්වයක් පැන නැඟී ඇති බැවින් ඒවා නිරාකරණය කරදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් තීන්දුවක් ගැනීමට පෙර තාක්ෂණික අධ්‍යයනයක් සිදු කළ යුතු බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ගැටළුව සම්බන්ධයෙන් වරාය අධිකාරියේ නිලධාරීන් ඇතුළු කණ්ඩායමක් ප්‍රදේශයේ ජනතාව සමඟ සාකච්ඡාවක් පැවැත්වීමට නියමිත බව නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඔලුවිල් වරායෙන් ඉවත්කරන වැලි නැවත මුහුදටම දැමිය යුතු බව ගරු නිහාල් ගලප්පත්ති මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.7 වරාය ආශ්‍රිත රුමස්සල ජන්ගල් බීච් (Jungle Beach) වෙරළ විධිමත් අයුරින් සංවර්ධනය කිරීම - ගරු චන්දිම වීරක්කොඩි මහතා**

වරාය අධිකාරියට අයත් රුමස්සල "ජන්ගල් බීච් (Jungle Beach)" වෙරළ විධිමත් අයුරින් සංවර්ධනය කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් විමර්ශනය කර අදාළ පියවර ගන්නා බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

"යැච් මැරීනා (Yacht Marina)" සම්බන්ධයෙන් ආයෝජකයන් උනන්දු වන බැවින් ඒ සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

තවද, සංචාරක ආකර්ශනය සඳහා රුමස්සල සිට ගාල්ල දක්වා කේබල් කාර් සේවයක් (Cable Car Service) ක්‍රියාත්මක කරන ලෙස ද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**1.8 රුමස්සල ජපන් සාම චෛත්‍යය නුදුරින් ඉදි කිරීමට යෝජිත අවුකන බුදු පිළිමය සඳහා ඉඩම් නිදහස් කරගැනීම - ගරු නිශාන්ත මුතුහෙට්ටිගම මහතා**

ඉදිකිරීමට යෝජිත අවුකන බුදු පිළිමය සඳහා අවශ්‍ය ඉඩම වරාය අධිකාරියට අයත් බැවින් එම භූමිය නිදහස් කරදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම විස්තර ලබා දීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**1.9 කළමනාකරණ සහකාරවරුන් බඳවා ගැනීමේ විභාගය සමත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයන්ට එම පත්වීම් ලබාදීමට කටයුතු කිරීම - ගරු නිහාල් ගලප්පත්ති මහතා**

පාර්ලිමේන්තු කාර්යය මණ්ඩලයේ සේවය කරන කිහිපදෙනෙකුගේ කලත්‍රයන්ද ඇතුළත් මෙම සේවකයන්ට මාස 05ක් පමණ ගතවී ඇතත් පත්වීම් ලබා දී නොමැති බැවින් එම පත්වීම් ලබාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ පිළිබඳව විමර්ශනයක් කර අවශ්‍ය පියවර ගන්නා බව ගරු සභාපතිතුමා විසින් දැනුම්දෙන ලදී.

**1.10 තාවකාලික හා අනියම් සේවකයන්ට ස්ථිර පත්වීම් ලබාදීම - ගරු නිශාන්ත මුතුහෙට්ටිගම මහතා**

තාවකාලික හා අනියම් තනතුරුවල සේවය කරන රියදුරු හා කළමනාකරණ සහකාර තනතුරුවල සේවකයන්ට ස්ථිර පත්වීම් ලබාදීම සඳහා කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ පිළිබඳව විමර්ශනයක් කර අවශ්‍ය පියවර ගන්නා බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**1.11 යුධ සමයේ මුළුමනින්ම විනාශ වූ මුලතිව් දිස්ත්‍රික් ප්‍රදීපාගාරය නැවත ඉදිකිරීම - ගරු චාර්ල්ස් නිර්මලනාදන් මහතා**

යුද්ධය නිසා විනාශ වූ මුලතිව් ප්‍රදීපාගාරය නගර මධ්‍යයේ හඳුනාගත් ස්ථානයක නැවත ඉදි කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ප්‍රතිපාදන ලැබෙන තෙක් මූලික වැඩකටයුතු සිදුකරන ලෙස ගරු සභාපතිතුමා විසින් වරාය අධිකාරියේ සභාපතිවරයාට දැනුම් දෙන ලදී.

**1.12 තලෙයිමන්නාරම සිට ඉන්දියාව දක්වා නැව් සේවාවක් ආරම්භ කිරීම - ගරු චාර්ල්ස් නිර්මලනාදන් මහතා**

අතීතයේ පැවති අයුරින් තලෙයිමන්නාරම සිට ඉන්දියාවේ රාමේෂ්වරම් දක්වා නැව් සේවයක් ආරම්භ කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

කන්කසන්තුරේ සිට ඉන්දියාවේ කාරික්කාල් දක්වා නැව් සේවයක් ඇරඹීම සඳහා මේ වනවිට අනුමැතිය ලබාගෙන ඇති බවත්, ඊට සමගාමීව තලෙයිමන්නාරම සංවර්ධනය කිරීම සඳහා සැලසුම් සකස් කරන ලෙස වරාය අධිකාරියට දැනුම් දී ඇති බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වන්නි දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් යුධ සමයේ ඉන්දියාවට ගොස් එහි කඳවුරුවල මෙතෙක් ජීවත්වන බවත්, ඔවුන්ට තම බඩුබාහිරාදිය රැගෙන මෙරටට ඒම සඳහා මසකට වරක් හෝ නැව් සේවාව ලබාදීමට කටයුතු කරන ලෙස ද ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

ඒ සඳහා නැවක් කුලී පදනම මත ලබාගත හැකිදැයි සොයා බලන ලෙසත් උතුරු සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරන ලෙසත් ගරු සභාපතිතුමා විසින් වරාය අධිකාරියේ සභාපතිතුමාට උපදෙස් ලබා දෙන ලදී.

**1.13 දක්ෂිණ සංවර්ධන අධිකාරිය මගින් ගාල්ල හා මාතර දිස්ත්‍රික්ක හා කොටවිල නවනගරය හා මිරිස්ස සංචාරක කලාපය සංවර්ධනය කිරීමේ කටයුතු - ගරු කාංචන විජේසේකර මහතා**

පසුගිය වසරවලදී ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල සංවර්ධන කටයුතුවල ප්‍රගතිය හා කොටවිල හා මිරිස්ස සංචාරක කලාපයන්හි සංවර්ධනය කිරීමේ කටයුතු ප්‍රමාදවීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් විමසීමක් කරන ලදී.

දක්ෂිණ සංවර්ධන අධිකාරී පනත අනුමත නොවීම හේතුවෙන් ඒ පිළිබඳව කිසිඳු පියවරක් ගත නොහැකි බවත් කොටවිල නවනගරය දක්ෂිණ සංවර්ධන අධිකාරිය යටතට නොගැනෙන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කොටවිල හා මිරිස්ස සංවර්ධන කලාපවල සංවර්ධන කටයුතු සංචාරක සංවර්ධන මණ්ඩලයට භාරදී ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

හම්බන්තොට කර්මාන්ත කලාපයේ කටයුතු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් සිදුකර ගැනීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දක්ෂිණ සංවර්ධන අධිකාරිය යටතේ තිබූ ගාලු වරාය, නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතට පැවරුණු බවත්, මාතර වරාය දක්ෂිණ සංවර්ධන අධිකාරියට අයත් නොවන බවත් දක්ෂිණ බලකොටු පනත (Southern Fort Act) නමින් නව පනතක් හඳුන්වාදීම තුළින් දකුණු පළාතේ වරායන් ඒ යටතට ගැනීමට කටයුතු සම්පාදනය කරන බවත්, ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සී.අයි.සී.ටී. (Colombo International Container Terminal Limited) පෞද්ගලික ආයතනයට එම පර්යන්තය පුළුල් කිරීමට අවසර ලබාදී තිබේ ද යන්න පිළිබඳ ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ඒ සඳහා අවසර ලබාදී නොමැති බවත් තාක්ෂණික ඇගයීම් කටයුතු සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.** කාරක සභාව දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

-----------------------------

**කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමූපකාර සංවර්ධන හා වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**දෙවැනි රැස්වීම - 2019 අප්‍රේල් 05**

**පැමිණ සිටි කාරක සභික මන්ත්‍රීන්**
ගරු රිෂාඩ් බදියුදීන් මහතා (සභාපති)
ගරු බුද්ධික පතිරණ මහතා
ගරු කේ. කේ. පියදාස මහතා

**පැමිණ සිටි කාරක සභික නොවන මන්ත්‍රීන්**
ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු කරුණාරත්න පරණවිතාන මහතා
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු එස්. වියාලේන්දිරන් මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා
ගරු ඊ. සරවනපවන් මහතා
ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
ගරු සුජිත් සංජය පෙරේරා මහතා

**නිවාඩු පිළිබඳ යෝජනා**
ගරු සිරිපාල ගමලත් මහතා

## 1. කාර්ය සටහන්වලින් පැන නඟින කරුණු :-

### 1.1 ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවට සිදුවූ මූල්‍යමය පාඩු

මේ සම්බන්ධයෙන් අදාළ ආයතන සමඟ සාකච්ඡා කළ නමුත් මේ දක්වා මුදල් අය කරගත නොහැකි වූ බව රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ සභාපතිවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

රුපියල් මිලියන 109 ක් අය කරගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට නියමිත බව ඔහු විසින් තවදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මීට ඉහතදී ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට ජනාධිපති ලේකම් කාර්යාලය, සෞම්‍යමූර්ති තොන්ඩමන් අනුස්මරණ පදනම සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය යන ආයතන ඇතුළත් වූ බවත්, කැබිනට් මණ්ඩලයේ උපදෙස් පරිදි එම ආයතන සමඟ සාකච්ඡා කිරීමට උත්සාහ කළද, එය අසාර්ථක වූ බව අධ්‍යක්ෂ ඉන්දිකා රණතුංග මහත්මිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කඩිනම් පියවර ගැනීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ සභාපතිවරයාට දැනුම් දෙන ලදී.

### 1.2 මධ්‍යම පළාතේ පේෂකර්ම කර්මාන්තය යළි නඟා සිටුවීමට කටයුතු කිරීම

මෙම කරුණට අදාළ වාර්තාව අදාළ අංශ වෙත ඉදිරිපත් කර ඇති බව පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.3 සමූපකාර ඡන්ද පැවැත්වීමේදී ඇතිවූ දූෂණ හා වංචා

පළාත් කොමසාරිස්වරුන්ට සමූපකාර ඡන්ද පැවැත්වීමේදී විනිවිදභාවයෙන් කටයුතු කරන ලෙස ලිඛිතව දැනුම් දී ඇති බව අතිරේක ලේකම්වරයා (සමූපකාර සංවර්ධන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පාර්ලිමේන්තු අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී පැන නඟින ලද කරුණු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන ඇති බවට කරන ලද දැනුම්

දීමකදී අදාළ ආයතන ප්‍රධානියාගේ අත්සනින් යුතුව කරුණුවලට අදාළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

## 1.4 සතොස ආයතන විවෘත කිරීමේදී පැන නඟින ගැටළු

අළුතින් සතොස ආයතන 10 ක් විවෘත කළ අතර උත්සව සමයට පෙර තවත් 06 ක් විවෘත කිරීමට නියමිත බව සතොස ආයතනයේ සභාපතිවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී. එමෙන්ම වතුකර ප්‍රදේශයන්හි උත්සව සමය තුළ ජංගම සතොස සේවයක් ක්‍රියාත්මක කරන බවටත් ඔහු විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ගොඩනැගිලි කුලියට ගැනීමෙන් පසු විවෘත කිරීමට නියමිත ආයතන 16 ක් ඇති බව සතොස සභාපතිවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී. ඉතා ඉක්මනින් එම කටයුතු අවසන් කිරීමට කටයුතු කර අමාත්‍යාංශයට දන්වන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

උත්සව සමය තුළ අළුතින් සතොස ආයතන විවෘත කිරීම පිළිබඳ වැඩි අවධානය යොමු කර ඇති බැවින් අගලවත්ත ප්‍රදේශයේ සතොස ආයතන විවෘත කිරීමට පෙර සිදු කළ යුතු වෙළඳපළ සමීක්ෂණය ගැන ඉන් පසුව අවධානය යොමු කරන බව සතොස සභාපතිවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තවලම ප්‍රදේශයේ අළුතින් සතොස ආයතන පිහිටුවීම සම්බන්ධයෙන් යම් ගැටළුකාරී තත්ත්වයක් සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයා වෙත යොමු කර ඇති බව සතොස සභාපතිවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මධ්‍යම පළාතේ පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවට අයත් එහෙත් වාර්තා වී නොමැති රත්ගම, වටවල හා ගිනිගත්හේන සහ තවත් ප්‍රදේශයන්හි දේපළ ද අනවසර අත්කරගැනීමට ලක්ව ඇති බවත්, ඒ පිළිබඳව කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු බවටත් ගරු කේ.කේ. පියදාස මහතා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

අදාළ විස්තර කඩිනමින් ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් පේෂකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට උපදෙස් ලබා දෙන ලදී.

සළුසල ආයතනයට පවරාගත් මහනුවර දිස්ත්‍රික්කයේ ගලගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇඟළුම් කම්හලක් පවත්වන ලද ඉඩම පවරාගත්තක් වන අතර, පෞද්ගලික ආයෝජකයකු විසින් කිසිදු ගෙවීමකින් තොරව එය පරිහරණය කරනු ලබන බව සළුසල සභාපතිවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී. කුලී මුදලක් ගෙවන ලෙස කළ ඉල්ලීම්වලට ඔහු එකඟ නොවූ බවද සළුසල සභාපතිවරයා තවදුරටත් දැනුම් දෙන ලදී.

### 1.5 මධ්‍යම පළාතේ ජේෂකර්ම කර්මාන්තය සම්බන්ධ කරුණු

මධ්‍යම පළාතේ කර්මාන්ත අමාත්‍යාංශය විසින් රෙදි විවීමේ කම්හලක් පවත්වාගෙන යාම සඳහා එම දේපළ ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බව සළුසල සභාපතිවරයා විසින් තවදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව සුදුසු වැඩපිළිවෙලක් සඳහා එය යොදාගත හැකි බවත්, මුදල් ගෙවා ලබාගත් දේපළක් බැවින් ප්‍රාදේශීය ලේකම්වරයාට එය වෙනත් පාර්ශවයකට පැවරිය නොහැකි බවත් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරිය විසින් ප්‍රකාශ කරන ලදී.

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ තීරණය පරිදි අමාත්‍ය මණ්ඩල ලේකම් සමඟ සාකච්ඡා කිරීමෙන් සුදුසු තීරණයක් ගෙන කටයුතු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම්වරයාට උපදෙස් ලබා දෙන ලදී. එසේම අදාළ ආයතනයෙන් ව්‍යාපාරික සැලසුමක් (Business Plan) ලබාගන්නා ලෙස ද උපදෙස් ලබා දෙන ලදී.

### 1.6 පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවීන් පිරිසකට සිදුවූ අසාධාරණය - ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

පාරිභෝගික සේවා අධිකාරියේ මැදිහත්වීම මඟින් එම අසාධාරණයට යම් ක්‍රියාමාර්ගයක් ගැනීම පිළිබඳව ගරු සභාපතිතුමා විසින් කරුණු දක්වන ලදී.

මේ සම්බන්ධයෙන් පාරිභෝගික සේවා අධිකාරියේ නිලධාරීන් මැදිහත්වී ඇති නමුත්, මේවනතුරු ගොවීන්ගේ ප්‍රශ්නය සඳහා සාධාරණ විසඳුමක් ලැබී නොමැති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී. උපකරණ මිළදීගත් සමාගමේ පිළිතුර ලැබීමට නියමිත බැවින් ඒ අනුව ගොවීන්ට සහනයක් සැලසීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.7 ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට වෙන්කර ඇති බිලියනයක ප්‍රතිපාදන

අළුතින් කර්මාන්ත පුරයක් ආරම්භ කිරීමේදී ඉඩම් හඳුනාගෙන මිනින්දෝරු සැලසුම් සහ ඇස්තමේන්තු සැකසීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයාට උපදෙස් ලබා දෙන ලදී.

එසේම අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන්නේ නම් අදාළ අමාත්‍යාංශවල ලේකම්වරුන් සමඟ සාකච්ඡා කර සුදුසු පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්වරයාට තවදුරටත් උපදෙස් ලබා දෙන ලදී.

## 2. වෙනත් කටයුතු:

### 2.1 කර්මාන්ත ප්‍රතිපත්ති පුළුල් කිරීමේ කටයුතු කඩිනම් කිරීම - ගරු බුද්ධික පතිරණ මහතා

කර්මාන්ත ප්‍රතිපත්ති සම්පාදනය හා නීතිගත කිරීම, සමූපකාර පනත සංශෝධනය සහ තොරතුරු කවුළුවක් ඇති කිරීම තුළින් කර්මාන්ත ප්‍රතිපත්තිය පුළුල් කිරීමට කටයුතු අවශ්‍යතාවයක් ඇති බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ වනවිටත් උපදේශන කමිටු 17ක් පවතින බවත්, ඒවා නැවත ශක්තිමත් කළයුතු බවත් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී. කර්මාන්ත ප්‍රතිපත්ති සම්පාදනයන්හිදී ආංශික කර්මාන්ත ප්‍රතිපත්ති සම්පාදනය වඩා ඵලදායී වන බවද අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එසේම කර්මාන්ත උපදේශන කමිටු සංශෝධනය කිරීමේ කටයුතු ඉදිරියේදී අවසන් කළ හැකි බව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙම කරුණ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් පිළියෙල කිරීම සහ විශේෂ කමිටුවක් මගින් අධ්‍යයනය කිරීම අවශ්‍ය බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ අනුව නියෝජ්‍ය අමාත්‍යවරයාගේ සභාපතීත්වයෙන් හා අදාළ අමාත්‍යාංශවල නියෝජනයෙන් විශේෂ කමිටුවක් පත්කර නිර්දේශ ලබාදීමට ඉල්ලීමක් කළ යුතු බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

නිපුණතා සංවර්ධන අධ්‍යයන හා කර්මාන්ත ක්ෂේත්‍රයන් සම්බන්ධ කිරීම ඉතා අවශ්‍ය කටයුත්තක් වන බව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙය ක්‍රියාත්මක කළ හැකි ආකාරය පිළිබඳ දළ සැලසුමක් සති දෙකක් ඇතුළත සකස් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

### 2.2 සමූපකාර පනත සංශෝධනය කිරීම.

සමූපකාර පනත සංශෝධනය සඳහා අමාත්‍යාංශයට වාර්තාවක් ද අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පතක් ද ඉදිරිපත් කර ඇති බව සමූපකාර කොමසාරිස්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අදාළ ලේඛන නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට කඩිනමින් යොමු කරන ලෙස ගරු නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් උපදෙස් ලබා දෙන ලදී.

සමූපකාර ඡන්ද පැවැත්වීමේ නිවැරදි ක්‍රමවේදය නව පනතට ඇතුළත් විය යුතු බව ගරු කේ.කේ. පියදාස මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සමූපකාර සමිතිවල වාර්ෂික වාර්තා රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය වැඩකටයුතු කළයුතු බව ගරු නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නියෝජ්‍ය අමාත්‍යවරයාගේ සභාපතිත්වයෙන් කමිටුවක් පත් කරන බවද එහි වාර්තාව කඩිනමින් ඉදිරිපත් කළ යුතු බවද ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

එසේම, පනතෙහි සංශෝධනයන් සඳහා සමූපකාර ඡන්ද පවත්වන විධිමත් ක්‍රමවේදයක් හඳුන්වාදිය යුතු බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සමූපකාර සමිතිවල අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීමේදී සමහර පළාත්වල ඡන්දයෙන් පත්වන අයට පරිබාහිර පුද්ගලයන් නම් කරන බව ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කර්මාන්තයක් ඇරඹීමේදී Single Window ක්‍රමය හඳුන්වාදීම සඳහා අදාළ සියළුම ආයතන සමඟ සාකච්ඡා කිරීමට අදහස් කරන බව අතිරේක ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලයේ ප්‍රධාන මණ්ඩල තුනෙන් නියෝජිතයන් දෙදෙනා බැගින් පත්කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

ව්‍යාපාරික නාමාවලියක් (Business Registry) සැකසීම සඳහා මුදල් වෙන් වී ඇති බැවින් අමාත්‍යාංශයේ නිලධාරීන් යොදවා එම කටයුතුද කඩිනම් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

**2.3 ජාත්‍යන්තර සමූපකාර දින සැමරීමේ උත්සව කටයුතු - ගරු බුද්ධික පතිරණ මහතා**

2019 ජූලි 07 වන දින දකුණු පළාතේ සනත් ජයසූරිය ක්‍රීඩාංගණයේදී සමූපකාර ජාත්‍යන්තර දින සැමරුම් උත්සවය පැවැත්වීමට කටයුතු පිළියෙල කරමින් සිටින බව සමූපකාර කොමසාරිස්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.4 බදාදා දින සියලුම නිලධාරීන් කාර්යාලයේ රැඳී සිටීම.**

නිලධාරීන් වෙනත් රාජකාරි නිසා කාර්යාලයේ නොසිටින අවස්ථාවල මහජනතාවගේ සේවා අවශ්‍යතා සඳහා විකල්ප නිළධාරියෙකු නම් කර සම්බන්ධීකරණය භාරදෙන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

විදේශීය නිවාඩු ලබාගැනීමේදී විදේශගතවීමට පෙර අනුමැතිය ලබාගැනීම චක්‍රලේඛය අනුව අතවශ්‍ය කරුණක් බැවින් ප්‍රමාණවත් කාලයත් තුළ නිවාඩු අයදුම් කරන ලෙස අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඉල්ලීමක් කරන ලදී.

**2.5 කිරාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පුදුකුඩිඉරුප්පු, වාලච්චේන ප්‍රදේශයේ සංවර්ධන කටයුතු - ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා**

කිරාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වාලච්චේන, වෙන්කලඩි සහ සන්දිවේලි යන ප්‍රදේශ ආවරණය වන ලෙස සතොස ආයතනයක් අළුතින් ස්ථාපිත කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

වර්ග අඩි 3000 ක ඉඩ ප්‍රමාණය ඇති ස්ථානයක් ලබා දෙන්නේ නම් ආරයම්පති සහ කිරාන් ප්‍රදේශවල සතොස ආයතන එක බැගින් පිහිටුවීම සඳහා පියවර ගැනීමට හැකි බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

කුඹුරුමුල්ල යන ස්ථානයේ මුද්‍රණාලයක් පිහිටා තිබූ ගොඩනැගිල්ල සහ දේවපුරම් යන ස්ථානයේ පිහිටා තිබූ හාල් මෝල යුධ සමයේ දී විනාශයට පත්වී ඇති බැවින් එම ස්ථානවලම ඒවා නැවතත් පිහිටුවීම සඳහා කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

සිත්තාන්ඩි යන ස්ථානයේ කිරි කර්මාන්ත ශාලාවක් පිහිටුවීම සඳහා උපකාර කිරීමට කෘෂිකර්ම අමාත්‍යතුමා එකඟතාවය පලකර තිබෙන අතර ඒ සඳහා සහයෝගය ලබා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

කලුවග්කේනි ප්‍රදේශයේ ටින් මාළු කර්මාන්ත ශාලාවක් පිහිටුවීම සඳහා උපකාර කිරීමට අමාත්‍යතුමා එකඟතාවය පලකර තිබෙන අතර ඒ සඳහා සහයෝගය ලබාදෙන මෙන්ද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

කිරාන් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් කුලාවඩි ප්‍රදේශයේ හාල් මෝලක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රදේශිය ලේකම් මඟින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බැවින් ඒ සම්බන්ධයෙන් සහයෝගය ලබාදෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

බදුල්ල පාරේ සහ කදිරවේලි ප්‍රදේශයේ පෙර උළු කර්මාන්ත ශාලා දෙකක් පිහිටා තිබුන බවත් උළු කර්මාන්තය අළුතින් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ඉඩම් ලබාදීමේ හැකියාව තිබෙන අතර පුහුණු ශ්‍රමිකයින් එම ප්‍රදේශයෙන්ම ලබාගැනීමේ හැකියාව පවතින බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කදිරවේලි - වාකරෙයි සහ ඊරාවූර්පත්තු- ඉලුප්පඩිච්චේනයි යන ස්ථානවල උළු කර්මාන්තශාලා අළුතින් පිහිටුවීමට අවශ්‍ය පහසුකම් සලසා දෙන ලෙස ද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

වාකරෙයි, වාලච්චේන, කිරාන්, කොක්අඩිචෝලෙයි, වෙල්ලාවෙලි සහ වවුනතිව් යන ස්ථානවල පිහිටා ඇති සමූපකාර සමිතිවල සම්පත් ඌනතාවයක් පවතින බැවින් ඒවා සංවර්ධනය කිරීමට කටයුතු කරන මෙන් ඔහු විසින් ඉල්ලීමක් කරන ලදී.

අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් සමූපකාර කොමසාරිස්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

## 2.6 අමාත්‍යාංශයට අයත් ඉඩම

කොළඹ 13, කොටහේන, ශ්‍රී ගුණානන්ද පාර, අංක 05 ලිපිනයෙහි අමාත්‍යාංශයට අයත් පර්චස් 13ක ඉඩම අමාත්‍යාංශයට අයිති නොමැති බවත් බස්නාහිර පළාතේ සමූපකාර අමාත්‍යාංශයට අයිති බවත් සමූපකාර කොමසාරිස්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.7 ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු අධිකාරිය සහ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය - ගරු චන්දිම වීරක්කොඩි මහතා

### 2.7.1 ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු අධිකාරියට (NAITA) බඳවාගත් 24 දෙනෙකුගේ රැකියා අහිමි කිරීම

නියමිත බඳවා ගැනීමේ පටිපාටියට අනුව කොන්ත්‍රාත් පදනම මත NAITA ආයතනයට බඳවා ගත් සේවකයන් 24 දෙනෙකු සේවයෙන් ස්ථිර නොකර රැකියාවෙන් ඉවත් කිරීමට කටයුතු කර ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම සේවකයන්ගේ කොන්ත්‍රාත් කාලය මාස 03කින් දීර්ඝ කර ඇති අතර, මූල්‍යමය අර්බුද හේතුවෙන් ස්ථිර කිරීමේ ගැටළුවක් පැන නැඟී ඇති බව ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු අධිකාරියේ සභාපතිවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ පිළිබඳව විමසීමක් කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.7.2 ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මඟින් පවත්වාගෙන යන පුහුණු පාඨමාලා

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට අයත් සංචාරක පුහුණු පාසැල් ගණනාවක කළමනාකරණ කටයුතු සඳහා සංචාරක ක්ෂේත්‍රය පිළිබඳ දැනුමැති අය බඳවාගෙන නොමැති බවත්, කොන්ත්‍රාත් ක්‍රමයට බඳවාගත් අය පමණක් සිටින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී. කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාවට අනුමැතිය ලබා ගෙන ක්ෂේත්‍රය පිළිබඳ දැනුමැති අයෙකු බඳවා ගැනීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සේවක සංඛ්‍යාව අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බැවින් එතෙක් වෘත්තීය විශේෂඥයෙකු බඳවාගත නොහැකි බව ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සභාපතිවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සුදුසු ආකාරයකින් විශේෂඥයෙකුගේ සේවය වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයට ලබාදීමට කටයුතු කරන බව ගරු නියෝජ්‍ය අමාත්‍ය කරුණාරත්න පරණවිතාන මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.8 රයිගම්පුර කාර්මික අධි කලාපයේ සංවර්ධන කටයුතු සහ වෙනත් කරුණු - ගරු අජිත් පී. පෙරේරා මහතා

### 2.8.1 රයිගම්පුර කාර්මික අධි කලාපයේ සංවර්ධන කටයුතු

කළුතර දිස්ත්‍රික්කයට අයත් රයිගම්පුර කාර්මික අධි කලාපය සම්බන්ධ භූමියට අවශ්‍ය පරිපාලන අනුමැතිය ලබාගන්නා තෙක් කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද නොකර එහි මුල් අක්කර 25 ට අදාළ සියලු කටයුතු සමාන්තරව කඩිනමින් ආරම්භ කරන ලෙස ගරු අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

ආයෝජකයන්ට තම කටයුතු ආරම්භ කිරීම පිණිස භූමිය හැකි ඉක්මණින් සුදුසු ආකාරයකට බෙදා දෙන ලෙස ගරු අමාත්‍යතුමා විසින් තවදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඉඩම කොටස් කර ආයෝජනයේ ප්‍රමාණය අනුව ඉඩම් කොටස් එකක් හෝ කිහිපයක් ලබාදීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඉඩම ලබාගෙන සංවර්ධනය නොකර තබාගත නොහැකි බව, ඉඩම වෙනස් කළ නොහැකි බව, වෙනත් අයෙකුට විකිණිය නොහැකි බව හා මාස 03-06 අතර කාලයක් තුළ ආයෝජන කටයුතු ආරම්භ කළයුතු බව යන කොන්දේසි සහිතව ඉඩම් කොටස් ලබාදීමට කඩිනමින් කටයුතු කරන ලෙස ගරු සභාපතිවරයා විසින් අධ්‍යක්ෂ (කර්මාන්ත සංවර්ධන) වෙත උපදෙස් ලබා දෙන ලදී.

### 2.8.2 හොරණ ඉංගිරිය ප්‍රදේශයේ තොරතුරු තාක්ෂණ උද්‍යානයක් (IT Park ) ඉදිකිරීම

මේ සඳහා ප්‍රථමයෙන්ම සංකල්ප පත්‍රයක් (Concept Paper) සැකසිය යුතු බවත් ඊට පදිංචියට සුදුසු ස්ථාන, ක්‍රීඩාගාර, සිනමාශාලා, බීමහල් සහ හොඳ පරිසරයක් නිර්මාණය කිරීම සම්බන්ධ තොරතුරු ඇතුළත් විය යුතු බවත් ගරු අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සඳහා සංකල්ප පත්‍රයක් (Concept Paper) මෙතෙක් සකසා නොමැති බව අතිරේක ලේකම් (කාර්මික සංවර්ධන) බාලසුබ්‍රමනියම් මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එය මෙතෙක් සකස් කර නොමැති බැවින් පූර්ණ සහාය ලබාදීමට තමා සූදානම් බව ගරු අමාත්‍යතුමා විසින් වැඩිදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තාක්ෂණවේදය පිළිබඳ වෙනම අංශයක් විශ්ව විද්‍යාලය තුළ පවතින බැවින් ඒ සඳහා උපරිම සහය ලබාදිය හැකි බව වෘත්තීය තාක්ෂණවේදය පිළිබඳ විශ්ව විද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ජී.එල්.ඩී. වික්‍රමසිංහ විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ගරු අජිත් පී.පෙරේරා මහතාගේ සභාපතිත්වයෙන් ගරු බුද්ධික පතිරණ මහතා, අමාත්‍යාංශ ලේකම්, අතිරේක ලේකම් (කර්මාන්ත සංවර්ධන) හා අමාත්‍යාංශ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් මේ පිළිබඳව සාකච්ඡා කර සංකල්ප පත්‍රය (Concept Paper) සැකසීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

### 2.8.3 තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ අපනයන - ගරු අජිත් පී.පෙරේරා මහතා

දැනට විදේශ විනිමය උපයන කර්මාන්තවලින් හතරවන ස්ථානය හිමිකරගෙන ඇති තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ අපනයනවලට පුහුණු ශ්‍රමිකයන් හිඟවීම ප්‍රධාන ගැටළුවක්ව පවතින බවත් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති පුහුණු ආයතන මගින් මෙම කාර්යය වඩාත් පහසුවෙන් කළ හැකි බවත් ගරු අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සඳහා කාර්මික විද්‍යාල මඟින් පවත්වන තොරතුරු තාක්ෂණවේදය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාධාරීන් (HNDIT) සංඛ්‍යාව වැඩි කළයුතු බවත්, ඔවුනට උපාධිය දක්වා ඉගෙනීමට පහසුකම් සැපයිය යුතු බවත්, ගරු අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තොරතුරු තාක්ෂණවේදය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා (HNDIT) පාඨමාලාව හදාරා නිමකර ඇති ශිෂ්‍යයන්ට ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයේ පුහුණුවීම සඳහා කටයුතු සලසා දීමට සහය වන ලෙස ගරු සභාපතිතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

තොරතුරු තාක්ෂණවේදී උපාධිධාරීන්ට පෞද්ගලික අංශය තුළ විශාල රැකියා වෙළඳපලක් පවතින බැවින් එම ක්ෂේත්‍රය ශක්තිමත් කළයුතු බව ගරු අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තොරතුරු තාක්ෂණ උද්‍යානය (IT Park) සම්බන්ධයෙන් සාකච්ඡා කරන දිනයේදීම මේ පිළිබඳවද සාකච්ඡා කරන ලෙසත්, එහිදී මේ කාර්යයට සම්බන්ධ කරගතයුතු ආයතන කවරේද යන්න පිළිබඳව සාකච්ඡා කරන ලෙසත් ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

කාර්මික විද්‍යාලේ තාක්ෂණවේද අංශයට සම්බන්ධ ඉහළ නිලධාරියෙක් ද අවශ්‍ය නම් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ හා ජාතික අධ්‍යනිකත්ව

හා කර්මාන්ත පුහුණු අධිකාරියේ නිලධාරීන්ද මීට සම්බන්ධ කරගන්නා ලෙසටත් ගරු සභාපතිතුමා විසින් තවදුරටත් උපදෙස් ලබා දෙන ලදී.

### 2.9 ඉංජිනේරු තාක්ෂණ ආයතනයක් පිහිටුවීම සහ සමූපකාර සමිතියක අක්‍රමිකතා තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ අපනයන - ගරු චන්දිම වීරක්කොඩි මහතා

#### 2.9.1 ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ නව ශාඛාවක් ගාල්ල - ඉමදූවේ ආරම්භ කිරීම

ඉංජිනේරු තාක්ෂණ ආයතනයක් පිහිටුවීමේ කටයුතු කඩිනම් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

#### 2.9.2 හබරාදූව සමුපකාර සමිතියේ අක්‍රමිකතා

හබරාදූව සමූපකාර සමිතිය මඟින් ප්‍රදේශවාසීන්ගේ තැන්පතු මුදල් ආපසු නොගෙවීම සම්බන්ධ ගැටළුවක් පැන නැඟී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පළාත් සභාව යටතේ පාලනය වන සමූපකාර සමිති සඳහා මධ්‍යම රජය මඟින් මතයක් පමණක් ලබා දෙන බව සමූපකාර කොමසාරිස්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම මහජනතාව විසින් පත්ක ළ අධ්‍යක්ෂ මණ්ඩලයක් ඉවත් කිරීමේ බලතල පළාත් සමූපකාර කොමසාරිස්වරයාට නොමැති බැවින් ඊට පිළියමක් ලෙස ක්ෂුද්‍ර මූල්‍ය පනතක් අනුමත කර ගැනීම සඳහා කැබිනට් මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කර ඇති බවත්, එතෙක් ඔවුනට නඩු පැවරීමට කටයුතු කර ඇති බව සමූපකාර කොමසාරිස් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

සමූපකාර පනතට සංශෝධන ඇත්නම් ලිඛිතව අමාත්‍යාංශ ලේකම්වරයාට ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු හෙක්ටර් අප්පුහාමි මහතාට දැනුම් දෙන ලදී.

### 2.10 සමූපකාර සමිතිවල නිපයුම් කටයුතු සඳහා සමෘද්ධිලාභීන් සම්බන්ධ කර ගැනීම - ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

සමූපකාර සමිතිවල නිපයුම් සඳහා ස්වයං රැකියාලාභීන් ලෙස සමෘද්ධිලාභීන් සම්බන්ධ කරගන්නා ලෙසට ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ පිළිබඳ අවධානය යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සමූපකාර කොමසාරිස්වරයා වෙත දැනුම් දෙන ලදී.

## 3. පාරිභෝගික සේවා අධිකාරී පනත

පාරිභෝගික සේවා අධිකාරී පනත සංශෝධනය කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් පාරිභෝගික

සේවා අධිකාරියේ අධ්‍යක්ෂවරියට (නීති බලගැන්වීම්) උපදෙස් ලබා දෙන ලදී.

**4. කල් තැබීම**

කාරක සභාව පස්වරු 12.30 ට 2019.05.09 දින පෙරවරු 11.00 දක්වා කල් තබන ලදී.

----------------------------

**කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන හා වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව තෙවැනි රැස්වීම - 2019 මැයි 09**

**පැමිණ සිටි කාරක සභික මන්ත්‍රීන්**

ගරු ගරු රිෂාඩ් බදියුදීන් මහතා (සභාපති)
ගරු කරුණාරත්න පරණවිතාන මහතා
ගරු බුද්ධික පතිරණ මහතා
ගරු ඒ. ඩී. ප්‍රේමදාස මහතා
ගරු කේ. කේ. පියදාස මහතා
ගරු එස්. ශ්‍රීතරන් මහතා

**පැමිණ සිටි කාරක සභික නොවන මන්ත්‍රීන්**

ගරු ලකී ජයවර්ධන මහතා
ගරු ජේ.සී. අලවතුවල මහතා
ගරු මහින්ද අමරවීර මහතා
ගරු පියංකර ජයරත්න මහතා
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා
ගරු මයන්ත දිසානායක මහතා
ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය
ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
ගරු මුහම්මදු නසීර් මහතා

**නිවාඩු පිළිබඳ යෝජනා**

ගරු සිරිපාල ගමලත් මහතා

**1. කාර්ය සටහන්වලින් පැන නඟින කරුණු :-**

**1.1 ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවට සිදුවූ මූල්‍යමය පාඩු**

කැබිනට් පත්‍රිකාව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඇති බව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම්දෙන ලදී.

**1.2 සතොස ශාඛා අලෙවිසැල් විවෘත කිරීමේදී පැන නඟින ගැටළු**

ගොඩනැගිලි කුලිය ගෙවා මෙතෙක් විවෘත නොවූ සතොස ශාඛා හය සති දෙකක් ඇතුළත විවෘත කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සතොස ප්‍රධාන විධායක නිලධාරිවරයාට තවදුරටත් දැනුම් දෙන ලදී.

සියලුම ප්‍රදේශ ආවරණය වන පරිදි සතොස ශාඛා අලෙවිසැල් 500 ක් දක්වා විවෘත කිරීමේ වැඩපිළිවෙල සාර්ථක කරගැනීමට මෙම වසරේ දෙසැම්බර් දක්වා ඉලක්කගත වැඩපිළිවෙලක් සකසා එය ඊළඟ රැස්වීමට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසද ගරු සභාපතිතුමා විසින් සතොස ප්‍රධාන විධායක නිලධාරිවරයාට දැනුම් දෙන ලදී.

**1.3 සමූපකාර පනත සංශෝධනය කිරීම**

මේ සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශය භාරදී ඇති බව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.4 ජාත්‍යන්තර සමූපකාර දින සැමරීමේ උත්සව කටයුතු වල ප්‍රගතිය - ගරු බුද්ධික පතිරණ මහතා**

ජාත්‍යන්තර සමූපකාර දින සැමරුම් කටයුතු බාධාවකින් තොරව කරගෙන යාමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

ඉදිරි උපදේශක කාරක සභා රැස්වීම්වලට පළාත් සමූපකාර කොමසාරිස්වරු කැඳවීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

**1.5 කොළඹ 13, කොටහේන ශ්‍රී ගුණානන්ද පාර, අංක 05 ලිපිනයෙහි ඇති ඉඩම - ගරු බුද්ධික පතිරණ මහතා**

බස්නාහිර පළාත් සමූපකාර දෙපාර්තමේන්තුවට අයත් මෙම ඉඩම සඳහා මිළ ගණන් කැඳවා ඇති අතර එම කටයුතු නිම කර නොමැති බව සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් (රේඛීය) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.6 රයිගම්පුර කාර්මික අධි කලාපයේ සංවර්ධන කටයුතු - ගරු අජිත් පී. පෙරේරා මහතා**

ඉඩම් මැනුම් කටයුතු සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට යොමු කර ඇති බව අධ්‍යක්ෂ (කර්මාන්ත සංවර්ධන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.7 හොරණ ඉංගිරිය ප්‍රදේශයේ තොරතුරු තාක්ෂණ උද්‍යානයක් (IT Park) ඉදිකිරීම - ගරු අජිත් පී. පෙරේරා මහතා**

මේ දිනවල සංකල්ප පත්‍රය පිළියෙල කිරීමේ කටයුතු සිදුවෙමින් පවතින බව අධ්‍යක්ෂ (කර්මාන්ත සංවර්ධන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.8 තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ අපනයන ප්‍රධාන විදේශ විනිමය මූලාශ්‍රයක් වන බව - ගරු අජිත් පී.පෙරේරා මහතා**

මේ පිළිබඳව වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.9 පාරිභෝගික සේවා අධිකාරී පනත සංශෝධනය කිරීම.**

මෙය නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යොමු කර ඇති බව පාරිභෝගික සේවා අධිකාරියේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.10 ගාල්ල, ඉමදූවේ ඉංජිනේරු තාක්ෂණ ආයතනයක් (IET) අළුතින් ආරම්භ කිරීමේ කටයුතු කඩිනම් කිරීම - ගරු චන්දිම වීරක්කොඩි මහතා**

ගාල්ල, ඉමදූව අධිවේගී මාර්ගයට ආසන්නයේ ඇති අක්කර 21ක භූමි භාගය ඉංජිනේරු තාක්ෂණ ආයතනයක් ඉදිකිරීම සඳහා යොදා ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ ගැන අවශ්‍ය කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**1.11 පේෂකර්ම දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් - ගරු කේ.කේ. පියදාස මහතා**

වාර්තාවට ඇතුළත් නොවූ පේෂකර්ම දෙපාර්තමේන්තුවට අයිති තවත් ඉඩම් ඇති බවත් ඒවා බාහිර පුද්ගලයින් විසින් තම පරිහරණය සඳහා යොදාගෙන ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අදාළ ප්‍රාදේශීය ලේකම්වරයාට සහ දිස්ත්‍රික් ලේකම්වරයාට ලිඛිත ඉල්ලීමක් කර ඉඩම් හඳුනාගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්වරයාට දැනුම් දෙන ලදී.

**1.12 මහනුවර ගලගෙදර සළුසල ඉඩම අමාත්‍යාංශයට පවරා ගැනීම - ගරු බුද්ධික පතිරණ මහතා**

පෞද්ගලික ආයෝජකයෙක් විසින් කුලී ගෙවීමකින් තොරව පරිහරණය කරනු ලබන මහනුවර ගලගෙදර සළුසල ආයතනයට අයත් ඉඩම නැවත සළුසලට පවරා ගැනීම සඳහා ගෙන ඇති පියවර සම්බන්ධයෙන් ගරු

කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් විමසීමක් කරන ලදී.

එම ඉඩම අමාත්‍යාංශයට පවරා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සන්දේශයක් පිළියෙල කර ඇති බව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2. වෙනත් කටයුතු:**

**2.1 සතොස ශාඛා අලෙවිසැල්හි ව්‍යාපාරික ප්‍රගතිය - ගරු මහින්ද අමරවීර මහතා**

සතොස ශාඛාවන්හි වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා අත්‍යවශ්‍ය භාණ්ඩවල මිළ අඩු කිරීම තුළින් වෙළඳාම ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සඳහා සියළුම රූපවාහිනී නාලිකා හරහා ප්‍රචාරණ වැඩපිළිවෙලක් දියත් කිරීමට කටයුතු කරන ලෙසටත් ඒ සඳහා සැපයුම්කරුවන්ගේ ආධාර ලබාගන්නා ලෙසටත් ගරු සභාපතිතුමා විසින් සතොස ප්‍රධාන විධායක නිලධාරීවරයාට දැනුම් දෙන ලදී.

**2.2 සතොස ආයතනවල පවිත්‍රතාවය - ගරු කේ.කේ.පියදාස මහතා**

සියලුම සතොස ශාඛා අලෙවිසැල් පිරිසිදුව හා ක්‍රමවත්ව තබා ගැනීමෙන් වැඩි පාරිභෝගික ආකර්ශනයක් ලබාගත හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ පිළිබඳව සියලුම ප්‍රාදේශීය කළමණාකරුවන් දැනුවත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ප්‍රධාන විධායක නිලධාරීවරයාට දැනුම් දෙන ලදී.

**2.3 මහනුවර දිස්ත්‍රික්කයේ පොත්තපිටිය කර්මාන්තපුරය - ගරු මයන්ත දිසානායක මහතා**

මහනුවර දිස්ත්‍රික්කයේ පොත්තපිටිය කර්මාන්තපුරය ආරම්භ කිරීමේ කටයුතු කඩිනම් කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ පරිපූරක ඇස්තමේන්තුව සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය හා සාකච්ඡා කර සති දෙකක් ඇතුළත පිළිතුරක් එවීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමාට දැනුම් දෙන ලදී.

ඒ සම්බන්ධ වාර්තාවක් ලබන සතිය තුළ ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිවරයා විසින් අමාත්‍යාංශ ලේකම්වරයාට දැනුම් දෙන ලදී.

**2.4 අත්‍යවශ්‍ය භාණ්ඩවල හිඟයක් ඇතිවීමේ අවධානම - ගරු මහින්ද අමරවීර මහතා**

රටේ පවතින නොසන්සුන්කාරී වාතාවරණය තුළ අත්‍යවශ්‍ය භාණ්ඩවල හිඟයක් ඇතිවීමේ අවධානමක් තිබේද යන්න පිළිබඳ ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් විමසීමක් කරන ලදී.

එවැන්නක් මෙතෙක් වාර්තා වී නොමැති බව පාරිභෝගික සේවා අධිකාරියේ සභාපතිවරයා සහ සතොස සභාපතිවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.5 මුදුබත් වූ නැවේ තිබූ ඛනිජ වැලි නැවත ගොඩ ගැනීමේදී පෞද්ගලික ආයෝජකයෙකුට සිදුවූ අසාධාරණය - ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**

ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් මුදුබත් වූ නැවේ තිබූ ඛනිජ වැලි නැවත ගොඩ ගැනීමේදී පෞද්ගලික ආයෝජකයෙකුට වූ අසාධාරණයක් සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නීතිපති දෙපාර්තමේන්තුවද මේ කරුණ සම්බන්ධයෙන් තීරණයක් ලබා දී ඇති බව අධ්‍යක්ෂ (පොදු ව්‍යාපාර) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ පිළිබඳව විමසීමක් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්වරයාට දැනුම් දෙන ලදී.

**2.6 නැගෙනහිර පළාතේ පිහිටා ඇති සමූපකාර සමිති සම්බන්ධයෙන් වූ ගැටලු සාකච්ඡා කිරීම සඳහා දිනයක් ලබාගැනීම - ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා**

නැගෙනහිර පළාතේ පිහිටා ඇති සමූපකාර සමිතිවල නොයෙකුත් අඩුපාඩු පැවතීම හේතුවෙන් එම සමිති අක්‍රිය තත්වයෙන් පවතින බවත් එම කරුණු සම්බන්ධයෙන් මඩකළපුවේදී සාකච්ඡා කිරීම සඳහා අවස්ථාවක් ලබා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

ඉහත ඉල්ලීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා එකඟත්වය පලකරන ලදී.

**2.7 නැගෙනහිර පළාතේ ජීවත්වන කුඩා කර්මාන්තකරුවන්ගේ ජීවනෝපාය නඟාසිටුවීම - ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා**

මෙම පළාතේ ජීවත්වන 500 ක් පමණ වූ කුඩා කර්මාන්තකරුවන්ගේ ජීවනෝපාය නඟාසිටුවීම සඳහා ආධාර කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

ඉහත ඉල්ලීම් සම්බන්ධයෙන් එකඟත්වය පළ කරන ලද ගරු සභාපතිතුමා එම තොරතුරු ඉදිරිපත්කරන ලෙස ගරු මන්ත්‍රීතුමා වෙත දන්වා සිටින ලදී.

**2.8 මුලතිව් දිස්ත්‍රික්කයේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මඟින් ස්ථාපිත අක්‍රිය හාල් මෝල් - ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**

යුධ සමයෙන් පසු නැවත පදිංචි කිරීමේදී ස්ථාපිත හාල් මෝල් නඩත්තු කිරීමට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන සමූපකාර සමිතිවලට නොමැතිවීම නිසා අක්‍රියවී ඇති බව ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සහල් මෝල් නොමැතිවීමෙන් මුලතිව් සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල වී නිෂ්පාදන, වී වශයෙන්ම දකුණු පළාතට ගෙනයෑමෙන් වන්නි පළාතේ ගොවියන්ට ලැබිය යුතු ප්‍රතිලාභ අහිමි වන බව ගරු මන්ත්‍රීතුමිය විසින් දැනුම් දෙන ලදී. හාල් මෝල් නැවත ක්‍රියාත්මක කිරීම ප්‍රසම්පාදන පටිපාටියට අනුව පෞද්ගලික අංශයට ලබා දීම උචිත බවත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්වරයාට උපදෙස් ලබාදෙන ලදී.

**2.9 මුලතිව් දිස්ත්‍රික්කයේ රාජ්‍ය නොවන සංවිධාන මඟින් පිහිටුවන ලද කුඩා කර්මාන්ත සමිති සම්බන්ධ ගැටලු - ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මිය**

මෙම සමිති අක්‍රිය වීම නිසා සාමාජික කාන්තාවන් ප්‍රදේශයේ අමු ද්‍රව්‍යවලින් නිපදවන නිමි භාණ්ඩ විකිණීම පිළිබඳව ගැටලු රාශියකට මුහුණපා සිටින බව ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මන්නාරම, මුලතිව් සහ වවුනියාව යන දිස්ත්‍රික්කවලට අදාළ ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් එහි නිලධාරීන් සමඟ සාකච්ඡා කර සුදුසු පියවරක් ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයා වෙත දැනුම් දෙන ලදී.

**2.10 ජාවත්ත සළුසල ආයතනයට අයත් ඉඩම ආරක්ෂක අංශවලට පවරා ගැනීමට කටයුතු කිරීම - ගරු බුද්ධික පතිරණ මහතා**

ජනාධිපති ආරක්ෂක අංශය විසින් පරිහරණය කරන මෙම ඉඩම ආරක්ෂක අමාත්‍යාංශයට පවරා ගැනීමට නියමිත බව ගරු කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාවට අයත් රාජගිරිය ප්‍රදේශයේ ඇති ඉඩම ද විශේෂ කාර්යය බලකාය විසින් ලබාගෙන ඇති බව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ජනාධිපති ලේකම්ගේ ලිඛිත අවසරය ලබාගෙන එම දේපළවල අලුතින් ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්වරයාට දැනුම් දෙන ලදී.

රාජ්‍ය හා පෞද්ගලික අංශ එකතුවෙන් හවුල් ව්‍යාපෘතියක් (Public Private Partnership) ආරම්භ කිරීමට අපේක්ෂා කරන බව ප්‍රාදේශීය ලේකම්ට දන්වන ලෙස ගරු නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් උපදෙස් දෙන ලදී.

රාජගිරියේ රාජ්‍ය වානිජ නීතිගත සංස්ථාවට අයත් ඉඩම විශේෂ කාර්යය බලකාය විසින් අත්පත් කරගෙන ඇති බැවින් එම ඉඩමද ආපසු ලබාගැනීම සඳහා කටයුතු කළයුතු බව ගරු නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ආරක්ෂක අමාත්‍යාංශයට ඒ බව දැනුම් දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්වරයා දැනුම් දෙන ලදී.

**2.11 හබරාදුව හෝටල් පාසැලක් ඉදිකිරීම සඳහා වෙන් කරන ලද ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයට (NIBM ) අයත් ඉඩම - ගරු චන්දිම වීරක්කොඩි මහතා**

මෙම කාර්යය ක්‍රියාත්මක කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් දෙන ලදී.

**3. කල් තැබීම**

කාරක සභාව පස්වරු 4.40 ට 2019.06.20 දින පෙරවරු 11.00 දක්වා කල් තබන ලදී.

---------------------------

**කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමූපකාර සංවර්ධන හා වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව සිව්වැනි රැස්වීම - 2019 ජූනි 20**

**පැමිණ සිටි කාරක සභික මන්ත්‍රීන්**

ගරු බුද්ධික පතිරණ මහතා (සභාපති)
ගරු කරුණාරත්න පරණවිතාන මහතා
ගරු කේ. කේ. පියදාස මහතා
ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

**පැමිණ සිටි කාරක සභික නොවන මන්ත්‍රීන්**

ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා
ගරු විදුර වික්‍රමනායක මහතා
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු මයන්ත දිසානායක මහතා
ගරු අයි. චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය

**1. කාර්ය සටහන්වලින් පැන නඟින කරුණු**

**1.1 නව සතොස ශාඛා විවෘත කිරීම**

මේ මාසය තුළ විවෘත කිරීමට නියමිත සතොස ශාඛා හතෙහි ලැයිස්තුවක් ගරු මයිල්වාගනම් තිලකරාජා මහතාට ලබා දෙන ලෙස සතොස සාමාන්‍යාධිකාරීවරයාට උපදෙස් ලබා දෙන ලදී.

**1.2 උපදේශක කාරක සභා රැස්වීම්වලට පළාත් සමූපකාර කොමසාරිස්වරු කැඳවීම**

මෙවර කාරක සභා රැස්වීමට සියලුම පළාත් සමූපකාර කොමසාරිස්වරුන් සහභාගි වී ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.3 පාරිභෝගික සේවා අධිකාරී පනත සංශෝධනය කිරීම**

පනත සංශෝධනයට අවශ්‍ය කටයුතු කරන බව අධිකාරියේ සභාපති එල්.එන්. සේනවීර මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.4 ඉමදූවේ ඉංජිනේරු තාක්ෂණ ආයතනයක් (IET) අළුතින් ආරම්භ කිරීම - ගරු චන්දිම වීරක්කොඩි මහතා**

මේ පිළිබඳව වැඩිදුරටත් සාකච්ඡා කර ගරු මන්ත්‍රීතුමා දැනුවත් කිරීමට කටයුතු කරන බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

**1.5 පොත්තපිටිය කර්මාන්තපුරය ආරම්භ කිරීමේ කටයුතු කඩිනම් කිරීම - ගරු මයන්ත දිසානායක මහතා**

යටිනුවර ආසනයේ පොත්තපිටිය ප්‍රදේශයේ කර්මාන්තපුරයක් ආරම්භ කිරීමේ කටයුතුවල ප්‍රගතිය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

කර්මාන්තපුරය සඳහා සකස් වන ව්‍යාපෘති වාර්තාව සහ පුස්සැල්ල වැවිලි සමාගමෙන් ඉඩම් පවරා ගැනීමේ මුදලට අදාළ තක්සේරු වාර්තාව ගැන කාරක සභාවේ අවධානය යොමු කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා මුදල් ලබාදිය හැකි බව අමාත්‍යාංශ ලේකම්වරයා දැනුම් දෙන ලදී.

**1.6 මුදුබත් වූ නැවේ තිබූ ඛනිජ වැලි නැවත ගොඩ ගැනීමේදී පෞද්ගලික ආයෝජකයෙකුට සිදුවූ අසාධාරණය - ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**

නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි නැව හා ඛනිජ වැලි අයිතම දෙකක් ලෙස සලකා කටයුතු කළ යුතු බවත් ඒ අනුව ඛනිජ වැලිවල අයිතිය ඇත්තේ ලංකා ඛනිජ වැලි සංස්ථාවට බවත් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම කරුණ සම්බන්ධයෙන් හැකි ඉක්මණින් තීරණයක් ගැනීමට කටයුතු කරන බව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.7 මුලතිව් දිස්ත්‍රික්කයේ අක්‍රිය තත්ත්වයේ ඇති හාල් මෝල් නැවත ක්‍රියාත්මක කරවීම - ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**

සමූපකාර සමිති අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ගත් තීරණය අනුව සීමාසහිත ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයන්ගේ සමූපකාර සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීමෙන් මෙම හාල්මෝල් ක්‍රියාත්මක තත්ත්වයට පත් කර ගත හැකි බව උතුරු පළාත් සහකාර කොමසාරිස් (සමූපකාර සංවර්ධන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.8 මුලතිව් දිස්ත්‍රික්කයේ රාජ්‍ය නොවන සංවිධාන මගින් පිහිටුවන ලද කුඩා කර්මාන්ත සමිති සම්බන්ධ ගැටලු - ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මිය**

මෙම ගැටළුව සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා දිනයක් ලබා දීමට කටයුතු කරන ලෙස කරන ලදී.

ගරු මන්ත්‍රීතුමියගේ ඉල්ලීම අනුව සාකච්ඡාවක් ඉදිරියේදී පැවැත්විය හැකි බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**1.9 ජාවත්ත සළුසල ආයතනයට හා රාජගිරියේ රාජ්‍ය වානිජ නීතිගත සංස්ථාවට අයත් ඉඩම් - ගරු බුද්ධික පතිරණ මහතා**

මේ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා සමඟ සාකච්ඡා කළ අතර, එම ඉඩම් පොලිස් දෙපාර්තමේන්තුවට ලබාදෙන ලෙස දැනුම් දුන් බව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම ඉඩම ප්‍රාදේශීය ලේකම්වරයා සතු ඉඩමක් බැවින් සම්පූර්ණ ඉඩමට හිමිකම ලබාගැනීමට නොහැකි බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දැනට සළුසල සතු ගොඩනැගිල්ල අයත් භූමිය ලබාගැනීම සඳහා නැවත සාකච්ඡා කිරීමට අපේක්ෂා කරන බව ගරු සභාපතිතුමා විසින් තවදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2. වෙනත් කටයුතු:**

**2.1 සී/ස නැගෙනහිර හේවාගම් කෝරළයේ, විවිධ සේවා සමූපකාර සමිතියේ ග්‍රාමීය බැංකු ශාඛාවන්හි තැන්පත් කරන ලද මුදල් සහ කළුතර දිස්ත්‍රික්කයේ සමූපකාර සමිතිවල ඡන්දය - ගරු විදුර වික්‍රමනායක මහතා**

### 2.1.1 සී/ස නැගෙනහිර හේවාගම් කෝරළයේ, විවිධ සේවා සමූපකාර සමිතියේ ග්‍රාමීය බැංකු ශාඛාවන්හි තැන්පත් කරන ලද මුදල් සම්බන්ධයෙන් සිදුව ඇති අක්‍රමිකතාවය

මෙම කරුණ පිළිබඳව පාර්ලිමේන්තුවේදී වාචික පිළිතුරු අපේක්ෂාවෙන් ප්‍රශ්නයක් අසන ලද බවත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කර ඇති බවත් කාරක සභාවට දැනුම් දෙන ලදී. තවද මෙම ගැටළුව විසඳන ලෙස පාලක මණ්ඩලයට දැනුම් දී ඇති බව ද තවදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.1.2 කළුතර දිස්ත්‍රික්කයේ සමූපකාර සමිතිවල ඡන්දය

කළුතර දිස්ත්‍රික්කයේ සමූපකාර සමිතිවල ඡන්ද පැවැත්වීමේ කටයුතු සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මීට අදාළ පාර්ශවයන් සමග සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු යොදන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම්වරයාට උපදෙස් දෙන ලදී.

## 2.2 නුවරඑළිය දිස්ත්‍රික්කයේ දෙමළ මාධ්‍ය වෘත්තීය පුහුණු පාසැලක් ආරම්භ කිරීමට කටයුතු කිරීම - ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

නුවරඑළිය දිස්ත්‍රික්කයේ තලවකැලේ නගරය කේන්ද්‍ර කරගනිමින් අලුතින් දෙමළ මාධ්‍ය වෘත්තීය පුහුණු පාසැලක් ඇරඹීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 2.3 සමූපකාර පනත සංශෝධනය කිරීම සහ වෙනත් කටයුතු

සමූපකාර පනත සංශෝධනය කිරීම, ග්‍රාමීය බැංකු පිළිබඳ පනත සංශෝධනය කිරීම, ජාතික සමූපකාර ප්‍රතිපත්තිය සම්පාදනය සහ ජාතික කර්මාන්ත ප්‍රතිපත්තියක් සකස් කිරීමට කටයුතු කිරීම යන කටයුතු වල ප්‍රගතිය සමාලෝචනය සඳහා වෙනම කාර්යය මණ්ඩලයක් අනුයුක්ත කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්වරයාට දැනුම් දෙන ලදී.

## 2.4 මන්නාරම දිස්ත්‍රික්කයේ පිහිටි කාර්මික විද්‍යාලයේ පවතින අඩුපාඩු සහ වෙනත් කරුණු - ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

### 2.4.1 මන්නාරම දිස්ත්‍රික්කයේ පිහිටි කාර්මික විද්‍යාලයේ පවතින අඩුපාඩු

මන්නාරම දිස්ත්‍රික්කයේ පිහිටි කාර්මික විද්‍යාලයේ පවතින අඩුපාඩු සම්පූර්ණ කරදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

දුෂ්කරතා සහ අඩුපාඩු රාශියක් පවතින බැවින් ප්‍රතිපාදන ලබා ගෙන සංවර්ධන කටයුතු සිදු කළයුතු බව කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.4.2 මන්නාරම දිස්ත්‍රික්කයේ සිදුවන රාජ්‍ය වාහන අවභාවිතය

මාන්තෙයි ලුනු සංස්ථාවට අනුයුක්තව ඇති වාහන අවභාවිතා කරන බව ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද දැනුම් දීම සම්බන්ධයෙන් විමර්ශනයක් කර එසේ වන්නේ නම් නතර කිරීමට කටයුතු කරන ලෙස ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

## 2.5 මඩකලපුව දිස්ත්‍රික්කයේ සමූපකාර සමිති සහ වෙනත් කරුණු - ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා

### 2.5.1 මඩකලපුව දිස්ත්‍රික්කයේ සමූපකාර සමිති වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කිරීම

මඩකලපු දිස්ත්‍රික්කයේ සමූපකාර සමිති විසින් ඉන්ධන අලෙවිසල් පවත්වාගෙන යාම සඳහා අවසර ඉල්ලා බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නැගෙනහිර පළාතේ සමූපකාර සංගම්වලින් නිසි කාලයට වී මිලදී ගැනීමේ කටයුතු නොකරන බව ද විවිධ සේවා සමූපකාර සමිතිවල ගෘහ භාණ්ඩ සහ පරිගණක උපකරණවල හිඟයක් පවතින බව ද ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එරාවූර් ප්‍රදේශයේ විවිධ සේවා සමූපකාර සමිති සංවර්ධනය කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 2.5.2 වාලච්චේන ජාතික කඩදාසි කම්හල ආරම්භ කිරීමට කටයුතු කිරීම

වාලච්චේන කඩදාසි කම්හල ආරම්භ කරන ලෙසත් එහි වත්මන් සභාපතිවරයා වෙනුවට වෙනත් සුදුසු අයෙකු පත් කරන ලෙසත් ගරු මන්ත්‍රීවරයා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 2.5.3 නව සතොස ශාඛා විවෘත කිරීම

දිස්ත්‍රික්කයේ ස්ථාන තුනක නව සතොස ශාඛා ස්ථාපිත කරන ලෙස ඉල්ලීමක් කරන ලදී.

## 2.6 බෝගහගොඩ සහ ඉමදූව සතොස ශාඛා - ගරු චන්දිම වීරක්කොඩි මහතා

### 2.6.1 බෝගහගොඩ සතොස ශාඛා වෙනත් ස්ථානයකට රැගෙන යාම

බෝගහගොඩ සතොස ශාඛාව පවත්වන ගොඩනැගිල්ල ව්‍යාපාරික කටයුතු සඳහා හොඳම ස්ථානයක් වන බැවින් එම ඉඩම ලබාගෙන ගොඩනැගිල්ලක් ඉදිකර ගැනීම වඩා සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ගොඩනැගිල්ලේ පවතින අවදානම් තත්ත්වය හේතුවෙන් ආයතනය වෙනත් ගොඩනැගිල්ලකට රැගෙන යාමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.6.2 ඉමදූව සතොස ශාඛාවට ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකර ගැනීම**

ඉමදූව සතොස ශාඛාව කුලියට ලබා ගත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යන බැවින් ප්‍රාදේශීය සභාවේ පරණ පොලීසිය පැවති ගොඩනැගිල්ල නවීකරණය කර ලබා ගත හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ පිළිබඳව විමසුමක් කර අවශ්‍ය පියවර ගන්නා බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3. කල් තැබීම**

කාරක සභාව 2019.07.25 දක්වා කල්තබන ලදි.

----------------------------

**අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2019 ජුලි 09**

**පැමිණ සිටි කාරක සභික මන්ත්‍රීන්**
ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (සභාපති)
ගරු විජයකලා මහේස්වරන් මහත්මිය
ගරු විමලවීර දිසානායක මහතා
ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා
ගරු ඉම්රාන් මහරූෆ් මහතා
ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා

**පැමිණ සිටි කාරක සභික නොවන මන්ත්‍රීන්**
ගරු බුද්ධික පතිරණ මහතා,
ගරු පියසේන ගමගේ මහතා
ගරු දයාසිරි ජයසේකර මහතා
ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
ගරු ලසන්ත අලගියවන්න මහතා
ගරු නිහාල් ගලප්පත්ති මහතා
ගරු ෆයිසාල් කාසිම් මහතා
ගරු ඩුලිප් විජේසේකර මහතා
ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
ගරු එස්. ශ්‍රීතරන් මහතා
ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
ගරු හේෂා විතානගේ මහතා
ගරු සන්දිත් සමරසිංහ මහතා

## 1. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා

### 1.1 රත්නපුර දිස්ත්‍රික්කයේ ගොඩකවෙල රාහුල ජාතික පාසල සඳහා විදුහල්පතිවරයෙකු පත් කිරීම - ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

විදුහල්පතිවරයෙකු පත්කරන තෙක් ගරු ටී. රංජිත් ද සොයිසා මහතා සහ ගරු හේෂා විතානගේ මහතා යන මන්ත්‍රීවරුන් දෙදෙනා විසින් යෝජනා කරන ආකාරයට විදුහල්පතිවරයෙකු ආවරණ අනුමැතිය මත ගොඩකවෙල රාහුල ජාතික පාසලට අනුයුක්ත කළ හැකි බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.2 පෞද්ගලික පාසල් සහ ජාත්‍යාන්තර පාසල් නියාමනය සහ වෙනත් කටයුතු - ගරු ලසන්ත අලගියවන්න මහතා

#### 1.2.1 පෞද්ගලික සහ ජාත්‍යන්තර පාසැල් නියාමනය

පෞද්ගලික සහ ජාත්‍යන්තර පාසල් අධීක්ෂණය හා නියාමනය පොදු ප්‍රතිපත්තියක් මත ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත නව අධ්‍යාපන පනත මගින් මෙම පාසල් අධීක්ෂණය නියාමනය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට හැකියාව ලැබෙන බව ද ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා බව ද කාරක සභාවට දැනුම් දෙන ලදී.

#### 1.2.2 ගුරු උපදේශක සේවය ස්ථාපිත කිරීම

ගුරු උපදේශක සේවය ස්ථාපිත කිරීමේ කටයුතු සම්බන්ධයෙන් ගරු ලසන්ත අලගියවන්න මහතා, ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා සහ ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය අදහස් දක්වන ලදී.

ගුරු උපදේශක සේවය ස්ථාපිත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බවත් ජාතික වැටුප් හා සංඛ්‍යා ලේඛන කොමිසමේ, ආයතන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහ රාජ්‍ය සේවා කොමිසමේ අනුමැතිය ලැබීමෙන් පසු ස්ථාපිත කළ හැකි බවත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

#### 1.2.3 2013 වර්ෂයේදී අධ්‍යාපන අමාත්‍යාංශයත් ක්‍රීඩා අමාත්‍යාංශයත් එක්ව ආරම්භ කරන ලද ක්‍රීඩා වැඩසටහන

2014 වර්ෂයේදී ප්‍රතිපාදන වෙන්කර අනුමැතිය ලබා ගත් මෙම වැඩසටහන නිසි පරිදි ක්‍රියාත්මක කර නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

සැලසුමට අනුව ගුරු අත්පොත් සහ සංයුක්ත තැටි (DVD) සකස් කිරිම මෙම වසරේ නිම කළ හැකි බවත් 2020 වසරේදී ගුරුවරුන් පුහුණු කළ හැකි බවත් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.2.4 ගුරුවරුන්ගේ තොරතුරු සහිත පරිගණක තොරතුරු පද්ධතිය

ගරු මන්ත්‍රීතුමා විසින් විමසන ලද ගුරුවරුන්ගේ තොරතුරු සහිත පරිගණක තොරතුරු පද්ධතිය හඳුන්වා දීමේ වැඩසටහනෙහි දත්ත ඇතුළත් කිරීම අවසන් බව කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.2.5 නව ජාතික පාසල් ස්ථාපිත කිරීම

ගරු ලසන්ත අලගියවන්න මහතා, ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා සහ ගරු නිහාල් ගලප්පත්ති මහතා විසින් විමසන ලද කරුණට අනුව දැනට ජාතික පාසල් 361 ක් පවතින බවත් භූගෝලීය පදනම, ශිෂ්‍යයන් සංඛ්‍යාව, අ.පො.ස (උ.පෙ) සියලු විෂයන් ආවරණය වන පරිදි නව ජාතික පාසල් 1000 ට ආසන්න ප්‍රමාණයක් ඇති කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.2.6 සුහුරු පන්ති කාමර වැඩසටහන (Smart Class room)

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වර්තමාන ප්‍රගතිය පිළිබඳවද සියළුම විෂය මාලාවන් සඳහා දෘශ්‍ය මාධ්‍යයෙන් වැඩසටහන් හඳුන්වා දීම සම්බන්ධයෙන් ද ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

අ.පො.ස (උසස් පෙළ) සහ අ.පො.ස (සාමාන්‍ය පෙළ) විෂය මාලා සඳහා සංයුක්ත තැටි (CD) ඩීවීඩී උපයෝගීකරගෙන ඇති බව කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.3 අම්පාර ඩී.එස් සේනානායක ජාතික පාසලේ ගොඩනැගිලි ගැටළු - ගරු විමලවීර දිසානායක මහතා

අබලන්ව අනතුරුදායක තත්වයේ පවතින පාසැල් ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමට කටයුතු කරන බව කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.4 කොළඹ රාජකීය විද්‍යාලයේ අ.පො.ස උසස් පෙළ පන්ති සඳහා කෘෂිකර්ම ගුරුවරයෙකු ලබා ගැනීම - ගරු. ඩුලිප් විජේසේකර මහතා

මෙම පාසලේ අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ පන්ති සඳහා කෘෂිකර්ම විෂය ඉගැන්වීම සඳහා ගුරුභවතෙකු අනුයුක්ත කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**1.5 පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ජාතික පාසලේ ගුරු හිඟය - ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**

විද්‍යාපීඨවලින් පිටවීමට නියමිත නවක ගුරුවරු 4000 ක් මගින් ජාතික පාසල්වල ගුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.6 ඉංග්‍රීසි ගුරුවරුන්ගේ හිඟය -ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

පළාත් සභාවලට අනුයුක්ත කරන ගුරුවරුන් පළාත් පාසල්වලට යොමු කිරීමේදී නිසි ක්‍රමවේදයක් අනුගමනය සිදු නොකරන නිසා ඇල්පිටිය අධ්‍යාපන කලාපයේ ඉංග්‍රීසි ගුරු හිඟයක් පැවතුන ද ගාල්ල කළාපයේ ගුරු අතිරික්තයක් පවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙවැනි ගැටළුවලට විසඳුම් ලබා දීම පිණිස ඉදිරි උපදේශක කාරක සභා රැස්වීම් සඳහා අදාළ සියළුම අධ්‍යාපන නිලධාරීන් කැඳවීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්වරයාට දැනුම් දෙන ලදී.

**1.7 මාතලේ දිස්ත්‍රික්කයේ ගුරු හිඟය - ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**

මාතලේ, ලග්ගල හා විල්ගමුව අධ්‍යාපන කලාපවල ජාතික හා පළාත් පාසල්වල ගුරු පුරප්පාඩු 172 ක් පමණ පිරවීමට ගරු මන්ත්‍රීතුමිය විසින් කරන ලද ඉල්ලීමට අනුව ඉතාමත් කෙටි කාලයකදී සියලුම පුරප්පාඩු පිරවීමට කටයුතු කළ හැකි බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.8 විල්ගමුව අධ්‍යාපන කලාපයේ ගුරු නිවාස - ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**

විල්ගමුව අධ්‍යාපන කලාපය සඳහා ගුරු නිවාසවල ඉදිකර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් කරන ලද ඉල්ලීමට පිළිතුරු වශයෙන් "ළඟම පාසල හොඳම පාසල" වැඩසටහන යටතේ දුෂ්කර ප්‍රදේශවල ගුරු නිවාස 300 ක් පමණ දැනට ඉදිකර ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.9 නැගෙනහිර පළාතේ ස්වේච්ඡා ගුරුවරුන් ගුරු සේවයට බඳවා ගැනීම - ගරු සන්දිත් සමරසිංහ මහතා**

නැගෙනහිර පළාතේ ස්වේච්ඡා ගුරුවරුන්ගේ සේවය ස්ථිර කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලදී ඉල්ලීමට පිළිතුරු වශයෙන් විභාගය සමත් අයට පත්වීම් 731 ක් ලබාදී ඇති බවත් ලැබී ඇති අභියාචනා සමාලෝචනය කර ඉතිරි අයට ද පත්වීම් ලබාදීමට කටයුතු කළ හැකි බවත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.10 වාලච්චනේ හින්දු විද්‍යාලය සහ සෙන්කලඩි මධ්‍ය මහා විද්‍යාලය ජාතික පාසැල් තත්වයට පත්කිරීම සහ තවත් කරුණු- ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා

### 1.10.1 වාලච්චනේ හින්දු විද්‍යාලය සහ සෙන්කලඩි මධ්‍ය මහා විද්‍යාලය ජාතික පාසැල් තත්වයට පත්කිරීම

මඩකළපුව දිස්ත්‍රික්කයට අයත් කල්කුඩා කොට්ඨාශයේ දෙමළ මාධ්‍යයේ එකම ජාතික පාසැලක්වත් නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී. වාලච්චනේ හින්දු විද්‍යාලය සහ සෙන්කලඩි මධ්‍ය මහා විද්‍යාලය ජාතික පාසැල් තත්ත්වයට පත් කර දෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

නව ජාතික පාසල් 1000 කට ආසන්න ප්‍රමාණයක් ඇති කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී. නැඟෙනහිර පළාතේ පාසල් කිහිපයක් ජාතික පාසල් තත්ත්වයට පත් කිරීමට ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව ද කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.10.2 කල්කුඩා සහ මඩකළපුව බටහිර අධ්‍යාපන කළාපයන්හි පවතින ගුරු හිඟයට විසඳුම් ලබාගැනීම

කළාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ උපදෙස් අනුව පුරප්පාඩු පවතින පාසැල්වලට ගුරුවරුන් පත්කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී. මඩකළපුව පට්ටිරුප්පු කලාප පාසැල්වල ඇති ගුරු අතිරික්තය තුළනය කිරීම මගින් අනෙකුත් පාසැල්වලට ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන ලෙස ද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මදුරම්කුලම සහ කට්ටුමුරි පාසැල්වලට ද ප්‍රාථමික ගුරුවරුන් හිඟ බවත් ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් දන්වා සිටින ලදී.

### 1.10.3 මඩකළපුව දිස්ත්‍රික්කයට අයත් පාසැල්වල පවතින අඩුපාඩු

මඩකළපුව දිස්ත්‍රික්කයට අයත් බොහෝ පාසැල්වල ගෘහ භාණ්ඩ හිඟයක් පවතින බවත් අවශ්‍ය තරම් ගොඩනැගිලි සහ ගුරුවරුන් නොමැති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.10.4 නාවල්කාඩු -නාමගල් විද්‍යාලයේ පවතින අඩුපාඩු

නාවල්කාඩු -නාමගල් විද්‍යාලයේ නව ගොඩනැගිල්ලක් සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ ලබා දී විවෘත කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.10.5 පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින පාසැල්වල පවතින අඩුපාඩු

පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින පාසැල්වලට අවශ්‍ය කනිෂ්ඨ සේවකයින් සහ මුරකරුවන් නොමැති බවත් ආගම විෂය ඉගැන්වීම සඳහා අවශ්‍ය ගුරුවරුන්ගේ ද හිඟයක් පවතින බැවින් එම පත්වීම් ලබාදෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 1.11 අධ්‍යාපන කලාප සංඛ්‍යාව වැඩි කිරීම - ගරු ඉම්රාන් මහරුෆ් මහතා

අධ්‍යාපන කලාප සංඛ්‍යාව වැඩි කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බවත් කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල අහෝසි කර අධ්‍යාපන කලාප 200 දක්වා වැඩි කිරීමට කටයුතු කරමින් පවතින බවත් ගරු මන්ත්‍රීතුමාගේ විමසීමට පිළිතුරු වශයෙන් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.12 සමන්තුරෙයි ජාතික පාසල සඳහා විදුහල්පතිවරයෙකු පත් කිරීම - ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා

සමන්තුරෙයි ජාතික පාසල සඳහා විදුහල්පතිවරයෙකු පත් කිරීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

ආවරණ අනුමැතියට යටත්ව විදුහල්පතිවරයෙක් තාවකාලිකව පත් කිරීමට කටයුතු කරන මෙන් ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබාදෙන ලදී.

## 1.13 ගාල්ල දිස්ත්‍රික්කයේ නෙළුව ජාතික පාසලට විදුහල්පතිවරයෙකු පත් කිරීම - ගරු පියසේන ගමගේ මහතා

ආවරණ අනුමැතියට යටත්ව ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන විදුහල්පතිවරයා පත් කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දකුණු පළාත් අධ්‍යාපන ලේකම්වරයා වෙත උපදෙස් දෙන ලදී.

## 1.14 ජාතික පාසල් සඳහා ගුරු සංචිතයක් ඇති කිරීම - ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

ගුරුවරුන් නිවාඩු ගැනීම, විශ්‍රාම යාම, ගුරුවරියන් ප්‍රසූත නිවාඩු ගැනීම වැනි හේතුන් මත තාවකාලික ඇතිවන ගුරු පුරප්පාඩු සම්බන්ධයෙන් ක්ෂණිකව ක්‍රියාමාර්ග ගැනීම සඳහා ගුරු සංචිතයක් ඇති කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.15 ඌව සහ මධ්‍යම පළාත්වල ගුරු සහායකයන් ගුරු සේවයට බඳවා ගැනීමේ ගැටළු සහ වෙනත් කරුණු - ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

### 1.15.1 ඌව සහ මධ්‍යම පළාත්වල ගුරු සහායකයන් ගුරු සේවයට බඳවා ගැනීමේ ගැටළු

උපාධිය හා ගුරු පුහුණුව සම්පූර්ණ කර ඇති ගුරු සහායකයන් ගුරු සේවයට අනිවාර්යෙන් අන්තර්ග්‍රහණය කළ යුතු බවත් මේ සඳහා චක්‍රලේඛ, අමාත්‍ය මණ්ඩල අනුමැතිය, පළාත් සභා එකඟතාවය ඇති බවත් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ගුරු ආයතන) කේ.ජී. විජේසිරි මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කෙරෙන බව ගරු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය ගරු විජයකලා මහේස්වරන් මහත්මිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.15.2 නුවරඑළිය දිස්ත්‍රික්කයේ හැටන් අධ්‍යාපන කලාපයේ ගුරුවරුන් සේවාස්ථ උපදේශකයන් ( In service advisors) සහ සම්පත් දායකයන් (Resource Persons) වශයෙන් පත්කිරීම

හැටන් අධ්‍යාපන කලාපයේ සමහර ගුරුවරුන්ව සේවාස්ථ උපදේශකයන් සහ සම්පත් දායකයන් වශයෙන් පත්කර ඇති බරවින් පාසල් පරිපාලනයේදී ගැටළු මතුවී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම පත්කිරීම් සම්බන්ධයෙන් කඩිනම් පරීක්ෂණයක් කරන මෙන් ද පළාත් කාර්යාලයෙන් මිළඟ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා වාර්තාවක් කැඳවන මෙන් ද ගරු සභාපතිතුමා විසින් අතිරේක ලේකම්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

## 1.16 නොවිධිමත් අධ්‍යාපන ඒකකයේ ව්‍යාපෘති සහායකවරුන්ගේ ගැටළු - ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

නොවිධිමත් අධ්‍යාපන ඒකකයේ ව්‍යාපෘති සහායකවරුන් උපාධිධාරීන් බවත් නිසි වැටුප් තලයක් හා බඳවා ගැනීමේ ක්‍රමවේදයක් නොමැති වීම ගැටළුවක් බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

198 ක් වන ව්‍යාපෘති සහායකවරුන් සඳහා ජාතික වැටුප් කොමිෂම විසින් 2013 වසරේ සිට එන්. එම් 6 ආරම්භක වැටුප් පියවර සඳහා යෝජනා කර ඇති බවත් එයට එකඟතාවයක් නොමැති බවත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අමාත්‍ය මණ්ඩල සන්දේශයක් සකස් කර අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ලේකම්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

**1.17 අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගැනීමේ ගැටළු - ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**

අධ්‍යාපන පරිපාලන සේවය සඳහා 2012 වසරේ විභාගය පවත්වා බඳවා නොගත් අය වෙනුවෙන් අධිකරණ ක්‍රියාමාර්ග සඳහා යොමුවූ 25 දෙනෙකුට පත්වීම් ලබාදෙන මෙන් අධිකරණ නියෝගය ලැබී ඇති හෙයින් අනෙක් අයටද පත්වීම් ලබාදෙන මෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

රාජ්‍ය සේවා කොමිසමේ නිර්දේශ මත අධිකරණ නියෝගයට ලක්වූ 25 දෙනාට පත්වීම් ලබා දීමේ කටයුතු සිදුවන බවත් නව බඳවා ගැනීම් 501 ක් සඳහා ගැසට් කිරීමට නියමිත බවත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.18 සංවර්ධන නිලධාරීන් ගුරු සේවයට බඳවා ගැනීම - ගරු දයාසිරි ජයසේකර මහතා**

2005 වසරේදී සංවර්ධන නිලධාරීන් ලෙස බඳවාගත් උපාධිධාරින්ගෙන් අවම ලකුණු ලැබීම මත ඉතිරිව සිටින පිරිස ගුරු සේවයට බඳවා ගන්නා මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

විභාගයක් පවත්වා සමත් 80% ක් ගුරු සේවයට බඳවා ගත් බවත් ඉතිරිව සිටින පිරිස අවම ලකුණු ගත් අය බවත් විභාග කොමසාරිස් සනත් පූජිත මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් ඉදිරියේදී සාකච්ඡා කරන බව ගරු සභාපතිතුමා දන්වා සිටින ලදී.

එමෙන්ම අද දින කාරක සභා රැස්වීමේදී සාකච්ඡා කරන ලද තීරණයක් ගැනීමට නොහැකි වූ කරුණු සම්බන්ධයෙන් අදාළ බාහිර පාර්ශවයන් වන මුදල් අමාත්‍යාංශ නිලධාරින්, සැලසුම් සම්පාදන නිලධාරීන්වද මීළඟ කාරක සභා රැස්වීම සඳහා කැඳවන මෙන් ගරු සභාපතිතුමා විසින් ලේකම්වරයාට උපදෙස් ලබාදෙන ලදී.

**2.** කාරක සභාව ප.ව. 3. 55 ට 2019 ජුලි මස 26 දින දක්වා කල් තබන ලදී.

-----------------------------

**වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන කටයුතු පිළිබඳ**
**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**දෙවන රැස්වීම - 2019 ජූලි මස 10**

**පැමිණ සිටි කාරක සභික මන්ත්‍රීන්**

ගරු සාගල රත්නායක මහතා (සභාපති)
ගරු අර්ජුන රණතුංග මහතා
ගරු විමල් රාජපක්ෂ මහතා
ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා
ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කාංචන විජේසේකර මහතා
ගරු මුහම්මදු නසීර් මහතා

**පැමිණ සිටි කාරක සභික නොවන මන්ත්‍රීන්**
ගරු පී. හැරිසන් මහතා
ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා
ගරු ඊ. සරවනපවන් මහතා
ගරු (වෛද්‍ය) සිවමෝහන් මහතා

**1. කාර්ය සටහන්වලින් පැන නගින කරුණු**

**1.1 ගාලු වරාය සංවර්ධන කටයුතුවල වර්තමාන ප්‍රගතිය - ගරු චන්දිම වීරක්කොඩි මහතා**

කාරක සභාවේ උපදෙස් පරිදි ගාලු වරාය පරිශ්‍රයේ ඇති සිමෙන්ති ගබඩාව සම්බන්ධයෙන් සකස් කළ වාර්තාව සභාගත කරන ලදී.

**1.2 රුමස්සල ජපන් සාම චෛත්‍යය නුදුරින් ඉදි කිරීමට යෝජිත වූ අවුකන බුදු පිළිමය සඳහා ඉඩම් නිදහස් කරගැනීම - ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා**

මෙම භූමිය අභය භූමියක් ලෙස නම් කර ඇති බැවින් වෙනත් කටයුත්තක් සඳහා ඉඩම් නිදහස් කළ නොහැකි බව කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.3 කළමනාකරණ සහකාරවරුන් බඳවා ගැනීමේ විභාගය සමත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයන්ට එම පත්වීම් ලබාදීමට කටයුතු කිරීම - ගරු නිහාල් ගලප්පත්ති මහතා**

කණිෂ්ඨ කළමනාකරණ සහකාරවරුන් බඳවා ගැනීමේ තරඟ විභාගය සමත්වුවද, පසුකාලීනව ලද චක්‍රලේඛ අනුව එම පත්වීම් ලබාදිය නොහැකි වී ඇති අතර අවශ්‍ය සේවක සංඛ්‍යාව සඳහා අනුමැතිය ලබාගෙන 150 දෙනෙකුට එම පත්වීම් ලබාදීමට කටයුතු කරන බව කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.4 තාවකාලික හා අනියම් සේවකයන්ට ස්ථිර පත්වීම් ලබාදීම - ගරු නිශාන්ත මුතුහෙට්ටිගම මහතා**

සියලුම සුදුසුකම් සපුරා ඇති සේවකයන් සියලුම දෙනා මේ වනවිට ස්ථිර කර ඇති බව කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.5 යුධ සමයේ මුළුමනින්ම විනාශ වූ මුලතිව් දිස්ත්‍රික් ප්‍රදීපාගාරය නැවත ඉදිකිරීම - ගරු චාර්ල්ස් ඉ. නිර්මලනාදන් මහතා**

මෙම වර්ෂයේ මේ සඳහා ප්‍රතිපාදන වෙන් කර නොමැති බැවින් ඉදිරි වර්ෂයේදී එම කටයුතු නිම කිරීමට අපේක්ෂා කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.6 තලෙයිමන්නාරම සිට ඉන්දියාව දක්වා නැව් සේවාවක් ආරම්භ කිරීම - ගරු චාර්ල්ස් ඉ. නිර්මලනාදන් මහතා**

තලෙයිමන්නාරම සිට ඉන්දියාවේ රාමේෂ්වරම් දක්වා නැව් සේවාවක් ආරම්භ කිරීමේ කටයුතු ප්‍රමාදවීමට හේතු වී ඇත්තේ ඉන්දියාවේ රාමේෂ්වරම් පාර්ශවයේ කටයුතු ප්‍රමාදවීම බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී. කොළඹ සිට තූත්තුකුඩිය දක්වා නැව් සේවාවක් ආරම්භ කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇති බව ද කාරක සභාවට දැනුම් දෙන ලදී. එමෙන්ම කන්කසන්තුරේ සිට කරිකාලන් දක්වා වන නැව් සේවාව ආරම්භ කිරීමේ කටයුතු ද සිදු කෙරෙමින් පවතින බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.7 දක්ෂිණ සංවර්ධන අධිකාරිය මගින් ගාල්ල හා මාතර දිස්ත්‍රික්ක හා කොටවිල නවනගරය හා මිරිස්ස සංචාරක කලාපය සංවර්ධනය කිරීමේ කටයුතු - ගරු කාංචන විජේසේකර මහතා**

හඳුන්වාදීමට නියමිත දක්ෂිණ බලකොටු පනත (Southern Fort Act) අනුමත කර ගැනීමේ කටයුතු මේ වනවිට නතර වී ඇති බැවින් හා දක්ෂිණ සංවර්ධන අතුරු මණ්ඩලය යටතට මෙම කරුණු නොගැනෙන බැවින් මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේදී සාකච්ඡා කළ හැකි බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2. ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය සම්බන්ධ පරිගණක ආධාරයෙන් කළ ඉදිරිපත් කිරීම (Presentation)**

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සහ ගිං නිල්වලා ව්‍යපෘතිය භාර නිලධාරීන් විසින් යෝජිත ව්‍යපෘතියේ විස්තරයක් සහ ඉදිරි සැලසුම් පිළිබඳ විස්තරාත්මකව කාරක සභාව දැනුවත් කරන ලදී.

**3. වෙනත් කටයුතු**

**3.1 වරාය අධිකාරියේ වර්තමාන ආදායම් තත්ත්වයේ අඩුවීම - ගරු කාංචන විජේසේකර මහතා**

ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයේ වරාය අධිකාරියේ ආදායම් මට්ටමේ යම් අඩුවීමක් නොමැති බවත් පසුගිය වසරට සාපේක්ෂව 10% - 12% ක පමණ ප්‍රමාණයක ආදායම වැඩි වී ඇති බවත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.2 විවිධ චෝදනාවන් මත වැඩ තහනමට ලක්වූ රණතුංග මහතා නැවත සේවයට බඳවා ගැනීම - ගරු කාංචන විජේසේකර මහතා**

කිහිප අවස්ථාවකදී වැඩ තහනමට ලක් වූ රණතුංග නම් තැනැත්තකු නැවත සේවයේ පිහිටුවා ඇති බවට තොරතුරු ලැබී ඇතැයි ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම තැනැත්තා මේ වනවිට සියලු චෝදනාවලින් නිදහස් වී ඇති බැවින් හා එම තනතුර සඳහා අයෙක් බඳවා ගන්නා තෙක් මාස 06 ක කාලයකට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට කටයුතු කර ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.3 ජයා බහාලුම් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය විසින් සේවකයන් බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පළකිරීම - ගරු කාංචන විජේසේකර මහතා**

පුවත්පත් දැන්වීම් පළකර ඇති ජයා බහාලුම් ප්‍රයිවට් ලිමිටඩ් නමින් සේවක බඳවා ගැනීම් සිදුකරන පදනම සහ බඳවා ගනු ලබන්නේ පෞද්ගලික ආයතනයටද නොඑසේනම් වරාය අධිකාරියටද යන්න පැහැදිලි කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

සේවක පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට පුවත්පත් දැන්වීම් පලකළ බවත් එම බඳවාගැනීම් හුදෙක්ම තම ආයතනයේ පුරප්පාඩු පිරවීම සඳහා සිදු කරන බවත් ජයා බහාලුම් පුද්ගලික සමාගමේ සභාපතිවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**4. කල්තැබීම**

කාරක සභාව පස්වරු 4.00 ට 2019.09.17 දින පස්වරු 02.30 දක්වා කල් තබන ලදී.

-----------------------------

**කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන හා වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පස්වැනි රැස්වීම - 2019 ජූලි 11**

**පැමිණ සිටි කාරක සභික මන්ත්‍රීන්**
ගරු බුද්ධික පතිරණ මහතා (සභාපති)
ගරු කරුණාරත්න පරණවිතාන මහතා
ගරු ඒ. ඩී. ප්‍රේමදාස මහතා
ගරු කේ. කේ. පියදාස මහතා
ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

**පැමිණ සිටි කාරක සභික නොවන මන්ත්‍රීන්**
ගරු විමල් වීරවංශ මහතා
ගරු වාසුදේව නානායක්කාර මහතා
ගරු පාලිත රන්ගෙ බණ්ඩාර මහතා
ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා
ගරු අ. අරවින්ද් කුමාර් මහතා
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
ගරු මයන්ත දිසානායක මහතා
ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

**1. දිනට නියමිත කරුණු**

**1.1 ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය මගින් කර්මාන්තකරුවන් වෙත අමුද්‍රව්‍ය ලබාදීම පිළිබඳ විමර්ශනය කිරීම සඳහා පත්කළ කමිටුවේ වාර්තාව, ලංකා සතොස ආයතනයට එල්ල වූ චෝදනා සම්බන්ධයෙන් වූ වාර්තාව, සමූපකාර තොග වෙළඳ සංස්ථා ගොඩනැගිල්ල හා එහි ආරක්ෂාව සම්බන්ධයෙන් වූ වාර්තාව සහ ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ සිදුවී ඇතැයි කියනු ලබන අක්‍රමිකතා පිළිබඳ කරන ලද විමර්ශනයේ වාර්තාව**

මෙම වාර්තාවන් කාරක සභාවට ඉදිරිපත් කරන ලදී.

ගරු විමල් වීරවංශ මහතා, ගරු වාසුදේව නානායක්කාර මහතා හා ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා මේ පිළිබඳව කරුණු විමසීමක් කරන ලදී.

මෙම වාර්තා පිළිබඳ අධ්‍යයනයක් කර ඒ පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා ඉදිරි රැස්වීම් දිනකදී නැවත විශේෂ උපදේශක කාරක සභා රැස්වීමක් කැඳවීමට කටයුතු කළ හැකි බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2. වෙනත් කටයුතු:**

**2.1 මහනුවර දිස්ත්‍රික්කයේ පොත්තපිටිය කර්මාන්තපුරය ආරම්භ කිරීමේ කටයුතු කඩිනම් කිරීම - ගරු මයන්ත දිසානායක මහතා**

මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ආසනයේ පොත්තපිටිය ප්‍රදේශයේ යෝජිත කර්මාන්තපුරයට මුල්ගල තැබීමේ කටයුතු 2019.07.13 දින ප.ව. 2.30ට සිදුකිරීම සඳහා කටයුතු සූදානම් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමා වෙත දැනුම් දෙන ලදී.

**2.2 මඩකළපුව දිස්ත්‍රික්කයේ සමුපකාර සමිතිවලට අයත් ඉන්ධන පිරවුම්හල්වල අඩුපාඩු සහ වෙනත් කරුණු - ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා**

**2.2.1 මඩකළපුව දිස්ත්‍රික්කයේ සමුපකාර සමිතිවලට අයත් ඉන්ධන පිරවුම්හල්වල අඩුපාඩු**

සමුපකාර සමිතිවලට අයත් ඉන්ධන පිරවුම්හල්වල වහල සෙවිලිකිරීම සඳහා ආධාර ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**2.2.2 මඩකළපුව දිස්ත්‍රික්කයේ සමුපකාර සමිති මගින් ඉන්ධන නිකුත්කිරීම සඳහා අවසර ලබාදීම**

සමුපකාර සමිති මගින් ඉන්ධන නිකුත්කිරීම සඳහා අවසර ලබාදෙන ලෙසත් භූමිතෙල් නිකුත්කිරීමට පමණක් මින් පෙර අවසර ලබාදී ඇති සමිතිවලට පැට්රෝල් සහ ඩීසල් නිකුත්කිරීමට ද අවසර ලබාදෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**2.2.3 එරාවූර් උතුර සහ දකුණ සමුපකාර සමිතිවලට අයත් හාල් මෝල් නවීකරණය කිරීම**

එරාවූර් උතුරු දකුණ සමුපකාර සමිතිවලට අයත් හාල් මෝල් දෙකක් නවීකරණය කිරීමට මුදල් ප්‍රතිපාදන ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**2.2.4 මඩකළපුව දිස්ත්‍රික්කයට අයත් සමුපකාර සමිති සහ ඒවාට අනුයුක්ත පශු සම්පත් සමුපකාර සමිතිවල අවශ්‍යතා සපුරා ගැනීම**

මඩකළපුව දිස්ත්‍රික්කයට අයත් සමුපකාර සමිති සහ ඒවාට අනුයුක්ත පශු සම්පත් සමුපකාර සමිති සඳහා පරිඝනක සහ මෘදුකාංග ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**2.2.5 පේෂකර්මාන්ත සමූපකාර සමිති වැඩිදියුණු කිරීම**

මඩකළපුව දිස්ත්‍රික්කයට අයත් පේෂකර්මාන්ත සමුපකාර සමිතිය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය බල රැහැන් (power looms) සහ මහන මැෂින් ලබාදෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**2.2.6 කෝරලෙයි පත්තු සමුපකාර සමිතියට අයත් ප්‍රජා ශාලාව සඳහා ගෘහ උපකරණ සහ ශබ්ද විකාශන යන්ත්‍ර ලබාගැනීම**

කෝරලෙයි පත්තු සමුපකාර සමිතියට අයත් ප්‍රජා ශාලාව සඳහා ගෘහ උපකරණ සහ ශබ්ද විකාශන යන්ත්‍ර ලබාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

**2.2.7 ඉලුප්පඩිචේනයි, කොම්මාතුරෙයි, මන්මුනෙයි බටහිර යන පශු සම්පත් සමුපකාර සමිති සඳහා තණබිම් ලබාගැනීම**

ඉලුප්පජ්චේනයි, කොම්මාතුරෙයි, මන්මුනෙයි බටහිර යන පශු සම්පත් සමුපකාර සමිතිවලට අවශ්‍ය තණබිම් නොමැති බවත් මඩකළපුව ප්‍රදේශයේ ඇති තණබිම් ගැසට් නිවේදනයක් මඟින් ලබාදෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එසේම මන්මුනෙයි බටහිර විවිධ සේවා සමුපකාර සමිතිය විසින් කිරි නිෂ්පාදන කටයුතු සිදුකරනු ලබන බවත් එම කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍ර සහ ශීතකරණ පහසුකම් නොමැති බවත් එම අවශ්‍යතා ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 2.2.8 නැගෙනහිර කාන්තා සංවර්ධන සමුපකාර සමිතිය සඳහා ගොඩනැගිල්ලක් ලබාගැනීම

නැගෙනහිර කාන්තා සංවර්ධන සමුපකාර සමිතිය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් තැනීමට අවශ්‍ය ඉඩමක් ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

තවද, මඩකළපුව දිස්ත්‍රික්කයේ පේෂ කර්මාන්තයේ නියැලී සිටින කාන්තාවන්ගේ නිෂ්පාදන වෙළඳපළට ගෙනයෑම සඳහා අවශ්‍ය වාහන පහසුකම් ලබාදෙන ලෙස ද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එම පළාතේ සමූපකාර සමිති සංවර්ධනය කිරීම සඳහා SMILE III ණය යෝජනා ක්‍රමය මඟින් අරමුදල් ලබාදිය හැකි බැවින් අරමුදල් අවශ්‍ය සමූපකාර සමිතිවලට ලිපි ලබාදීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබාදෙන ලදී.

### 2.2.9 වාලච්චේන ජාතික කඩදාසි කම්හල ආරම්භ කිරීමට කටයුතු කිරීම

වාලච්චේන කඩදාසි කම්හල ආරම්භ කිරීමේ කටයුතු කඩිනමින් සිදු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 3. කල් තැබීම

කාරක සභාව පස්වරු 03.30 ට 2019.07.25 දින පෙරවරු 11.00 දක්වා කල් තබන ලදී.

-----------------------------

## සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
## පළමුවැනි රැස්වීම - 2019 ජූලි 12

**පැමිණ සිටි කාරක සභික මන්ත්‍රීන්**

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සභාපති)
ගරු වීරකුමාර දිසානායක මහතා
ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

**පැමිණ සිටි කාරක සභික නොවන මන්ත්‍රීන්**

ගරු සාගල රත්නායක මහතා
ගරු ලසන්ත අලගියවන්න මහතා
ගරු ෆයිසාල් කාසිම් මහතා
ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
ගරු නිහාල් ගලප්පත්ති මහතා
ගරු එස්. වියාලේන්දිරන් මහතා
ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා
ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු හර්ෂණ රාජකරුණා මහතා
ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා
ගරු චතුර සංදීප සේනාරත්න මහතා
ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා

**1. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා**

පහත සඳහන් යෝජනා සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ වාර්තාවන් ගරු බුද්ධික පතිරණ මහතා වෙත ඉදිරිපත් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි

**1.1** සමස්ථ ලංකා පානීය ජල කර්මාන්තකරුවන්ගේ සංගමයේ ලේකම් විසින් පානීය ජල නිෂ්පාදන ආයතන ප්‍රමිතිගත කිරීම සම්බන්ධයෙන් කරන ලද ඉල්ලීම - (යෝජනා අංක - 19) - ගරු බුද්ධික පතිරණ මහතා

**1.2** අකුරැස්ස, මාරඹ පදිංචි එස්.ඒ. ගුණවර්ධන මහත්මිය විසින් ස්ථාන මාරුවීමක් ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීම - (යෝජනා අංක - 24) - ගරු බුද්ධික පතිරණ මහතා

**1.3** රත්නපුර, තිරිවානකැටිය පදිංචි පී.කේ.ආර්. විජේකාන්ති මහත්මිය විසින් වතු ක්ෂේත්‍රය තුළ සේවය කරන සුදුසුකම් සපුරා ඇති පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් රජයට අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහා කරන ලද ඉල්ලීම - (යෝජනා අංක - 25) - ගරු බුද්ධික පතිරණ මහතා

**1.4** රැකියා අවස්ථාවක් ලබා ගැනීම - කෝට්ටේගොඩ, පාතේගම දකුණ, "සමීර" ලිපිනයෙහි පදිංචි එන්.ඩී. ඉරෝෂ් ලක්මාල් යන අයගේ ඉල්ලීම - (යෝජනා අංක - 77) - ගරු බුද්ධික පතිරණ මහතා

**2. දිනට නියමිත කටයුතු**

**2.1 දෙනියාය රෝහල සම්බන්ධ සාකච්ඡාව**

දෙනියාය මූලික රෝහල සංවර්ධනය කිරීම සඳහා වන ව්‍යාපෘති යෝජනාව සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති බවත් ඉදිරියේදී තාක්ෂණික ඇගයීම් කටයුතු සහ සම්මුති සාකච්ඡා සිදු කිරීමට නියමිත බවත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ව්‍යාපෘතිය පිළිබඳව ගරු සාගල රත්නායක මහතා විසින් ද කාරක සභාවට අදහස් ඉදිරිපත් කරන ලදි. ඉදිරි කටයුතු සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සහ අමාත්‍යාංශය සමඟ, ඉංජිනේරු කාර්යයන් පිළිබඳ

මධ්‍යම උපදේශක කාර්යාංශයේ දායකත්වය පිළිබඳව ගරු සාගල රත්නායක මහතා විසින් විමසීමක් කරන ලදි.

එම කාර්යාංශය විසින් උපදේශන කටයුතු පමණක් සිදු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

**2.2 ලග්ගල රෝහල සම්බන්ධ සාකච්ඡාව**

ලග්ගල රෝහල මූලික රෝහලක් බවට පත් කිරීම සම්බන්ධයෙන් ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය විසින් විමසීමක් කරන ලදි.

මේ සම්බන්ධයෙන් සැලසුම් නිර්මාණය කිරීම ඇතුළු සියලු කටයුතු සිදු කෙරෙමින් පවතින බව කාරක සභාවට දැනුම් දෙන ලදි.

**2.3 කළුතර මහ රෝහල සම්බන්ධ සාකච්ඡාව**

මේ වනවිට කළුතර රෝහල ආශ්‍රිතව ව්‍යාපෘති 6 ක් ක්‍රියාත්මක කෙරෙන බව කාරක සභාවට දැනුම් දෙන ලදි. ඊට අමතරව තවත් ව්‍යාපෘති 4ක් වෙනුවෙන් ප්‍රසම්පාදන කටයුතු සිදු කරන බව ද තවදුරටත් දැනුම් දෙන ලදි. මෙම ව්‍යාපෘති 4 වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බව සහ 2020 සහ 2021 වසරවලදී ඒ වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කරන බව ද තවදුරටත් දැනුම් දෙන ලදි.

**3. වෙනත් කටයුතු**

**3.1 දොම්පේ වෙදගම ආයුර්වේද රෝහලේ ඉදි කිරීම් සහ වතුපිටිවල රෝහලට සී.ටී. ස්කෑන් යන්ත්‍රය ලබා ගැනීම - ගරු හර්ෂණ රාජකරුණා මහතා**

**3.1.1 දොම්පේ වෙදගම ආයුර්වේද රෝහලේ ඉදි කිරීම්**

දොම්පේ වෙදගම ආයුර්වේද රෝහල සම්බන්ධ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට ඇතුළත් කරන ලද ඇස්තමේන්තුව අධික බැවින් අනුමැතිය සඳහා නැවත ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු බව කාරක සභාවට දැනුම් දෙන ලදි.

**3.1.2 වතුපිටිවල රෝහලට සී.ටී. ස්කෑන් යන්ත්‍රය ලබා ගැනීම**

සී.ටී. ස්කෑන් යන්ත්‍ර 5ක් ආනයනය කිරීමට නියමිත බැවින් ඒ අතරින් එක් යන්ත්‍රයක් වතුපිටිවල රෝහලට ලබා දෙන බව නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

**3.2 කරාපිටිය මාතෘ රෝහලේ ඉදි කිරීම් කටයුතු, කරාපිටිය රෝහලේ අධ්‍යක්ෂ පුරප්පාඩුව සහ ඇල්පිටිය සහ බලපිටිය රෝහල් සම්බන්ධ ඉදි කිරීම් කටයුතු - ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

### 3.2.1 කරාපිටිය මාතෘ රෝහලේ ඉදි කිරීම් කටයුතු

ඉදි කිරීමේ කටයුතු මේ වනවිට අවසන් වෙමින් පවතින බව සහ රෝහලට පිවිසෙන මාර්ගය වෙනුවෙන් ඉඩමක් පවරා ගැනීම අවශ්‍ය වන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි. තවද මෙම රෝහල සඳහා ආනයනය කිරීමට අවශ්‍ය තවත් උපකරණ වෙනුවෙන් යූරෝ මිලියන 2ක ප්‍රමාණයක් අවශ්‍ය බව අදාළ කොන්ත්‍රාත්කරුවන් විසින් දැනුම් දුන් බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මෙම කරුණු අමාත්‍ය මණ්ඩලයට යොමු කර ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 3.2.2 කරාපිටිය ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂ පුරප්පාඩුව

කරාපිටිය රෝහලේ අධ්‍යක්ෂ තනතුරෙහි පුරප්පාඩුවක් පවතින බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

### 3.2.3 කරාපිටිය ශික්ෂණ රෝහලේ වකුගඩු ඒකකයේ කටයුතු අවසන් නොවීම

කරාපිටිය ශික්ෂණ රෝහලේ වකුගඩු ඒකකයේ ඉදි කිරීම් කටයුතු 86% ක් පමණ අවසන් නමුත් බිල්පත් පියවීමේ ගැටළුවක් නිසා ඉතිරි කටයුතු අවසන් කිරීමට නොහැකි වී ඇති බව කාරක සභාවට දැනුම් දෙන ලදි.

ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට අයත් බිල්පත් ගෙවීමට ඉතිරිව ඇති බැවින් පිළිකා ඒකකයේ උපකරණ ස්ථාපිත කිරීමේ කටයුතු නවතා ඇති බව කාරක සභාවට දැනුම් දෙන ලදි.

ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට ගෙවීමක් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදි.

### 3.2.4 ඇල්පිටිය සහ බලපිටිය රෝහල් සම්බන්ධ ඉදි කිරීම් කටයුතු

මේ සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති බව සහ ඒ අනුව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කිරීමට නියමිත බව දකුණු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 3.3 කිලිනොච්චි දිස්ත්‍රික්කයේ වෛද්‍ය සේවාව සම්බන්ධ ගැටළු - ගරු එස්. ශ්‍රීතරන් මහතා

### 3.3.1 කිලිනොච්චි දිස්ත්‍රික්කයේ වෛද්‍ය ක්ෂේත්‍රයේ පුරප්පාඩු

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ රෝහල්වල වෛද්‍යවරුන්, හෙද නිලධාරින් සහ පවුල් සෞඛ්‍ය නිලධාරින් වෙනුවෙන් විශාල පුරප්පාඩු සංඛ්‍යාවක්

පවතින බැවින් ඒවා සම්පූර්ණ කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

### 3.3.2 කිලිනොච්චි රෝහලෙහි දෙවන අදියරෙහි ඉදි කිරීම් කටයුතු

කිලිනොච්චි රෝහලෙහි දෙවන අදියර සඳහා මුල්ගල් තබා මේ වනවිට මාස 5ක පමණ කාලයක් ගත වී ඇති නමුත් එහි ඉදි කිරීම් කටයුතු සිදු නොවීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

## 3.4 හෙට්ටිපොළ රෝහලේ වකුගඩු රෝග නිවාරණ ඒකකය සඳහා උපකරණ - ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

විල්ගමුව - හෙට්ටිපොළ රෝහලේ ස්ථාපිත වකුගඩු රෝග නිවාරණ ඒකකය සඳහා අවශ්‍ය උපකරණ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මෙහි ස්ථාපිත කර ඇත්තේ වකුගඩු රෝග නිවාරණ ඒකකයක් නොව සායනයක් බව මාතලේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි. නමුත් ලග්ගල රෝහල මූලික රෝහලක් බවට පත් කිරීමෙන් පසු එහි එවැනි ඒකකයක් ස්ථාපිත කළ හැකි බව ඔහු තවදුරටත් දැනුම් දෙන ලදි.

ඒ අනුව කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදි.

## 3.5 මුලතිව් දිස්ත්‍රික්කයේ වෛද්‍ය ක්ෂේත්‍රයේ අඩුපාඩු සහ මල්ලාවි රෝහලට ලේ බැංකුවක අවශ්‍යතාවය - ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය

### 3.5.1 මුලතිව් දිස්ත්‍රික්කයේ වෛද්‍යවරුන්ගේ සහ හෙදියන්ගේ අඩුපාඩුව

මුලතිව් දිස්ත්‍රික්කයේ වෛද්‍යවරුන්ගේ සහ හෙදියන්ගේ අඩුපාඩුවක් පවතින බැවින් මහජනතාව මහත් අපහසුතාවයකට පත් වන බව ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි. එමෙන්ම මෙම දිස්ත්‍රික්කයේ රෝහල්වල කාර්ය මණ්ඩලයට නිල නිවාස සහ ප්‍රවාහන පහසුකම් ද ඉතා පහළ මට්ටමක පවතින බව ගරු මන්ත්‍රීතුමිය විසින් දැනුම් දෙන ලදි.

මුලතිව් දිස්ත්‍රික්කයේ රෝහල්වල වෛද්‍ය වාට්ටු සංකීර්ණයක අවශ්‍යතාවය සම්බන්ධයෙන්ද ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

ඉල්ලීම සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා බව කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.5.2 මල්ලාවි මූලික රෝහලට ලේ බැංකු මධ්‍යස්ථානයක අවශ්‍යතාවය

මල්ලාවි මූලික රෝහල වෙනුවෙන් ලේ බැංකු මධ්‍යස්ථානයක අවශ්‍යතාවය පිළිබඳව ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මූලිකවම ලේ ගබඩා කිරීම සඳහා පහසුකම් සලසා ගත යුතු බැවින් ඒ සඳහා අවශ්‍ය කටයුතු සලසන ලෙස නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සේවා 02) විසින් මුලතිව් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දෙන ලදි. එයින් අනතුරුව ලේ බැංකුවක් ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කළ හැකි බව ඔහු විසින් තවදුරටත් දැනුම් දෙන ලදි.

## 3.6 සුවසැරිය ගිලන් රථ සේවාව මඟින් රෝහල් අතර රෝගීන් ප්‍රවාහනය නොකිරීම සහ වවුනියා දිස්ත්‍රික් රෝහලෙහි උපදේශකවරුන් සඳහා නිල නිවාස - ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා

### 3.6.1 සුවසැරිය ගිලන් රථ සේවාව මඟින් රෝහල් අතර රෝගීන් ප්‍රවාහනය කිරීම

ගිවිසුම ප්‍රකාරව අනුව සුවසැරිය ගිලන් රථ සේවාව මඟින් නේවාසික ස්ථානවල සිට රෝහල්වලට රෝගීන් ප්‍රවාහනය කරන නමුත් රෝහල් අතර එසේ සිදු නොකරන බව කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 3.6.2 වවුනියා දිස්ත්‍රික් රෝහලෙහි උපදේශකවරුන් සඳහා නිලනිවාස හිඟය

වවුනියා දිස්ත්‍රික් රෝහලෙහි උපදේශකවරුන් සඳහා නිලනිවාස නොමැති බැවින් ඔවුන් මෙම රෝහල වෙත වාර්තා නොකරන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි. මෙම කරුණ පිළිබඳව ඉදිරිපත් කිරීමට නියමිත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසද ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදි.

## 3.7 මඩකලපුව දිස්ත්‍රික්කයේ වෛද්‍ය සේවාව සම්බන්ධ ගැටළු - ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා

### 3.7.1 මඩකලපුව ශික්ෂණ රෝහලේ කම්කරු සේවකයන්ගේ පුරප්පාඩු

මඩකලපුව ශික්ෂණ රෝහලේ කම්කරු සේවකයන්ගේ පුරප්පාඩු සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද නම් ලැයිස්තුව ද සැලකිල්ලට ගෙන දිස්ත්‍රික්ක මට්ටමින් පත්වීම් ලබා දිය හැකි බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

**3.7.2 වාලච්චේන රෝහලේ හදිසි ප්‍රතිකාර අංශය සඳහා ගොඩනැගිල්ලක අවශ්‍යතාවය**

වාලච්චේන රෝහලේ හදිසි ප්‍රතිකාර අංශය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

**3.7.3 මඩකලපුව, වාලච්චේන, එරාවූර් සහ කලවාන්චිකුඩි ප්‍රදේශ සඳහා ඔසුසල පිහිටුවීමේ අවශ්‍යතාවය**

මඩකලපුව, වාලච්චේන, එරාවූර් සහ කලවාන්චිකුඩි ප්‍රදේශ සඳහා ඔසුසල ශාඛා ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

මීළඟ මාසය ඇතුළත මඩකලපුව ප්‍රදේශය සඳහා ඔසුසලක් ස්ථාපනය කළ හැකි බව ද සෙසු ප්‍රදේශවල ඔසුසල් ආරම්භ කිරීම සම්බන්ධයෙන් සොයා බලන බව ද රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපතිවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදි.

**3.8 මඩකලපුව ශික්ෂණ රෝහලේ අපද්‍රව්‍ය කළමනාකරණය - ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා**

අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා අංගනයක් සහ යන්ත්‍ර මඩකලපුව ශික්ෂණ රෝහල සතුව ඇති නමුත් ඉන් එක් යන්ත්‍රයක් නිතරම අක්‍රිය වන බව කාරක සභාවට දැනුම් දෙන ලදි. එමෙන්ම මහජන විරෝධය හේතුවෙන් අනෙක් යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට නොහැකි බව ද තවදුරටත් දැනුම් දෙන ලදි. මේ වනවිට සායනික අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් පවතින බැවින් දේශපාලන අධිකාරිය සහ අදාළ නිලධාරින් සමඟ සාකච්ඡා කර ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශ මත එම අපද්‍රව්‍ය වැළලීම සඳහා පර්චස් 30ක ඉඩමක් සොයා ගත් බව කාරක සභාවට දැනුම් දෙන ලදි.

**3.9 හම්බන්තොට දිස්ත්‍රික් රෝහලේ නිර්වින්දන වෛද්‍යවරුන්ගේ පවතින හිඟය සහ තංගල්ල මූලික රෝහලෙහි දැඩි සත්කාර ඒකකය - ගරු නිහාල් ගලප්පත්ති මහතා**

**3.9.1 හම්බන්තොට දිස්ත්‍රික් රෝහලෙහි නිර්වින්දන වෛද්‍යවරුන්ගේ පවතින හිඟය**

හම්බන්තොට දිස්ත්‍රික් රෝහලෙහි නිර්වින්දන වෛද්‍යවරුන්ගේ පවතින හිඟය සඳහා අවශ්‍ය කටයුතු සලසන බව කාරක සභාවට දැනුම් දෙන ලදි. මේ පිළිබඳ අවධානය යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදි.

#### 3.9.2 තංගල්ල මූලික රෝහලෙහි දැඩි සත්කාර ඒකකය

තංගල්ල මූලික රෝහලෙහි දැඩි සත්කාර ඒකකය හානි වී ඇති බැවින් එහි ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනම් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

තාවකාලිකව දැඩි සත්කාර ඒකකයක් ඉදි කිරීම මාස 2ක් තුළ අවසන් කරන බවට කොන්ත්‍රාත්කරු එකඟ වී ඇති බව කාරක සභාවට දැනුම් දෙන ලදි.

#### 3.9.3 රේඛීය ත්වරක යන්ත්‍රයක් (Linear Accelerator) ලබා ගැනීම

පිළිකා රෝගීන්ට ප්‍රතිකාර සඳහා අවශ්‍ය රේඛීය ත්වරක යන්ත්‍ර ආනයනය කිරීමේදී එම යන්ත්‍රවල ගුණාත්මකභාවය ගැන සැලකිලිමත් වන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදි.

ආනයනය කිරීමට නියමිත යන්ත්‍ර ගුණාත්මක මට්ටමින් ඉහළ නවතම තාක්ෂණයෙන් යුත් යන්ත්‍ර බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 3.10 ක්ෂය රෝග මර්දන සහායකයින් මුහුණ දෙන ගැටළුව සහ විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති - ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

#### 3.10.1 ක්ෂය රෝග මර්දන සහායකයින් මුහුණ දෙන ගැටළුව

පසුගිය කාලයේ ඇතැම් මධ්‍යස්ථානවල ක්ෂය රෝග මර්දන සහායකයින්ට අන්වීක්ෂක රාජකාරි කටයුතු ඉටු කිරීමට අවස්ථාව ලබා නොදීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් විමසීමක් කරන ලදි.

දැරණියගල ප්‍රදේශයේද මෙවැනි තත්ත්වයක් ඇති බැවින් ඒ පිළිබඳ අවධානය යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදි.

#### 3.10.2 විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති

ප්‍රාථමික සෞඛ්‍ය සුරක්ෂණය සඳහා විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවලින් වෙන් කරන ප්‍රතිපාදන ප්‍රමාණවත් ආකාරයට ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

#### 3.10.3 කරවනැල්ල ප්‍රදේශයට ඔසුසලක අවශ්‍යතාවය

කරවනැල්ල ප්‍රදේශයට ඔසුසලක් ලබාදීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපතිවරයා වෙත උපදෙස් ලබා දෙන ලදි.

### 3.11 මාළිගාවත්ත ආර්. ප්‍රේමදාස රෝහල - ගරු මුජිබුර් රහුමාන් මහතා

මහල් 9කින් යුත් මාළිගාවත්ත ආර්. ප්‍රේමදාස රෝහල් ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා රුපියල් මිලියන 2000 ක පමණ ප්‍රතිපාදන සඳහා ඉල්ලුම් කළද එය නොලැබුණු බව නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැපයීම්) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 3.12 මඩකලපුව රෝහලේ මෘත ශරීරාගාරය සහ ඖෂධ ගබඩාව පැරණි ගොඩනැගිලිවල තිබීම - ගරු එස්. වියාලේන්දිරන් මහතා

මඩකලපුව රෝහලේ මෘත ශරීරාගාරය ඉතා පැරණි බැවින් මේ සඳහා නව ගොඩනැගිල්ලක ඉදි කිරීම් කටයුතු ආරම්භ කර බිම් මහල අවසන් කර ඇති බව කාරක සභාවට දැනුම් දෙන ලදි. ඉතිරි මහල් 2 සඳහා රුපියල් මිලියන 105ක මූල්‍ය ප්‍රතිපාදන අවශ්‍ය බව තවදුරටත් දැනුම් දෙන ලදි.

එක් මහලක ඉදි කිරීම් කටයුතු සඳහා අවශ්‍ය රුපියල් මිලියන 50ක ප්‍රතිපාදන ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැපයීම්) වෙත උපදෙස් ලබා දෙන ලදි.

පැරණි ගොඩනැගිල්ලක ස්ථාපිත ඖෂධ ගබඩාව සඳහා ද නව ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ කටයුතු සම්බන්ධයෙන් මැදිහත් වී කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතාගෙන් ඉල්ලීමක් කරන ලදි.

### 3.13 ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම

සාමාන්‍යයෙන් ජූනි සහ ජූලි මාස එළඹෙන විට ඩෙංගු රෝගය වැඩි වශයෙන් ව්‍යාප්ත වන බව කාරක සභාවට දැනුම් දෙන ලදි. මේ වනවිට කළුතර දිස්ත්‍රික්කයේ අර්ධ නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල ඩෙංගු ව්‍යාප්තිය පෙරට වඩා සාපේක්ෂ වැඩිවීමක් පෙන්නුම් කෙරෙන බව තවදුරටත් දැනුම් දෙන ලදි. මෙම වසරේ මරණ සංඛ්‍යාව සැලකිය යුතු ලෙස අඩු වීමක් නිරීක්ෂණය වන බව ද දැනුම් දෙන ලදි.

ඩෙංගු රෝගය සම්බන්ධ ජාතික සම්බන්ධීකරණ නිලධාරි ලෙස වෛද්‍ය හසිත තිසේරා මහතාව පත් කර පත්වීම් ලිපිය ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදි.

එමෙන්ම ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම සම්බන්ධයෙන් සතිපතා නිරීක්ෂණය කර එම ව්‍යාප්තිය වැළැක්වීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා), වෛද්‍ය ටී.එල්.සී. සෝමතුංග මහත්මියට උපදෙස් ලබා දෙන ලදි.

### 3.14 කොතල හිඹුටු සම්බන්ධ වත්මන් තත්ත්වය - ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

අපනයනය කිරීම සඳහා කොතල හිඹුටු සපයා ගන්නා මූලාශ්‍රයක් ඉදිරිපත් වී නොමැති බැවින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ

සම්බන්ධ වී අවශ්‍ය අනුමැතිය ලබා දිය යුතු නමුත් එම දෙපාර්තමේන්තුව විසින් එසේ අනුමැතිය ලබා දීම සම්බන්ධයෙන් විරෝධතාවයක් දක්වන බව කාරක සභාවට දැනුම් දෙන ලදි.

රජය සහ පෞද්ගලික අංශය සමඟ සම්බන්ධ වී මෙම ශාඛය වගා කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් සලකා බැලිය හැකි බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

**4.** කාරක සභාව ප.ව. 5.20 ට 2019.08.22 දින පස්වරු 2.30 දක්වා කල් තබන ලදී.

-----------------------------

**කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමූපකාර සංවර්ධන හා වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව හයවැනි රැස්වීම - 2019 ජූලි 25**

**පැමිණ සිටි කාරක සභික මන්ත්‍රීන්**

ගරු බුද්ධික පතිරණ මහතා (සභාපති)
ගරු කරුණාරත්න පරණවිතාන මහතා
ගරු කේ. කේ. පියදාස මහතා

**පැමිණ සිටි කාරක සභික නොවන මන්ත්‍රීන්**

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
ගරු නිමල් ලාන්සා මහතා
ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා

**1.** කාර්ය සටහන්වලින් පැනනගින කරුණු.

**1.1 නව සතොස ශාඛා විවෘත කිරීම**

ජූනි මස අලෙවිසැල් 06ක් විවෘත කර ඇති බවත්, ඉදිරි සති දෙක තුළ නව සතොස ශාඛා 17ක් විවෘත කිරීමට නියමිත බව ලංකා සතොස සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.2 සතොස ශාඛා වෙළඳසැල් හරහා මත්පැන් අලෙවි කිරීමට කටයුතු කිරීම - ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**

සතොස ශාඛා හරහා මත්පැන් අලෙවි කිරීම තුළින් මත්පැන් අලෙවිසැල්වල සිදුවන අකටයුතුකම් අවම කළ හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.3 පාරිභෝගික සේවා අධිකාරී පනත සංශෝධනය කිරීම**

අවසාන කෙටුම්පත ඉදිරි සතියේදී භාරදීමට නියමිත බව නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇති බව අධ්‍යක්ෂ (නීති හා බලගැන්වීම්) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

2019 සැප්තැම්බර් මස 15 වන දිනට පෙර පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.4 ගාල්ල, ඉමදූවේ ඉංජිනේරු තාක්ෂණ ආයතනයක් (IET) අළුතින් ආරම්භ කිරීම - ගරු චන්දිම වීරක්කොඩි මහතා**

මෙහි වාර්තාව ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් දෙපාර්තමේන්තුවට යවා ඇති බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.5 මහනුවර දිස්ත්‍රික්කයේ පොත්තපිටිය කර්මාන්තපුරය ආරම්භ කිරීමේ කටයුතු කඩිනම් කිරීම - ගරු මයන්ත දිසානායක මහතා**

මේ සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පත පිළියෙල කර ඇති බව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අත්පත් කරගැනීමේ මූලික කටයුතු මේ වනවිට අවසන් කර ඇති බව කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ලාල් ප්‍රියන්ත මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රීතුමා සමඟ සම්බන්ධීකරණයෙන් එම කටයුතු කඩිනමින් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත උපදෙස් ලබා දෙන ලදී.

**1.6 මූදුබත් වූ නැවේ තිබූ ඛනිජ වැලි නැවත ගොඩ ගැනීමේදී පෞද්ගලික ආයෝජකයෙකුට සිදුවූ අසාධාරණය - ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**

මේ පිළිබඳව පත් කළ කමිටුවේ වාර්තාව අනුව එම සමාගමට වැය වූ සම්පූර්ණ මුදල ගෙවීමට තීරණය වී ඇති බව අතිරේක ලේකම් චිත්‍රපාල මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.7 මුලතිව් දිස්ත්‍රික්කයේ අක්‍රිය තත්ත්වයේ ඇති හාල් මෝල් නැවත ක්‍රියාත්මක තත්ත්වයට පත්කිරීම සහ රාජ්‍ය නොවන සංවිධාන මගින් පිහිටුවන ලද කුඩා කර්මාන්ත සමිති සම්බන්ධ ගැටලු විසඳාගැනීම - ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**

මේ සම්බන්ධයෙන් ඉදිරි රැස්වීමකදී වැඩිදුරටත් සාකච්ඡා කිරීමට තීරණය විය.

**1.8 ජාවත්ත සළුසල ආයතනයට හා රාජගිරියේ රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාවට අයත් ඉඩම් - ගරු බුද්ධික පතිරණ මහතා**

මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන ඇති බව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා :-**

**2.1 සී/ස නැගෙනහිර හේවාගම් කෝරළයේ විවිධ සේවා සමුපකාර සමිතියේ අක්‍රමිකතා සම්බන්ධයෙන් කරන ලද දැනුම්දීම (යෝජනා අංක - 143) - ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**

මේ සම්බන්ධයෙන් ඉදිරි රැස්වීමකදී සාකච්ඡා කිරීමට තීරණය විය.

**2.2 අක්මීමන මැතිවරණ කොට්ඨාශය තුළ අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩමක නව පාඨමාලා ආරම්භ කිරීමට හැකිවන පරිදි නව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම (යෝජනා අංක - 144) - ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

මාතර රාහුල පාරේ පිහිටි සමුපකාර තොග වෙළඳ සංස්ථාවට අයත් ඉඩමේ කොටසක නව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

**2.3 කැටයම් හා ස්වර්ණාභරණ නිෂ්පාදකයින් සඳහා ස්වයං රැකියා උපකරණ කට්ටල ලබාදීම (යෝජනා අංක -146) - ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

ස්වයං රැකියා උපකරණ කට්ටල අවශ්‍ය ප්‍රදේශය සඳහන් කර නොමැති බැවින් අවශ්‍ය ස්ථානය සඳහන් කර එවන ලෙස ගරු මන්ත්‍රීතුමා දැනුවත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ සභාපති වෙත උපදෙස් ලබා දෙන ලදී.

**2.4 සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත නිර්මාණකරුවන්ගේ නිෂ්පාදන මිලදී ගන්නා ලක්සල වැනි ආයතනවලින් එම නිෂ්පාදන සඳහා සුදුසු පරිදි සහතික කරන ලද මිලක් ලබාදීමට හැකිවන පරිදි අවශ්‍ය පියවර ගැනීම. (චෙක්පත් නිකුත් කිරීමේදී අදාළ කාලයට ලබාගත හැකිවන පරිදි චෙක්පත් නිකුත් කිරීම) (යෝජනා අංක - 147) - ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

මේ පිළිබඳ විමසීමක් කර කඩිනම් පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් ලක්සල ප්‍රධාන විධායක නිළධාරී වෙත උපදෙස් ලබා දෙන ලදී.

මෙම යෝජනාවලට අදාළ වාර්තා ලබාගෙන හැකි ඉක්මණින් ගරු මන්ත්‍රීවරුන් වෙත යැවීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්වරයාට උපදෙස් ලබාදෙන ලදී.

**3. වෙනත් කරුණු:**

**3.1 රාජ්‍ය ව්‍යාපාර ආයතනවල වාර්ෂික වාර්තා නියමිත පරිදි ඉදිරිපත් නොකිරීම**

ගරු කථානායකතුමාගේ උපදෙස් පරිදි රාජ්‍ය ව්‍යවසායකත්ව ආයතනවල වාර්ෂික වාර්තා නිසි කලට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එබැවින් 2017 වර්ෂය දක්වා වාර්ෂික වාර්තා සති තුනක් ඇතුළත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස ද ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

2018 වර්ෂයේ වාර්ෂික වාර්තා මෙම වර්ෂයේ සැප්තැම්බර් මස 30 වන දින වනවිට ලබාදීමට කටයුතු කරන ලෙස ද ගරු සභාපතිතුමා විසින් තවදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු අධිකාරියේ සභාපති හා අදාළ නිලධාරීන් කාරක සභා රැස්වීමට සහභාගී නොවීම සම්බන්ධයෙන් නිදහසට කරුණු විමසීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

**3.2 අමාත්‍යාංශය යටතේ ඇති සියළුම ආයතන විසින් සංස්ථාපිත සැලසුම් (Co-operate plan) නියමිත පරිදි ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම**

අමාත්‍යාංශය යටතේ ඇති සියළුම ආයතන විසින් පස් අවුරුදු සංස්ථාපිත සැලසුම් නියමිත පරිදි ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම සැලසුම් 2019 වර්ෂයේ සිට ඉදිරි අවුරුදු පහකට සැලසුම් කරන බවත් 2019 ඔක්තෝබර් 31 වන දින වනවිට එම වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.3 ඇඹිලිපිටිය කඩදාසි කම්හල ආරම්භ කිරීමේ කටයුතු කඩිනම් කිරීම.**

ගරු සභාපතිතුමාගේ උපදෙස් පරිදි ඇඹිලිපිටිය කඩදාසි කම්හල ආරම්භ කිරීමේ කටයුතු කඩිනම් කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.

**3.4 පරන්තන් කෙමිකල්ස් ආයතනයේ කටයුතු, නැව් ප්‍රමාදවීම හා එහි ලිපිලේඛන ගාස්තු අඩු කිරීම, නැව් සංස්ථාව පිහිටි ඉඩම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා සාකච්ඡා කිරීම.**

පරන්තන් කෙමිකල්ස් ආයතනයේ කටයුතු, නැව් ප්‍රමාදවීම හා එහි ලිපිලේඛන ගාස්තු අඩුකිරීම, නැව් සංස්ථාව පිහිටි ඉඩම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා සාකච්ඡා කිරීම යනාදී අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාවට භාජනය වූ අතර තවදුරටත් අමාත්‍යාංශයීය මට්ටමින් සාකච්ඡා කළයුතු බවට තීරණය විය.

**3.5 කිලිනොච්චියේ පිහිටි ලංකා සතොස ගොඩනැගිල්ලේ ඇති සිනමා ශාලා දෙක ජාතික චිත්‍රපට සංස්ථාවට පවරා ගැනීම.**

දෙපාර්ශවයේ එකඟතාවයෙන් එම කටයුතු සාර්ථක කර ගැනීම සඳහා සාකච්ඡා කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

සිනමා ශාලාව විවෘත කිරීම අතරතුර සතොස මෙගා අලෙවි සැලක්, ආහාර අලෙවි සැලක්, ළමා උද්‍යානයක් හා ලක්සල අලෙවි සැලක් විවෘත කිරීමටද කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් තවදුරටත් උපදෙස් ලබා දෙන ලදී.

**4. කල් තැබීම**

කාරක සභාව පස්වරු 1.05 ට 2019.08.23 දින පෙරවරු 9.00 දක්වා කල්තබන ලදී.

-----------------------------

**කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමූපකාර සංවර්ධන හා වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව හත්වැනි රැස්වීම - 2019 අගෝස්තු 23**

**පැමිණ සිටි කාරක සභික මන්ත්‍රීන්**
ගරු ගරු රිෂාඩ් බදියුදීන් මහතා (සභාපති)
ගරු බුද්ධික පතිරණ මහතා
ගරු කරුණාරත්න පරණවිතාන මහතා
ගරු කේ. කේ. පියදාස මහතා
ගරු මයිල්වානගම් තිලකරාජා මහතා

**1. කාර්ය සටහන් සහා සම්මත කිරීම**

කාර්ය සටහන්වල 4.6 ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු බව කාරක සභාව විසින් තීරණය කරන ලදී.

**"4.6 මුහුදුබත් වූ නැවේ තිබූ ඛණිජ වැලි නැවත ගොඩ ගැනීමේදී පෞද්ගලික ආයෝජකයෙකුට සිදුවූ අසාධාරණය**

**i. මෙම කාර්යය සඳහා වන වෙළඳපල වටිනාකම පිළිබඳ නිපුණතාවය හා දැනුමින් යුතු නිළධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මගින් සුන්බුන් වූ නැවේ සිට ඉල්මනයිට් තොගය ගොඩට ගැනීමට දරණ ලද සාධාරණ පිරිවැය ගණනය කර එකී මුදලින් ආශා ලංකා ආයතනය වෙතින් ලංකා මිනරල් සැන්ඩ්ස් සමාගම වෙත අය වීමට ඇති සියලු අය කිරීම හා මෙම ගෙවීම් කිරීම සම්බන්ධයෙන් නීතිපති වෙතින් එකඟතාවය ලබා ගැනීමට කටයුතු කිරීම**

**ii** **ඉහත පරිදි ගෙවීම් කටයුතු සිදු කිරීමට පෙර මුහුදු පත්ලේ දැනට ඉතිරිව ඇති ඉහත නැවෙහි සුන්බුන් සියල්ල ආශා ලංකා ආයතනය විසින් ඉවත් කර දීම.**

**ඒ අනුව මේ පිළිබඳ ඉදිරි කටයුතු කිරීම සඳහා සුදුසු නිළධාරීන් නම් කර එවන ලෙස වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2019/07/23 දින දැනුම් දී ඇත.“**

කාරක සභාව එහි 2019.07.25 දින පැවති සයවන රැස්වීමේ කාර්ය සටහන් ඉහත සඳහන් සංශෝධනවලට යටත්ව සභා සම්මත කරන ලදී.

## 2. කාර්ය සටහන් වලින් පැන නගින කරුණු

### 2.1 සතොස ශාඛා විවෘත කිරීම

ඉදිරි සති දෙක තුළ නව සතොස ශාඛා අලෙවිසැල් 15 ක් විවෘත කිරීමට කටයුතු කරන අතර තවත් ආයතන 15 ක් සැප්තැම්බර් මස තුළ විවෘත කරන බව සතොස ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරිවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ගොඩනැගිලි සඳහා කුලිය ගෙවීම සතොස ශාඛා ආරම්භ කරන මාසයේ සිට පමණක් විය යුතු බවට ගරු සභාපතිතුමා විසින් නිළධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. එමෙන්ම විවෘත කිරීමට අපේක්ෂිත නව ආයතන සියල්ලක්ම 2019 ඔක්තෝම්බර් මස 15 වෙනි දිනට පෙර විවෘත කිරීමට කටයුතු කරන ලෙස ද ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

### 2.2 පාරිභෝගික සේවා අධිකාරී පනත සංශෝධනය කිරීම

2019 සැප්තැම්බර් මස 15 වෙනි දිනට පෙර පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.3 ගාල්ල, ඉමදූවේ ඉංජිනේරු තාක්ෂණ ආයතනයක් (IET) අළුතින් ආරම්භ කිරීම - ගරු චන්දිම වීරක්කොඩි මහතා

මේ සඳහා ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති බැවින් ඉදිරි වැඩ කටයුතු කරගෙන යාමට හැකි බව කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.4 යෝජිත මහනුවර දිස්ත්‍රික්කයේ පොත්තපිටිය කර්මාන්තපුරය - ගරු මයන්ත දිසානායක මහතා

ඉඩම අත්පත් කරගැනීමෙන් පසු අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.5 මුලතිව් දිස්ත්‍රික්කයේ අක්‍රීය තත්ත්වයේ ඇති හාල් මෝල් නැවත ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීම - ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**

සමූපකාර සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසු මෙම හාල්මෝල් නවීකරණය කළ හැකි බව සමූපකාර කොමසාරිස්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සමූපකාර කොමසාරිස්වරයා වෙත උපදෙස් ලබා දෙන ලදී.

**2.6 මුලතිව් දිස්ත්‍රික්කයේ රාජ්‍ය නොවන සංවිධාන මගින් පිහිටුවන ලද කුඩා කර්මාන්ත සමිති සම්බන්ධ ගැටළු විසඳා ගැනීම - ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මිය**

මේ සම්බන්ධ වාර්තාව ලබා දීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රාදේශීය සංවර්ධන අධ්‍යක්ෂවරයා වෙත උපදෙස් ලබා දෙන ලදී.

**2.7 ඇඹිලිපිටිය කඩදාසි කම්හල ආරම්භ කිරීමේ කටයුතු කඩිනම් කිරීම**

මේ සඳහා පත් කළ කමිටුවේ වාර්තාව ලැබී ඇති බව කාරක සභාවට දැනුම් දෙන ලදී.

වාර්තාවේ ආකාරයටම වාලච්චේන කඩදාසි කම්හල ඇරඹීමට කටයුතු කරන ලෙසත් එම ඉඩමෙන් කොටසක් ගරු අගමැතිතුමාගේ උපදෙස් මත සංචාරක සංවර්ධන මණ්ඩලයට ලබාදීමට කටයුතු කරන ලෙසත් ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

**2.8 පරන්තන් කෙමිකල්ස් ආයතනයේ කටයුතු, නැව් ප්‍රමාදවීම හා එහි ලිපිලේඛන ගාස්තු අඩු කිරීම සහ නැව් සංස්ථාව පිහිටි ඉඩම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා සාකච්ඡා කිරීම.**

පරන්තන් කෙමිකල්ස් ආයතනයේ කටයුතු මාසයක් ඇතුළත අවසන් කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

නැව් ප්‍රමාදවීම හා එහි ලිපිලේඛන ගාස්තු අඩුකිරීම සම්බන්ධයෙන් ඉන්දියා තානාපති කාර්යාලයේ ලේකම් සමඟ සාකච්ඡා කර තීරණයකට එළඹීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

**2.9 කිලිනොච්චියේ පිහිටි ලංකා සතොස ගොඩනැගිල්ලේ ඇති සිනමා ශාලා දෙක ජාතික චිත්‍රපට සංස්ථාවට පවරා ගැනීම.**

සති දෙකක් ඇතුළත විවෘත ප්‍රසම්පාදන ලංසු කැඳවීමට කටයුතු කරන ලෙසත් මිළ ගණන් ලැබීමෙන් අනතුරුව ජාතික චිත්‍රපට සංස්ථාවට සිනමා ශාලා ලබාදීමේ හැකියාව පිළිබඳව තීරණයක් ගත හැකි බවටත් ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

යෝක් වීදියේ පිහිටි ලක් සතොස ආයතනයේ හා ලක්සල ආයතනයේ ඉඩම් අවුරුදු 10 කට හෝ 15 කට කල්බදු දීමට කඩිනමින් කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

**3. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා :-**

පහත සඳහන් යෝජනා සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරයාගේ වාර්තා ගරු මන්ත්‍රීවරුන් වෙත ඉදිරිපත් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.1** සී/ස නැගෙනහිර හේවාගම් කෝරළයේ විවිධ සේවා සමූපකාර සමිතියේ අක්‍රමිකතා සම්බන්ධයෙන් කරන ලද දැනුම් දීම (යෝජනා අංක - 143) - ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

**3.2** අක්මීමන මැතිවරණ කොට්ඨාශය තුළ අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩමක නව පාඨමාලා ආරම්භ කිරීමට හැකිවන පරිදි නව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම (යෝජනා අංක - 144) - ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

**4. වෙනත් කටයුතු:**

**4.1 ගල් මෝල් සඳහා වෙඩි බෙහෙත් සහ තවත් කරුණු - ගරු කේ.කේ. පියදාස මහතා**

**4.1.1 ගල් මෝල් සඳහා වෙඩි බෙහෙත් ප්‍රමාදයකින් තොරව ලබාගැනීම**

මහාමාර්ග සංවර්ධනය කිරීම හා අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය කළුගල් ප්‍රමාදයකින් තොරව ලබා ගැනීම සඳහා ගල්මෝල් හිමියන්ට වෙඩි බෙහෙත් ප්‍රමාදයකින් තොරව ලබා ගැනීම සඳහා යම් ක්‍රමවේදයක් සකස් කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගැනීම සඳහා ඉල්ලීමක් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

**4.1.2 "නංවමු ලංකා" ප්‍රතිපාදන ප්‍රමාදයකින් තොරව ලබාගැනීම**

"නංවමු ලංකා" වැඩසටහන යටතේ වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාදයකින් තොරව ලබා ගැනීමට හැකිවන අයුරින් ක්‍රමවේදයක් සකස් කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව මගින් රුපියල් මිලියන 50 ක උපරිමයකට යටත්ව ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව භාණ්ඩ ලබා ගැනීම සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබී ඇති බව සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත දන්වා යැවීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

**4.1.3 කුඩා ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා මහන මැෂින් ලබා ගැනීම**

කුඩා ව්‍යාපාර සාර්ථකව පවත්වාගෙන යන පිරිසට හැකි ඉක්මණින් මැෂින් ලබා දීමට කටයුතු කරන බවත් ඊට අමතරව මැෂින් අවශ්‍ය පිරිසට අළුතින් මැෂින් ලබා දීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අමාත්‍යාංශය යටතේ පුහුණු වූ අයෙකුට මැෂින් යන්ත්‍රය බැගින් ලබාදීමට විධිවිධාන යොදා ඇති බැවින් මැෂින් මිළදී ගෙන සුදුසු ආකාරයට ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**4.2 නුවරඑළිය තලවකැලේ කේන්ද්‍ර කරගෙන දෙමළ මාධ්‍ය වෘත්තීය පුහුණු ආයතනයක් ආරම්භ කිරීම - ගරු එම්. තිලකරාජා මහතා**

තලවකැලේ නගරය කේන්ද්‍ර කරගෙන දෙමළ මාධ්‍ය වෘත්තීය පුහුණු ආයතනයක් ආරම්භ කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

වන්නි දිස්ත්‍රික්කයේ පුනරුත්ථාපනය වූ එල්ටීටීඊ සාමාජිකයන් විරැකියාවෙන් පෙළෙන බැවින් ඔවුන් සඳහා වෘත්තීය පුහුණු පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම ලක් සතොස වැනි මහජන සම්බන්ධතා වැඩි වශයෙන් පවත්වාගෙන යන ආයතනවල සේවකයන් සඳහා මෘදු කුසලතා වර්ධනය (Soft Skills Development) වැඩසටහන් ආරම්භ කිරීමට කටයුතු කරන ලෙස ද ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

රුහුණු විශ්ව විද්‍යාලයේ යුනිවර්සිටි කොලේජ් සඳහා ඉඩ පහසුකම් හිඟතාවය හේතුවෙන් ඊට ආසන්නයේ අතහැර දමා ඇති සතොස ගොඩනැගිල්ල ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**5. කල්තැබීම**

කාරක සභාව පෙරවරු 10.45 ට 2019.09.19 දින පෙරවරු 09.30 දක්වා කල් තබන ලදී.

----------------------------